
ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 අගෝස්තු 02 වන බදාදා
3 කාණ්ඩය 35 කලාපය
මිල රු. 80 යි

විශේෂ අතිරේකයක්
නොමිලේ




## දැන් මිලියනපතියෙක් වුණත් ජෙරොම් ඉපදුණේ බිංගෙයක් වගේ තැනක

ආන්දෝලනයට තුඩු දුන් පාස්ටර් ජෙරොම් ප්‍රනාන්දුගේ මව පළමුවරට කියයි



## බණ්ඩා මළොත් මගෙ විමලාට අගමැති වෙන්න පුළුවන්

හිටපු අගමැති බණ්ඩාරනායක ඝාතනය ගැන ඔබ නෑසූ කතාවක්

දේවින්දි සංජයා මුදන්නායක

ඡායාරූපය - ප්‍රදීප් දඹරගේ
පසුතලය - Solis Hotel කෝට්ටේ

# හරිස්චන්ද්‍ර රස මැදුර









විධායක සූපවේදී
සුජිත් ආරියරත්න

## බිත්තර තෝසේ

- තෝසේ පිටි පැකට් 01
- බිත්තර 04
- ලූනු 100g
- අමු මිරිස් 50g
- කැරට් 50g
- ලීක්ස් 50g
- ගම්මිරිස් කුඩු පදමට
- රස අනුව ලුණු
- පොල් කිරි, වතුර අවශ්‍ය ප්‍රමාණයට

❖ තෝසේ පැකැට්ටුව කඩා එයට පැකැට්ටුවේ සඳහන් පරිදි වතුර හෝ පොල්කිරි දමා අනා තියාගන්න.

❖ ඉන්පසුව විනාඩි 15කට පසු එයට අනිත් පොල්කිරි හෝ වතුර එකතු කරගන්න. ඉන්පසු එය තෝසේ තැටියක දමාගන්න. දැන් මෙයට උඩින් එළවළු එකතු කරගන්න.

❖ ඉන්පසුව බිත්තර කඩා ගසාගන්න. ගසාගත් බිත්තර තෝසේ එක උඩින් දමා දෙපැත්ත පුළුස්සා ගන්න.

## කුරක්කන් සුප්

- හරිස්චන්ද්‍ර කුරක්කන් පිටි 200g
- පොඩියට කපාගත් කැරට් 50g
- පොඩියට කපාගත් බෝංචි 50g
- කපාගත් ගෝවා 50g
- කපාගත් ලීක්ස් 50g
- ලූනු 50g
- සුදුලූනු බික් 03
- ඉඟුරු කැබලි 01
- ලුණු, ගම්මිරිස් පදමට
- පොල්කිරි හෝ වතුර අවශ්‍ය ප්‍රමාණයට

❖ මුලින්ම කුරක්කන් පිටි ග්‍රෑම් 100ක් උණු වතුර සමග හොඳින් කලවම් කර තලපයක් සාදාගන්න.

❖ එම තලපය පොඩි පොඩි බෝල සාදාගන්න.

❖ වතුර භාජනයක් ළිප තබා එයට කපාගත් එළවළු එකතු කර තම්බා ගන්න. ලුණු, ගම්මිරිස සහ කුරක්කන් පිටි එකතු කර හොඳින් දියකර ගන්න. එයට පොල්කිරි එකතු කරගන්න. කලින් සාදාගත් කුරක්කන් බෝල එකතු කර උණු උණුවෙන්ම පිළිගන්වන්න.

## කුරක්කන් නූඩ්ල්ස් පායාසම

- හරිස්චන්ද්‍ර කුරක්කන් නූඩ්ල්ස් 200g
- වියළි කජු 50g
- වියළි මිදි 50g
- ගාගත් කැරට් 50g
- නැවුම් එළකිරි 1Ltr
- පදමට සීනි
- බටර් තේ හැඳි 1/2
- එළඟි තෙල් මේස හැඳි 01

❖ හරිස්චන්ද්‍ර කුරක්කන් නූඩ්ල්ස් උණු වතුරින් තම්බා ගන්න.

❖ තම්බාගත් නූඩ්ල්ස් පසෙකින් තබාගන්න.

❖ සුදුසු භාජනයක් ළිප තබා එයට එළඟි තෙල් එකතු කර රත්වන විට එයට කජු, මිදි, එනසාල්, කැරට් එකතු කර තෙම්පරාදු කරගන්න. ඉන්පසුව එයට කිරි, සීනි සහ අනෙකුත් සියලුම ද්‍රව්‍ය සහ කුරක්කන් නූඩ්ල්ස් එකතු කර කලවම් කරගන්න.


# විශිෂ්ටත්වයේ විශ්වාසය



හරිස්චන්ද්‍ර කර්මාන්ත ආයතනය - මාතර

# මගේ ඇස් ඉස්සරහම අම්මයි නංගියි පස් කන්දට යට වුණා



එදා සුබෝධාගේ නිවසට පැමිණි පස් කන්ද

## සුබෝධා සෙව්වන්දි

ඒ ගිය අවුරුද්දේ නොවැම්බර් මාසෙ 05 වැනිදා. නුවර අහසේ වෙනදාට තියෙන සිරියාවන්තකම එදා තිබුණේ නෑ. අහස මුළු දවසම හිටියෙ බුම්මාගෙන. හරියට තරහා වෙලා වගේ. එහෙම බුම්මගෙන ඉඳපු අහස හවස පහකුත් ගාණට ඔන්න හොඳටෝම අඬන්න පටන්ගත්තා. නුවර ලස්සන වැස්සට කිව්වට මොකද එදා වැස්සේ නම් එහෙම කිසි ලස්සනක් තිබුණේ නෑ.

සුබෝධලාගේ ගෙදර තිබුණේ සුදුහුම්පල. ගෙදර ඉන්නේ සුබෝධයි, අම්මයි, තාත්තයි, නංගිලා දෙන්නයි වුණාට එදා තාත්තා හිටියේ වැඩට ගිහින්. වැස්ස හින්දා එළියට පහළිහට යන්න බැරි එකේ පොතක්පතක්වත් බලාගත්තා නම් හොඳයි කියලා සුබෝධට හිතුණේ සාමාන්‍ය පෙළ විභාගයත් අත ළඟටම ඇවිත් තිබුණු නිසා. එහෙම හිතලා සුබෝධා කාමරේ පොත් මේසේ ළඟට යද්දී නංගිලා දෙන්නා එක්ක අම්මත් එතැන ඇඳේ වාඩිවෙලා හිටියා.

වැස්ස එන්න එන්නම දරුණු වුණා. මහා හුළඟයි, වැහි වැටෙන සද්දෙයි ඇරුනම සුබෝධා ඉඳපු කාමරේට වෙන කිසිම දෙයක් ඇහුනේ නෑ. හැබැයි එකපාරටම ලොකු වතුර පාරක සද්දයක් ඇහුනා. ගෙවල්වලට ඉහළින් තිබුණු ඇල්ලෙ වතුර වැඩිවෙලා ඇති කියලයි සුබෝධා හිතුවේ. එහෙම හිතලා තත්පර දෙක තුනයි ගියේ... එකපාරටම කාමරේ බිත්තියක් ඉරි තලන්න ගත්තා. ඒත් එක්කම පොත පැත්තකට දාපු පුංචි එකී ලොකු නංගිට කාමරෙන් එළියට දුවන්න කීවේ අම්මයි පොඩි නංගියි ඇදගෙන කාමරෙන් එළියට දුවන ගමන්. ඒත් ඔවුන්ට ඉස්සර වෙන්න ඉඩ නොදුන්නු පස් කන්ද බිත්තියක් ගලවගෙනම ගේ ඇතුළට ආවා. ඒ අම්මවයි නංගිවයි සුබෝධගේ ඇස්දෙක ඉස්සරහදීම යටකරගෙන.

**"ඒ වෙලාවේ හවස හයයි තිහට වගේ ඇති. මං අම්මවයි නංගිවයි ඇදගෙන කාමරෙන් එළියට දුවන්න ගියේ. ඒත් ඒ යනකොට ගෙයි බිත්තියක් ගලවගෙන පස්කන්ද ගෙට ආවා. ඒ ආපු ගලක් මගේ අතේ වැදිලා මට අම්මයි නංගියි දෙන්නා අතෑරුණා. ඒත් එක්කම ඒ දෙන්නම පස් කන්දට යටවුණා."**

වයස අවුරුදු 17ක් වන සුබෝධා සෙව්වන්දි තාමත් ඒ ගැන සිහිකරන්නේ ඇස් දෙකේ කඳුළු පුරවගෙන. ඒ සිද්ධිය වෙලා මේ වෙනකොට අට මාසයක් ගියත් අදටත් ඒ සිදුවීම මතක් වෙනකොට මේ පුංචි එකීට වාවගන්න බැරිලු.

"අම්මලා යටවුණාම මමයි ලොකු නංගියි දෙන්නා හයියෙන් කෑ ගැහුවා. ඒත් වැස්ස නිසා කාටවත්ම අපේ කෑ ගැහිල්ල ඇහුනේ නෑ. ඒ අතරේ තමයි මට හිතුණේ ගෙවෙන තත්පරයක් ගානේ අම්මගෙයි නංගිගෙයි ජීවිත දෙක අනතුරේ කියලා. ඊටපස්සේ මං තනියම අර පස් ගොඩ අස්සේ අම්මවයි නංගිවයි හොයන්න ගත්තා. අම්මව පපුව ගාවට වෙනකල් පස්වලින් ගල්වලින් යටවෙලා හිටියේ. නංගි නම් පේන්නවත් හිටියේ නෑ. මුලින් පේන්න හිටපු අම්මව බේරගත්තා. පස්සේ නංගිව හොයන්න ගත්තා. ඒත් හම්බුණේ නෑ. ඔය අතරේ තමයි මං එයාගේ කොණ්ඩේ පොඩ්ඩක් දැක්කේ. ඒ දැකපු ගමන්ම මං එයාවත් එතැනින් බේරගත්තා."



සුබෝධා සෙව්වන්දි



සුබෝධා ජීවත් වූ නිවස

**නංගි හොයාගන්න අමාරු වුණා. ඒත් මං පස් කන්ද අතරින් එයාගෙ කොණ්ඩේ පොඩ්ඩක් දැක්කා**





දැනට තාවකාලිකව පිළිසකර කර ඇති නිවස

මට සුබෝධගේ හපන්කම ගැන කියද්දි මතක්වුණේ සුපර් මෑන්ව. ඒත් මනඃකල්පිත ලෝකයේ ඉන්න එහෙව් සුපිරි වීරයන්ට වඩා මේ පුංචි එකීගේ ධෛර්යය ගැන ඇතිවුණේ පුදුමාකාර ආඩම්බරයක්.

**"අම්මවයි නංගිවයි බේරගත්තත් ඒ දෙන්නා හිටියේ අමාරුවෙන්. පස්සේ වැස්සෙම එහාට මෙහාට දුවලා ගෙවල් ළඟ අය අඬගහගෙන දෙන්නම ඉස්පිරිතාලෙට අරන් ගියා. නංගිට නම් ටික කාලයක් යනකල් ඇවිදගන්නවත් බැරුව හිටියේ."**

නිකමට හිතන්න, ඔබට මේ වගේ අනපේක්ෂිත සිදුවීමකට මුහුණ දෙන්න වුණොත්? පුංචි සුබෝධාගේ හිතේ තිබුණු හයියෙන් අංශු මාත්‍රයක් තරම්වත් හොයාගන්න පුළුවන් කියලා ඔබට විශ්වාසද?

**"මට එදා ඕන වුණේ අම්මයි නංගියි කොහොමහරි බේරගන්න. මං ඒ දේ කළා. ඒ වෙලේ මට මගේ ජීවිතේ ගැන කිසිම ආසාවක් තිබුණේ නෑ. මට මොකක් හරි වුණත් අම්මයි නංගිවයි බේරගන්න ඕන කියලා මං එදා හිතුවා."**

සුබෝධගේ තාත්තා නගරසභාවේ කම්කරු රස්සාවලු කරන්නේ. මේ සිද්ධිය වුණු දවසේ තාත්තා වැඩ ඇරිලා ගෙදර එනකොට වෙන්න ඕන හැමදේම වෙලා ඉවරයි කියලයි සුබෝධා කිව්වේ.


**"එදා තාත්තා මාව බදාගෙන හොඳටෝම ඇඬුවා. එයාටත් හිතාගන්න බෑ මං කොහොමද එච්චර හරියක් කළේ කියලා. තාත්තා කිව්වා දුව නොහිටින්න අපිට අම්මෙකුයි නංගියෙකුයි නැතිවෙන්නත් ඉඩ තිබුණා කියලා."**

ඒ තමයි සුබෝධලාගේ ජීවිත අංශක තුන්සිය හැටකින්ම කණපිට පෙරළපු අතීත කතාව. ඒ අතීත කතාව නිසාම මෙදා ඔවුන්ගේ ජීවිතවල වර්ථමාන කතාවත් හරි දුක්බර එකක් වෙලා. ඒක සුබෝධාගේ වචනවලින්ම කිව්වේ මෙහෙමයි.

"අපිට ඒ කරදරේ වුණාට පස්සේ පවුලේ අය ගමේ අය උදව් කළා. මං ඉස්කෝලේ යන්නේ ලුම්බිණි රාජකීය විද්‍යාලයට. අපේ ඉස්කෝලෙනුත් අපට ගොඩාක් උදව් ලැබුණා. ඉස්කෝලේ ගුරුවරු, යාළුවෝ නොහිටින්න මට සාමාන්‍ය පෙළ ලියන එකත් හීනයක් වෙන්න තිබුණා. මොකද මුළු පොත් මේසෙම එදා යටවුණා. අපි තාමත් ඉන්නේ එදා කැඩුනු ගෙදර. ඒකේ ඉන්න එක අවදානම් වුණත් කරන්න දෙයක් නැතිකමට ටකරන්වලින් අහුරගෙන ඉන්නවා. ඒක හදාගන්න තරම් අපේ ගෙදර ආර්ථික පසුබිම හොඳ මට්ටමක නෑ. අම්මත් ඉන්නේ අසනීපෙන්. තාත්තගේ පඩියෙන් තමයි අපි කාලා ඇඳලා මේ විදියට හරි ඉන්නේ. කවුරුමහරි කෙනෙක් අපිට ගේ හදාගන්න උදව් කරනවා නම් ඒක ලොකු පිනක්."

සාමාන්‍ය පෙළ විභාගය ලියලා ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉන්න සුබෝධා එහෙම කිව්වේ ලොකු හුස්මක් පිටකරන ගමන්. හොඳට ඉගෙනගන අනාගතේ හෙදියක් වෙන්න හීන දකින මේ පුංචි එකීගේ ගේ හදාගන්න කාට හරි උදව්වක් කරන්න පුළුවන් ඒක තමයි අපෙත් සතුට. එහෙම කවුරු හරි ඉන්නවා නම් 0775184139 තමයි සුබෝධලාගේ ගෙදර නොම්මරේ.

■ **රුවන් එස්.සෙනවිරත්න**




මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

# බල්ලෝ නැවිට වනනකොට බහිරවයෝ දුවනවා කියන්නේ ඇත්තද?

ඔහු ගම්පහ ප්‍රදේශයේ ධනවත් ව්‍යාපාරිකයෙකි. එකිනෙකට වෙනස් ව්‍යාපාර කිහිපයක් හිමි ඔහුට ගම්පහ දිස්ත්‍රික්කයේ කෙළවරකට වන්නට ඉඩකඩම්ද තිබේ. නමුත් වසර කිහිපයක සිට ව්‍යාපාර සීඝ්‍රයෙන් කඩාවැටීම හේතුවෙන් ඔහු මහත් වියැවුලකට පත්ව තිබිණ. සාමාන්‍යයෙන් බොහෝදෙනෙකු එවන් අවස්ථාවන්හි කරන්නේ ජ්‍යෝතිර්යවේදීන් ලවා ජන්ම පත්‍රය පරීක්ෂා කරවාගැනීමයි. මෙම ව්‍යාපාරිකයාද එලෙස තම ජන්ම පත්‍රය රටේ ප්‍රසිද්ධියක් උසුලන ජ්‍යෝතිර්වේදීන් කිහිපදෙනෙකුටම පෙන්වා තිබිණ. එහෙත් ඔවුන් සෑමදෙනෙකුම පවසා තිබුණේ යම් යම් සුළු අපල තත්ත්වයන් හැරුණුකොට සැලකිය යුතු මට්ටමේ බරපතළ අපලයක් නොමැති බවයි.

නමුදු තමන්ට මුහුණපෑමට සිදුවූ මේ ව්‍යාපාරික ඇබැද්දිය සම්බන්ධයෙන් ඔහු තවදුරටත් විමසුම් කර තිබිණි. එහිදී ව්‍යාපාරිකයාට දැනගන්නට ලැබුණේ ඔහුගේ නිවසට බරපතළ බහිරව දෝෂයක්



එල්ල වී ඇති බවයි. ඉන්පසු එම බහිරව දෝෂය ඉවත් කිරීමට ඔහු මිලියන ගණන් මුදල් වියදම් කළේය.

මගේ හිතවතෙකු වන ප්‍රසිද්ධ ජ්‍යෝතිර්වේදි හේම ශ්‍රී අමරසිංහ, මේ ව්‍යාපාරිකයා මා වෙත යොමුකළේ එවැනි පසුබිමකය. ගුප්ත ශාස්ත්‍රවල නාමයෙන් අසරණයන් ගසාකෑමේ ජාවාරම සමාජය පුරා කෙතරම් ඔඩුදුවා ඇත්දැයි සාක්ෂි සහිතව ඒත්තු ගැන්වීම හේම ශ්‍රී ගේ අරමුණ විය.

ඒ අනුව මා හමුවට පැමිණි ව්‍යාපාරිකයා එම දෝෂවලට මුල් වූ බහිරවයා පිළිබඳ සෑහෙන විස්තර කතාබස් කරමින් සිටියේය. නමුත් බහිරව දෝෂයක් ඇති බවක් විනා එම බහිරවයා කළුද සුදුද කියාවත් ඔහු දැනසිටියේ නැත. එබැවින් අන් සියල්ලටම පෙර ඔහුට වින කරන බහිරවයා කවුරුන්ද යන්න වටහාදීම මගේ අභිප්‍රාය විය.

## කඩේ ඉස්සරහට ආවොත් ගෝලයෙකුට කියලා හරි ගහනවා

"අපි බහිරව කියලා එක නමකින් හැඳින්වූවාට බහිරව කියලා කොට්ඨාස හැටහතරක් ඒ කියන්නේ හැටහතර කට්ටුවක් ගැන කියැවෙනවා. ඒ අතරේ පාතාල බහිරව, අකාල බහිරව කියලා ආයිමත් බහිරවයෝ කොට්ඨාස දෙකකට බෙදෙනවා. පාතාල බහිරව කියන්නේ පොළොව යට තියෙන සම්පත්වලට අරක්ගත්තු බහිරව කොට්ඨාසයට. අකාල බහිවර කියන්නේ පොළොවේ මතුපිට සම්පත්වලට අරක්ගත්තු බහිරව කොට්ඨාසයට." මම ඔහුට අප ජන සංස්කෘතියේ එන බහිරව සංකල්පය පිළිබඳව විස්තර කළෙමි.

"එතකොට මට ඔය දෝෂය තියෙන්නේ මොන බහිරවයාගෙන්ද කියලා හරියටම දැනගන්න විදියක් නැද්ද?" ඒ අතරේ තරමක උනන්දුවක් පළකළ ව්‍යාපාරිකයා මගෙන් ඇසීය.

ඒවා හුදෙක් ජන මනැස් තුළ ස්ථාපිත වූ සංකල්ප බව කියා පෑම පිළිස්සුණු සිරුරකට ලුණුවතුර විසි කිරීමක් විය හැකි බැවින් මම මගේ මතය එළි නොදක්වා තවදුරටත් ඔහු හා කතාබස් කළෙමි.

"පොළොව ඇතුළේ තියෙන වටිනා ස්වභාවික සම්පත් වගේම ඉස්සර කවුරුහරි නිදන් කරවපු වටිනා දේවල් පාතාල බහිරවයා ආරක්ෂා කරනවා කියලා තමයි අපේ ජන සංස්කෘතියේ තියෙන්නේ. පාතාල බහිරවයාගේ සංකේතය තමයි නයා. නමුත් ඔය පාතාල කියන බහිරවයා තමයි පොළොව මතුපිට තියෙන ගේදොර, ඉඩකඩම් බවභෝග වගේ දේවල්වලට අධිගෘහිතයි කියලා මිනිස්සු විශ්වාස කරන්නේ. අකාල බහිරවගේ සංකේතය තමයි බල්ලා."

වැඩි තැකීමකින් තොරව මා එසේ කියා නිමවීමටත් පෙරම එම ව්‍යාපාරිකයාගේ මුහුණේ ඉරියව් සීඝ්‍රයෙන් වෙනස් වන අයුරක් මට හැඟුණි.

"හැබැයි මට නම් ඉස්සර ඉඳලම ඔය බල්ලො කියන උන්ව පේන්න බෑ. මම ඉන්න හතරමායිමක බල්ලෙක් හිටියොත් මං ගහලම පන්නනවා. බල්ලෙක් අපේ කඩයක් ඉස්සරහට ආවත් ගෝලයෙකුට හරි කියලා ගහලා පන්නනවාමයි."

ඔහු වේගයෙන් කියාගෙන කියාගෙන යන්නට විය.

"එහෙනම් ඉතින් ඔය වගේ බහිරව දෝෂයක් ඇති නොවුණොත්නේ පුදුමේ. ඔය වගේ දේවල්වලින් බහිරවයා වෛර බැඳගන්න එක අහන්නත් දෙයක්ද?" මම ද එසැණින් කීවෙමි. එවිට ඒ ව්‍යාපාරිකයාගේ මුහුණේ ඉරියව් සේම පැහැයද යම් ආකාරයකට වෙනස්වන අයුරු මට හොඳින්ම පෙනුණි.

"ඒකට මම දැන් මොකද කරන්නේ?" තරමක නිහැඬියාවක් පළකළ ඔහු එසේ අසන ලද්දේ දිගු සුසුමක්ද සමඟිනි.

"ඔය බහිරව දෝෂ මගහරවාගන්න තියෙන පහසුම ක්‍රමේ තමයි ඒ අසරණ සත්තු ගැන තියෙන තරහා වෛරය හිතෙන් අයින්කරගෙන උන්ට කාරුණික වෙන එක. ඊළඟට හොඳින් සලකන එක." ඔහු පිළිබඳව සිත තුළ ගොනු කරගත් සියුම් නොමනාපය සඟවා ගනිමින් මම කීවෙමි.

"ඒක තමයි මට කරන්න බැරිම වැඩේ." ඒ ව්‍යාපාරිකයා කෙඳිරිලි හඬකින් කීය.

"ඔව් ඉතින් එහෙනම් ප්‍රශ්නයක් නෑ. හැබැයි එහෙම වුණොත් බහිරව දෝෂයන් තව ටිකෙන් ටික වැඩිවෙන්න වුණත් පුළුවන්." මම යළි කීවෙමි.

"ඒ හින්ද මොනතරම් අසීරුවෙන් අමාරුවෙන් හරි හිත හදාගෙන හැමදාම ඒ අසරණ සත්තුන්ට කෑම දෙන්න පටන්ගන්න. එතකොට ඒ සත්තු හිතවත් වෙලා ටිකෙන් ටික වලිගය වනන්න පටන්ගනියි. අන්න ඒකත් එක්කම ඔය බහිරව දෝෂයත් ටිකෙන් ටික අඩුවෙලා නැත්තටම නැතිවෙලා යාවි." සැබැවින්ම බහිරවයෙකු කියා කිසිවකුත් නැතත් තම සිතුවිලි එලෙස උඩු යටිකුරු කරගැනීමෙන් මානසික ව්‍යුහය මුළුමනින් වෙනස් කරගැනීමට ඕනෑම කෙනෙකුට පුළුවන. ඒ අනුව එම ව්‍යාපාරිකයාගේ සිත තුළට තදින්ම කා වැදී ඇති එම 'බහිරව දෝෂය' නම් දැඩි මානසික ඇණවුම ඉවත් වී ඔහුගේ ව්‍යාපාර වඩාත් සාර්ථක වීමේ අවකාශයක්ද තිබේ. මෙම ක්‍රියාවලිය මනෝ විද්‍යාවේ හැඳින්වෙනුයේ නිශේධනාත්මක මැදිහත්වීම් (Oaradoxical Intervention) යනුවෙනි. ඒ අනුව පසුගිය දිනෙක මට දැනගන්නට ලැබුණේ මේ වනවිට ඒ ව්‍යාපාරිකයාගේ බහිරව දෝෂයද සීඝ්‍රයෙන් මගහැරෙමින් තිබෙන බවයි.



# ඔබේ ව්‍යාපාරය **වටින්නේ** ඔබට විතරමද?

ඔබේ ව්‍යාපාරය දියුණු වෙන තරමට, ශක්තිමත් වෙන තරමටම අපේ රටේ ඉදිරි ගමනත් දියුණු වෙනවා, ශක්තිමත් වෙනවා. ඒ නිසා ඔබේ ව්‍යාපාරය ඔබට පමණක් නොවේ රටටත් වටිනවා.

ඒ වටිනාකම සෙලාන් අපි හොඳින්ම දන්නවා. ඒ නිසයි සෙලාන් ව්‍යාපාර බැංකුකරණ විසඳුම් හරහා ඔබගේ ව්‍යාපාරයේ මූල්‍ය අවශ්‍යතා වලට සරල විසඳුම් අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

රටට ශක්තියක් වන ඔබේ ගමන තවත් ශක්තිමත් කරගන්නට ඔබගේ ළඟම සෙලාන් බැංකු ශාඛාව වෙත පිවිසෙන්න.

SEYLAN BUSINESS BANKING
Empowering your business

011 200 88 88
www.seylan.lk

සෙලාන් ටවර්ස්
අංක 90, ගාලු පාර, කොළඹ 03.

Brand Finance Rating: A+ Fitch Rating A-(lka) සමාගම් ලියාපදිංචි අංකය: PQ 9 සෙලාන් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

සෙලාන් බැංකුව
සුහද හදක් ඇති දේශීය බැංකුව

# කාගෙහරි අනුකම්පාව වළඳනවාට වඩා බඩගින්නේ ඉන්න එක ඇඟට ගුණයි



'අපිට කොයින්ද පූසෝ මාළු - අපි යනවායැ මූදු' කියලා ඕන එකටයි එපා එකටයි හැම එකටම කියපු කාලයක් තිබුණා නේද?

හෝව්... හෝව්... පොඩ්ඩක් ඉන්න... තාමත් එහෙම කියනවද? එහෙනම් හොඳ ටොක්කක් ඇනගෙන මෙන්න මෙහෙ එන්න, කතාවක් තියෙනවා කියන්න.

නටන්න බැරි මිනිහට පොළොව ඇදයි කියනවා වගේ, තමන්ගේ අරමුණුවලට යන්න කිසි උනන්දුවක් නැති, කොටින්ම කියනවනම් අරමුණක් නැති කම්මැලියන්ගේ සංගමය විසින් හදාගත්තු කියමනක් තමයි ඕකත්. මන්තර වගේ උදේ හවස ඔය වගේ කතා කියන අය ඒකෙන් තමන්ට වෙන හානිය ගැන ඇත්තටම දන්නේ නෑ.

ලොකුම ප්‍රශ්නෙ තමයි එහෙම අය, රටේ ලෝකෙ ඉන්න අනිත් හැමෝම මාර ලොකු මිනිස්සු, දක්ෂ මිනිස්සු විදියට දැක්කට තමන් ගැන එහෙම දකින්න කැමැති නෑ. ඒ නිසා **'අපි ඔය ලොකු අතු අල්ලන්න යන්නේ නෑනේ', 'ඇඟිල්ලේ තරම දැනගෙනයි ඉදිමෙන්න ඕන', 'අපි කන හැටි ලිපා දනී'** වගේ මෝඩ කතා ටිකක් අල්ලාගෙන ඒවම කිය කියා ඉන්නවා.

ඒ නිසා තමන්ව ලොකුවට දකින්න පුරුදු වෙන්න. හැබැයි එහෙම හිතලා වැඩ කරද්දී සමහරු අහයි **"ඔයා මාර පොරක් කියලාද හිතාගෙන ඉන්නේ?"** කියලා. නැත්නම් ඒ අය කියයි **"ඔයා රඟනවා වැඩියි"** කියලා. එහෙමත් නැත්නම් කියයි **"එයා දැන් අහසේ ඉන්නේ"** කියලා. ඉතින් කියපුදෙන්. එයාලා කියන ඒවට බයෙන්, ඔයා කිසිම චළියක් නැති, කිසිම පෞරුෂත්වයක් නැති මනුස්සයෙක් විදියට හැසිරුණාත් ඒ මිනිස්සු ඔයාව නිර්වචනය කරන එක නතර කරන්නේ නෑ. සමහරවිට එතකොට ඔයාට නිර්වචන දෙන්නවත් ඒ අය ඔයා දිහා හැරිලාවත් බලන එකකුත් නෑ. හොඳට මතක තියාගන්න මැණිකේ... ඔය ගොඩක් අය කතා කියන්නේ සහ කතා හදන්නේ ඔයා එයාලට අභියෝගයක් වෙන්න යනවා කියලා දැනෙන මොහොතේ. එහෙම නැත්නම් ඔයා උන්නද මලාද කියලාවත් කවුරුවත් බලන්නේ නෑ.

සමහරු හරි කැමතියි **"මං හරි දුප්පත් කෙනෙක්"** කියලා කියන්න. එතකොට එයාලා හිතනවා එයාගේ අව්‍යාජ බව දැකලා මිනිස්සු එයාට ගෞරවණීය විදියට සළකයි කියලා. මොන පිස්සුද? එහෙම වෙන්නේ නෑ. අපේ නැතිබැරිකම් කියන්න කියන්න බහුතරයක් මිනිස්සු අපේ ඔලුවට අත හෝදනවා. අපිව පාගලාම දනවා. එතැනින් නවතින්නේත් නෑ. ඔයා ඉස්සරහට තියන අඩියක් අඩියක් පාසා ඔයාට කතා හදනවා. කොහොමද දන්නවද?

**"දැන් ඔහොම වුණාට හිටපු විදිය අපිනේ දන්නේ", "ඉස්සර ණයට ඉල්ලගත්තෙත් මගෙන්"** වගේ කතා කියලා කිසියම් මොහොතක එයාලා ඔයාගෙ අතීතය වමාරන්න පටන්ගන්නවා.

හැබැයි මම මේ කියන්නේ ඇතුවාට වැඩිය පෙන්නගෙන මට අච්චර තියනවා මෙච්චර තියනවා කියලා බොරු කියන්න නෙවෙයි. ඒත් ඔයාට මොකුත්ම නැති වුණාත් ඒ නැතිබැරිකම් ගැන නොකියා ඉන්න. සමහර වෙලාවට ෆෝන් එකට කාඩ් එකක් දාගන්නවත් මේ වෙලාවේ අතේ පිච්චියක් නැති වෙන්න පුළුවන්. හැබැයි ඔය සද්ගුණවත් කියලා පෙන්වන සමාජයත් එක්ක ඒ නැතිබැරිකම් බෙදාගන්න යන්න එපා. සමහරවිට දවල්ට කෑම එකක් කන්න අතේ සල්ලි නැතිවෙන්න පුළුවන්. හැබැයි ඒ වේල වතුර ටිකක් බීලා බඩගින්නෙ ඉන්න. කාගෙහරි අනුකම්පාව වළඳනවාට වඩා ඇත්තටම ඒක ඇඟට ගුණයි.

ජීවිතේ අමාරුයි තමයි. වගකීම් වගවීම් වැඩියි. අතට එන මුදල හැරෙන්නවත් මදි කියලා හිතෙන වෙලාවල් වැඩියි. ඒත් එහෙම අමාරුකම් තියාගෙනත් රුපියල් සීය, දෙසීය හරි කමක් නෑ ඉතිරි කරන්න. ඒකත් අත්‍යවශ්‍ය වියදමක් කියලා හිතලා ඒ මුදල අයින් කරලා තියන්න. අද ලක්ෂෙට කොඩි දාන ගොඩක් මිනිස්සු පටන්ගත්තේ ඒ වගේ පොඩි තැන්වලින්.

ඒ නිසා මම හරි පුංචි මනුස්සයෙක්, මම හරි දුප්පත්, මට කවුරුත් නෑ කිය කියා යන එක නවත්වන්න.

ෆේස්බුක් එකේ වුණාත් කවි, නිසඳැස් ලියන්න අවශ්‍යනම් හඳ තරු ගැන කවි ලියන්න.

ලස්සන දේවල් ගැන ලියන්න. සතුටු හිතෙන දේවල් ලියන්න. සතුටින් ඉඳපු වෙලාවල් ගැන ලියන්න. එහෙම නැතුව නැතිබැරිකම් ගැන ප්‍රසිද්ධියේ ලෝකයාට කියන එක දැන්වත් නතර කරන්න.

නැතිබැරිකම් නිසා ඔයා කොච්චර දුක් වින්දද, පීඩාවට පත්වුණාද කියලා කියන්න දවසක් එයි. හැබැයි එහෙම කියන්න ඕන, අනිත් අය ඔයා දිහා බලලා 'මටත් එයා වගේ වෙන්න ඕන' කියලා හිතන දවසක විතරයි. එහෙම දවසක අනිවාර්යෙන්ම ඒ කතාව කියන්න. එදාට ලැජ්ජා වෙන්න හෝ බය වෙන්න දෙයක් නෑ.

හැබැයි එතකන් මීයට පිම්බා වගේ ඉන්න. සද්ද නැතුව ඔයාගෙ දිනුම් කණුව හොයාගෙන යන්න. ඒකට මුලින්ම කරන්න තියෙන්නේ හරි පුංචි දෙයක්. ඔයා ලොකු මනුස්සයෙක් කියලා හිතලා වැඩ කරන්න.

අපූර්වා

## අලි කතා

# අලියා දිව්‍යලෝකෙ යන බව දැනගෙන අලි හිමියාගේ හිත ලෙඩ වෙලා





තොරතුරු
මහාචාර්ය **අශෝක දංගොල්ල**
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

ඇතැමුන්ගේ රෝග තත්ත්වයන් අනාවරණය කරගැනීමට කල්ගත වෙයි. අලි ඇතුන්ට කියා එහි වෙනසක් නැත. මහාචාර්ය අශෝක දංගොල්ලට ද වරක් එවැනි අලි රෝගියෙකු හමුවිය. හෙතෙම තරුණ අලියෙකි. උන්දෑ ලෙඩ වී තිබුණෝ හිටි හැටියේය. ඒ මදිවාට බලා සිටිද්දීම අලියාගේ ඇඟ ද කෙට්ටු වන්නට විය. කිහිපවරක් පරීක්ෂා කරමින් ප්‍රතිකාර කළද සුව වීම ප්‍රමාදය. එබැවින් මහාචාර්ය දංගොල්ල සැක කළේ අලියාට ක්ෂය රෝගය වැළඳී ඇති බවටයි. එය ස්ථිරව නිර්ණය කිරීම ඉතා අපහසුය. කෙසේ වෙතත් එම රෝගය අලින්ගෙන් මිනිසුන්ට බෝ වීමේ අවදානම ඇතිනිසා එම කණගාටුදායක තත්ත්වය ගැන අලි හිමියාට දැනුම් දිය යුතුය. ඒ අනුව මහාචාර්ය දංගොල්ල අලි හිමියාට පැවසුවේ අලියා මිනිස් වාසයෙන් ඈත් කර තබන ලෙසයි. ව්‍යායාම නොකරවා, අලියාගේ මළ මුත්‍රා සහ වෙනත් ශ්‍රාව නොගැටෙන පරිදි සිටින ලෙසද ඔහු වැඩිදුරටත් කීය.

අලියා භාර ඇත්ගොව්වාද ක්ෂය රෝගියෙකු ලෙස මහනුවර පැවති සායනයකදී හඳුනාගෙන තිබිණි. අලියාගේ රෝග විනිශ්චය තරමක් දුරට තහවුරු වීමට එයද හේතු විය. එහෙත් අලියාට ක්ෂය රෝගය ඇතැයි තහවුරු කර ගැනීමෙන් අලි හිමියාට කළ හැකි දෙයක් නොවේ. එනිසා රෝගය සනාථ කරගැනීමට වෙහෙස නොවන්නැයි මහාචාර්ය දංගොල්ල අලි හිමියාට දැනුම් දුන්නේය. එහෙත් එය එකවිල්ලේ පිළිගැනීමට ඔහු සූදානම් නොවීය. සිය අලියාගේ රෝගය පිළිබඳ අලි හිමියා බෙහෙවින් කණස්සල්ලට පත්විය. එනිසාම ඔහු තවත් වෛද්‍යවරයකු හමු වී අලියාගේ රෝග තත්ත්වය විමසීය. එහිදී කළ පරීක්ෂාවෙන් අලියාට ක්ෂය රෝගය වැළඳී ඇති බව ස්ථිර විය. ඉන් අලි හිමියා දැඩි මානසික කම්පනයකට පත්වූයේය. ඒ සඳහා ඔහුට ප්‍රතිකාර ගැනීමටද සිදුවිය. ඊට විශේෂඥ වෛද්‍යවරයකු හමු වූ අවස්ථාවේද ඔහු සිය අලියාගේ රෝගී තත්ත්වය ගැන සාකච්ඡා කළේය. වෛද්‍ය නිගමනය වූයේද අලියා රෝගීවීම හේතුවෙන් අලි හිමියා කම්පනයට පත්ව ඇති බවයි.

අලියා ද අලි හිමියා ද දෙයාකාරයක රෝගී තත්ත්වයන්ගෙන් පීඩා විඳිමින් මසක් පමණ ගෙවී ගියේය. අලියා සිටියේ ජීවිතයේ අවසන් දින කිහිපයට ළඟා වෙමිනි. අලියාගේ අසූචි ඔස්සේද ක්ෂය රෝගකාරක පිටවන බව පරීක්ෂණවලදී හෙළි විය. එය ශ්‍රී ලංකාවේදී ප්‍රථම වරට සනාථ කිරීමට මහාචාර්ය අශෝක දංගොල්ල සමත් විය. කෙසේ වෙතත් සියලුදෙනා දැන සිටි පරිදි සතියකට පමණ පසු අලියා මියගියේය. අලි පෙමින් ඔත්පල වී සිටි අලි හිමියා විශේෂඥ වෛද්‍යවරයාගේ ප්‍රතිකාර හමුවේ සුවය ලැබීමට වාසනාවන්ත විය.

■ රජනිකා ලියනගේ


කොටියාකුඹුර උබේසේකර
කේෂ කල්‍යාණී තෛලය
සුමුදු සුසිනිඳු මොණර පිළක්වන් කෙස් කළඹක රහස
අකලට හිසකෙස් ගැලවීම, සුදු වීම, තට්ටය පෑදීම, හිසකෙස් දිරා යාම, තඹ වර්ණ වීම, පීනස් රෝග සමනය කරයි
අවුරුදු 800කට වඩා ඉපැරණි පුරාණ පුස්කොළ පොතකින් උපුටාගන්නා ලද අත්දුටු රහස් වට්ටෝරුවක් අනුව අවුරුදු ගණනාවක් පර්යේෂණ පවත්වා සමන් මල්, සඳුන් මල් ආදී දුර්ලභ වන මල්වර්ග රාශියක් සංයෝග කර මෙම තෙල් නිෂ්පාදනය කර ඇත. අකලට හිසකෙස් ගැලවී යාම වහා නවත්වා මොණර පිළක්වන් සිය කෙස්වලින් හිස පුරවාලීමේ පුදුම බලයක් ඇති මෙම තෛලය, අතීතයේ භාරතයේ විසූ රාජකුමාරියන් පවා භාවිත කළ ශ්‍රේෂ්ඨ බල ඇති තෛලයකි. අකලට හිසකෙස් නොවැටීම, නොපැසී විශේෂ අරුම පුදුම බලයක් ඇති, කෙස් සුදුවීම, තට්ටය පෑදීම, උඳුගොව්වන් කෑම නතර කිරීම, හිසකෙස් දිරා යෑම, අඩ වර්ණ වීම, පීනස් රෝග සුව වීම, හිස්සොරි වළවීම, හිස කැක්කුම, කල්පනාව අඩුකම, නිතර කිවිසුම් යාම, ඇස් දැවිල්ල, ඇස්පෙනීම අඩුකම, කබ කඳුළු ගැලීම ආදි සියලු රෝග වළක්වයි. හිස කෙස් දික්ව මොණර පිළක් බඳු අලංකාර කේෂ කලාපයක් ලබාගැනීමට මෙම තෙල් දිනපතා හිස ගල්වන්න.
උබේසේකර කේෂ කල්‍යාණී තෛලය
සුමුදු සුසිනිඳු මොණර පිලක් වන් කෙස් කළඹක රහස
සියළුම හිසකෙස් රෝග සඳහා වෛද්‍යවරයා හමුවී ප්‍රතිකාර ලබා ගැනීමට අමතන්න
මිල රු.490/=
සාම විනිසුරු පාරම්පරික හිස කෙස් රෝග විශේෂ දේශීය වෛද්‍ය විශාරද
වෛද්‍ය ශිරෝමනි ආර්.පී. උබේසේකර
කොටියාකුඹුර
සියලුම ආයුර්වේද වෙළඳසැල්වලින් දැන් ලබාගත හැක
දු.අ. 035 228 90 64 / 0725 493 435


Happy
ජාවාරම්කරුවන්ට හසුනොවී
වැදගත් විදිහට වැඩ ටික කරගෙන
සතුටින්
රට යන්න
ඔබ රට රස්සාවකට යන්නෙ, ඔබේත් ඔබේ ආදරණීයයන්ගේත් සිහින ඉටු කරගෙන, ජීවිතේ සැපවත් කරගන්න. ඒ යන ගමන, වැදගත් විදිහට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙලා ගියොත් ඔබට පුළුවන් ඔබේ ආරක්ෂාව, රැකියාව පිළිබඳ හොඳ විශ්වාසයක් ඇතුව සතුටින් පිටව යන්න.
රට යනකොට කතා කරන්න 1989
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙන්න.
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
www.slbfe.lk



සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

පාඩම් අංක 80

# නිල් කටරොළු මලෙන් උපන් මුනීන්ද්‍රයාණෙනී...



**'නිල් කටරොළු මලෙන් උපන් මුනින්ද්‍රයාණෙනි'**

මේ දවස්වල කවුරු කවුරුත් මුමුණන ඔය සිංදුව කුමාර ඒකනායක කියන ගායකයා උමන්දව පන්සලේ සමන්ත භද්‍ර හාමුදුරුවෝ වෙනුවෙන් හදපු සිංදුවක්ලු. ඔය නිල් කටරොල් සිංදුව ෆේස්බුක් එකේ වෛරල් වෙලා මහා පෙරළියක් කළා නොවැ. සිංදුව කන්වල නිතරෝම රැව් දෙනවය, රෑට නින්ද යන්නේ නැතිය කියලා එහෙමත් කට්ටිය කියනවා අපි දැක්කා.

නිල් කටරොළු කියන්නේ ඇත්තටම මහා ඖෂධ ගුණයක් තියෙන මලක්. හැබැයි අපේ උදවියට මේ මලේ වටිනාකම ගැන අගයක් දැනිලා තිබුණේ නැහැ. සමහරු විෂ්ණු දේව වන්දනාවට ඔය මල පාවිච්චි කළා ඇරෙන්න වෙන විශේෂ ප්‍රයෝජනයක් ගත්තේ නැහැ. අර ගායක තෙමේ කියන්නා වාගේ නිල් කටරොළු මල ගැන අපේ රටේ කතාබහක් ඇති කළේ සමන්ත භද්‍ර හාමුදුරුවෝ. ඒකට නම් අපිත් උන්නැහේ එක්ක මනාපයි.

නිල් කටරොළු ශාකය මුලින්ම හොයාගෙන තියෙන්නේ දකුණු ඇමරිකාවෙන්. ඊටපස්සේ තායිලන්තය, මැලේසියාව, ඉන්දියාව වගේ රටවලත් මේ මල වගා කරලා. ඉංග්‍රීසියෙන් මේ මලට කියන්නේ බටර්ෆ්ලයි පී (Butterfly pea) කියලා. සමනලයෙක් වගේ ලස්සන මලක් නිසා සුද්දෝ එහෙම නමක් තියන්න ඇති. ඉන්දියාවේත් නිල් කටරොළු ප්‍රසිද්ධයි. ඉන්දියානුවෝ අපරාජිතා කියලා නිල් පාට හින්දු දෙවඟනක් වන්දනා කරනවා. මේ මලත් ඒ දෙවඟන වාගේ නිල් නිසා ඉන්දියානුවෝ මේ මලට කියන්නේ අපරාජිතා කියලා.

නිල් කටරොල් මලේ ඇන්තොසයනින් (Anthocyanin) කියලා වර්ණකාරකයක් තියෙනවා. ඒ වර්ණකයෙන් තමයි මේ මල නිල් වෙන්නේ. ඉතින් ආහාර වර්ණකයක්, රසකාරකයක්, සුවඳකාරකයක් විදියටත් මේ මල පාවිච්චි කරනවා. හැබැයි ප්‍රධාන වශයෙන් මේ මල ගන්නේ ඖෂධයක් හැටියට. අවුරුදු කිහිපයකට කලින් ඇමරිකානුවෝ බටර්ෆ්ලයි පී යොදාගෙන පරීක්ෂණයක් කළා. අවුරුදු 22-60 අතර මිනිස්සු 15කගේ රුධිරගත සීනි ප්‍රමාණය වැඩි කරලා පස්සේ දවසට නිල් කටරොළු යුෂ 2ml ගානේ බොන්න දීලා. දවස් දෙකක් යද්දි ඒ අයගේ රුධිරගත සීනි ප්‍රමාණය අඩු වුණාලු. ඔය පරීක්ෂණවලින් පස්සේ ඇමරිකාවේ ආහාර හා ඖෂධ පරිපාලනය මේ මල ඖෂධයක් විදියට පාවිච්චි කරන්න අනුමත කරලා තියෙනවා. ඊට අමතරව මලේ තියෙන ෆ්ලෙවනොයිඩ්වලට (Flavonoid) සමේ කොලැජන් වැඩි කරන්න පුළුවන්. ඔයිට අමතරව සෙම රෝගවලට තුවාල, කුෂ්ඨ වගේ රෝගවලටත් නිල් කටරොළු පංකාදුයි. පිළිකා සෛල වර්ධනයට එරෙහිවත් මේ මල සටන් කරනවලු. අනික මොළේ නීරෝගීකම වැඩි කරන්නත් මේකට පුළුවන්ලු. ඔය කිව්ව කාරණා නිසා ඒරොප්පේ උදවිය තේ, පෙති, කරල්, රූපලාවණ්‍ය නිෂ්පාදන විදියට බටර්ෆ්ලයි පී ගන්නවා.

ඉතින් ගොඩ යනවා නම් ඕන් මල. පහුගිය සතියේ නිල් කටරොළු පිටරට යවලා මාසෙට ඩොලර් මිලියන 10ක් හම්බකරන මහත්තයෙක් ගැන මාධ්‍යයේ ප්‍රචාරය වුණා. මල් කිලෝ 100කින් අපනයන පටන්ගත්තු ඒ මහත්තයා දැන් මාසෙට මල් කිලෝ 2000ක් රට පටවනවලු. ජර්මනිය, පෝලන්තය, ඇමරිකාව, කැනඩාව වගේ රටවලින් නිල් කටරොළුවලට හොඳ ඉල්ලුමක් තියෙනවා කියලා අපනයන සංවර්ධන මණ්ඩලයෙනුත් කියලා තිබුණා. ඉතින් නිල් කටරොළු වගා කරගන්නේ කොහොමද කියන එකයි, මල් වේළලා නිෂ්පාදනයක් විදියට අලෙවි කරන හැටියි ඔය කාරණා දෙකම අපි කියා දෙනවා.





නිල් කටරොළු වගා කරන හැටි මුලින් කතා කරමු. අලුතින්ම වැඩේ පටන්ගන්නවා නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිල් කටරොළු පැළ නැත්නම් බීජ ඉතාම අඩු මුදලට ලබාගන්න පුළුවන්. දන්න කියන ගෙදරක ගහ තියෙනවා නම් ඒවගෙන් ඇට ටිකක් එකතු කරගන්න. ඇට ටික පැළ කරන්න කලින් පැය දෙකක් විතර පිරිසිදු වතුරේ පොඟවගන්න ඕනේ.

වැලි සහිත පස්, කොම්පෝස්ට් 1:1 අනුපාතයට අරගන්න. මේකට කොහුබත් පොඩ්ඩක් කාරියත් එක්කාසු කරලා හොඳට මිශ්‍ර කරලා තරමක් ලොකු පෝච්චියකට දාගන්න. පස්සේ අර පොඟවගත්තු ඇට පහ හයක් පෝච්චියේ හිටවගන්න. පොළොවේ හිටවනවා නම් මීටර් 2ක විතර පරතරය තියලා පැළ ටික හිටවගන්න. පර්චස් එකක පැළ 9ක් හිටවන්න පුළුවන්.

ඇට ටික පැළ කරලා දවස ගානේ වතුර ස්ප්‍රේ කරන්න. ඔහොම යද්දි දවස් පහ හයකින් පැළ එනවා. මේක වැලක්නේ. ඉතින් පැළ ආවට පස්සේ ලණු ආධාරක බඳින්න ඕනේ. මල් වැලට හැමදාම වතුර දාන්න. පැළය 20cm උසට වැඩුණාම කොම්පෝස්ට් නැත්නම් වියළි ගොම පොහොර දාන්න. බීජ පැළ කරලා මාසයක් යද්දි මල් එක දෙක එන්න ගන්නවා. ඕන් ආයෙත් පොහොර ටිකක් දාගන්න. මේ මලට කාබනික පොහොර යොදන එක තමයි වඩා හොඳ. පස්සේ සතියක් විතර යද්දි මල් අස්වැන්න නෙළන්න පුළුවන්. දිනපතාම වගේ අස්වැන්න නෙළාගන්න පුළුවන්.

නෙළාගත්තු අස්වැන්න වේළන හැටි අපි දැන් බලමු. නිල් කටරොළු මල් කුඩු, කෑලි, වියළි මල් විදියට අලෙවි කරන්න පුළුවන්.

මල් කඩනකොට උදේ 11ට කලින් මල් ටික කඩාගන්න ඕනේ. ගහේදිම පරවෙච්ච මල් භාවිතා කරන්න එපා. මුලින්ම මල පිරිසිදු කරලා තද අව්වේ පැයක් විතර තියන්න. ඊටපස්සේ මද පවනේ දවස් 4/5ක් වේලගන්න ඕනේ. මල් 10 kgක් වේලුණාහම හැදෙන්නේ මල් 1kgයි. ඒ නිසා ටිකක් වැඩිපුර මල් අවශ්‍ය වෙනවා. මහා පරිමාණයෙන් කරනවා නම් විජලන යන්ත්‍රයක් පාවිච්චි කරන්න පුළුවන්. මල වේලනකොට මලේ වතුර සේරම වගේ ඉවත් වෙනකල් වේලගන්න ඕනේ. නැත්නම් මල පුස් කනවා. අව්වේ වේලන කෙනෙක් නම් මල්වලට අපද්‍රව්‍ය නොවැටෙන්න උඩට නෙට් එකක් එහෙම බැඳගන්න.

මහා පරිමාණ ව්‍යාපාර කරන අය, මල් අපනයන කරන අය මේ අමු මල් වගේම වියළි මලුත් මිලදී ගන්නවා. ඒ වගේම මේ මල් සෘජුවම අපනයනය කරන්න පුළුවන්. නිල් කටරොලු මල් 1kgක් 3500ක වගේ මුදලට අපනයනය කරන්න පුළුවන්. දේශීය ගැනුම්කරුවන්ට ලබාදෙනවා නම් මිල ඊට වඩා අඩුවෙන්න පුළුවන්. නිල් කටරොළු නිෂ්පාදනය ගැන තව විස්තර දැනගන්න 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




දැන්වීමකි

# නහර ගැට ගැසීමෙන් පාද වේදනාවෙන් ඔබත් පීඩා විඳින්නෙක්ද?

# විශ්මිත සුවයට හෝමියෝපති ප්‍රතිකාර



සම ලස්සනට පැහැපත්ව තිබීම කවුරුත් ආසයි. නමුත් පාදවල නහර ගැට ගැසී ඇතිවිට ඔබ ඒ පිළිබඳ සැලකිලිමත් වනුයේ ලස්සනට අඳින විට ලස්සන පෙනුමට පාදවල ඉලිප්පි ඇති නහර බාධාවක් වී ඇති බව පෙනී යන නිසයි. වර්තමානයේ තරුණ, වැඩිහිටි, කාන්තා, පිරිමි භේදයකින් තොරව මේ රෝගය නිසා පීඩාවට පත්වී ඇත. කෙසේ හෝ සියලුම දෙනා නහර ගැට ගැසීම පිළිබඳව නොසැලකිලිමත් වුවහොත් පාදවල වේදනාකාරී, පීඩාකාරී තත්ත්වයන් මෙන්ම ඇතැම්විට මරණය වුවද ගෙන දිය හැකි බව ඔබ නොදන්නවා විය හැක.

**1. වෛද්‍යතුමියනි නහර ගැට ගැසීම කියන්නේ කුමක්ද?**

නහර ගැට ගැසීම සිදුවනුයේ හෘදයට ආපසු රුධිරය රැගෙන එන ශිරා වාහිනී ලෙස සැලකෙන නහර තුළයි. එම නහර තුල ඇති කපාට වෙනස් වීමත්, විකෘති වීමත්, දුර්වල වීමත් නිසා රුධිරය ආපස්සට ගමන් කිරීම හෝ එකතුවීමත් නිසා නහර පිටතට ඉලිප්පී දඟර ගැසීමක් ඇත්නම් එය නහර ගැට ගැසීම ලෙස අපට දැකිය හැක. මෙය බාහිරව මෙන්ම අභ්‍යන්තරයේද සිදුවිය හැක .

**2. නහර ගැට ගැසීම ඇතිවීමට ඇති හේතු මොනවාද?**

මෙයට විවිධ හේතු තියෙන්න පුළුවන් .

- මවට හෝ පියාට මේ රෝගී තත්ත්වය ඇත්නම් ඔවුන්ගේ දරුවන්ට මේ රෝගය ඇතිවීමේ ප්‍රවණතාව 90% පමණ තියෙනවා.
- වැඩි වේලාවක් සිටගෙන රැකියාවේ නිරතවීම.
- වැඩිවේලාවක් ඉඳගෙන සිටීම
- උසින් වැඩිවීම.
- තරබාරු වීම.
- කාන්තාවන්ගේ හෝමෝන වෙනස්වීම් වලදී,
- ගර්භණී කාලයේදී, වැනි කරුණු මෙයට හේතුවෙන්න පුළුවන්.

**3. මෙහිදී ඇතිවන රෝග ලක්ෂණ, සංකූලතා පිළිබඳව හැඳින්වීමක් කළොත්?**

- නහර ගැට ගැසීම නිසා ඇතිවන වේදනාව
- ඉදිමීම
- රුධිරය වහනය වීම
- කැසීම
- තුවාල හටගැනීම
- රස්නය දැනීම
- අවපැහැ ගැනීම
- සමේ විෂබීජ අසාදන තත්වයන්ද
- වයසට යාමත් සමග නහර ගැට ගැසීම වැඩිවිය හැක. රුධිර නාළ පීඩනය වැඩි පාදවල මේ රෝගී තත්ත්වය ඇතිවිය හැක.
- අභ්‍යන්තර ශිරාවල ලේ කැටි හිරවීම නිසා බොහෝ දරුණු වේදනාකාරී තත්ත්ව ඇතිවීමද, මාරාන්තික වීමද විය හැක.



**4. නහර ගැට ගැසීම ඇතිවෙන්නේ පාදවල පමණක්ද?**

සමහර කාන්තාවන්ගේ නහර ගැට ගැසෙන්නේ දෙපාවල පමණක් නොවෙයි. යෝනි මාර්ගය දෙපස, මුත්‍රා මාර්ග විවරය ආසන්නයේද සිදුවෙන්න පුළුවන්. පිරිමි පාර්ශ්වයට ඔවුන්ගේ වෘෂණ කෝෂ ආශ්‍රිතව වේදනාකාරී ලෙස නහර ගැට ගැසීම ඇතිවිය හැකිය. මෙලෙස ශරීරයේ බාහිරව හෝ අභ්‍යන්තරව කොතැනක හෝ නහර ගැට ගැසීම සිදුවිය හැක.

**5. අවදානම් සාධක**

- පාද විෂබීජ අසාදනයට නිතර ගොදුරු වීම,
- තුවාල හට ගැනීම,
- සෙලියුලයිටිස් තත්ත්ව ඇතිවීම, සුව නොවීම, වරින් වර මතුවීම.

**6. හෝමියෝපති ප්‍රතිකාර මගින් ස්ථිර සුවය**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තුළ මෙවැනි රෝගීන් පූර්ණව සුවය ලබන්නේ කෙසේද කියලා බලමු. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මෙවැනි රෝගීන්ට සුවිශේෂී වෛද්‍ය ක්‍රමයක් වනවා. ඒ කෙසේද යත් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තුළ අන්තර්ගත වී ඇත්තේම දුර්වල වූ වෙනස් වූ ප්‍රතිශක්තිකරණය උද්දීපනය කර වෙනස් වීම යථා තත්වයට පත්කරලීමයි.

මේ සදහා රෝගියාගේ රෝග ලක්ෂණ අපට සුවිශේෂීයි. රෝග ලක්ෂණවලට සමාන වූ ඖෂධ දීම තුල රෝගයට සමාන ප්‍රතිකාර මගින් රෝගියාගේ සුවපත් වීම සිදුවනවා. එසේ වන්නේ මීට වසර 200කට ඉහත හෝමියෝපති වෛද්‍ය විද්‍යාවේ පියා වන බටහිර වෛද්‍යවරයකු වූ ෆෙඩ්රික් සැමුවෙල් හානෙමාන්තුමා විසින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස සොයාගන්නා වූ ඖෂධ ක්‍රියාකාරිත්වයේ මුලධර්මවල (Similia Similibus Curenter) ප්‍රතිඵලයක් ලෙසයි. මේ මූලධර්මයට අනුව නහර වල ගැට ගැස්මට හේතු වූ නහරවල තුල ඇති කපාලවලත් වෙනස්කම නැවත යථා තත්වයට ගෙන ඒමට හෝමියෝපති ඖෂධීය ක්‍රියාකාරීතාවය බලපෑමක් ඇති කරනවා. එමගින් ගැටගැසුණු නහර ලිහිල් වී ක්‍රමවත් රුධිර සංසරණයක් පාද වල පමණක් නොව මුළු ශරීරය පුරාම ඇති කරනවා. එවිට නහර ගැටගැසීම නිසා ඇතිවුණු වේදනාවන් නැතිව යාම පාදවල ඉදිමුම, හිරිය හා අවපැහැය නැතිව පැහැපත් පෙනුමක් ගෙන දෙමින් පූර්ණ සුවයක් අත්දකිනවා. අතුරු ආබාධ නැහැ. ප්‍රතිකාරය ඉතාම සරලය.



සුවහසක් රෝගීන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කරන එච්.කේ. හෝමියෝපති ආරෝග්‍යශාලාවේ නිර්මාතෘ වෛද්‍ය අනුෂා හේමකුමාර

**සටහන ජේ. ඒ. සී. ශාන්ත කුමාර**

**විමසීම් :**
**එච්. කේ. හෝමියෝපති හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්**
**නො.12, පී.බී. අල්විස් පෙරේරා මාවත, කටුබැද්ද, මොරටුව.**

**0112 637740/ 0112 637741**
**071 8250716 / 071 8250717**

# මං දරුවා ලැබෙන්න ඉසිපිරිතාලෙට ගියේ ඔටුවෙකුගේ පිටේ





සෞදි අරාබියටත්, ඕමානයටත්, රතු මුහුදටත් මැදිව පිහිටි යේමනය මේ වනවිට ත්‍රස්තවාදී කල්ලිවල ගොදුරක් බවට පත් වී ඇත. එනිසා එරටේ අනෙකුත් බොහෝ දේ මෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයද කඩාවැටීමකට ලක්ව තිබේ. එයින් නම් වැඩියෙන්ම පීඩාවට පත්ව සිටින්නේ එරටේ ගැබිනි මව්වරුන්ය.

"ළමයි ලැබෙන්න ඉස්පිරිතාලෙට යද්දි අම්මලා මැරෙනවා."

ඒ යේමනයෙන් ඇසෙන දුක්බර කතාවයි. රෝහල් පහසුකම්වල පවතින හිඟය සහ ඇතැම් රෝහල්වලට යන්නට හරිහමන් පාරක් තොටක් නොමැතිකම ඊට හේතුවයි.

යුද්ධයේ අතුරු ප්‍රතිපලයක් වශයෙන් යේමනයේ මාර්ග විනාශ වී ගොස් තිබේ. එනිසා ගැබිනි මව්වරුන්ට දරුවා ලැබෙන්නට රෝහලට යන්නට සිදුව තිබෙන්නේ දහසකුත් එකක් කරදර මැදය. යේමන් ජනතාව මේ දිනවල "ළමයි ලැබෙන්න ඉස්පිරිතාලෙට යද්දි අම්මලා මැරෙනවා" යැයි කියන්නේ ඒකය.

"මට දරුවා ලැබෙන්න හොඳටම අමාරු වුණා. මස්සිනා එයාගේ බයික් එකේ තියාගෙන මාව ඉස්පිරිතාලෙට අරන් ගියා. ඒත් පාරවල් හොඳ නැති හින්ද අතරමගදි මං බිම ඇදගෙන වැටුනා. මට හිතුණේ ඒක මගේ අවසානේ කියලා."

ඒ සිදුවීමට මුහුණපෑවේ ධමාර් පළාතේ හයිලාය. ඇය යතුරුපැදියක නැගී දරුවා ලැබෙන්නට ධමාර්හි හදකා සෞඛ්‍ය මධ්‍යස්ථානය වෙත යනවිට එම කරදරයට මුහුණ පා තිබුණි.

"වැටුනු එකෙන් මට හොඳටම අමාරු වුණා. ඒ හින්ද ගිය ගමන් මාව ශල්‍ය වාට්ටුවට දැම්මා. මටයි මගේ නූපන් දරුවාටයි බේරෙන්න මාර්ගයක් තියේවි කියලා මං හිතුවේ නෑ. ඒත් අපි දෙන්නම ජීවත්වෙන්න වාසනාවන්ත වුණා."

වෛද්‍යවරු පවසා තිබුණේ ඔවුන් දෙදෙනාගේ ජීවිතය බේරාගැනීමට දැඩි වෙහෙසක් දැරීමට සිදුවූ බවයි. මේ අතර හයිලා සිය අලුත උපන් දැරියට 'අමල්' ලෙස නම් තබා තිබේ. අරාබි බසින් එහි අර්ථය අපේක්ෂාවයි.

ඒ අතර වයඹදිග යේමනයේ මහ්වීට් පළාතෙන්ද ඇසුනේ හයිලාගේ කතාවට සමාන කතාවකි. එම පළාතේ දහස් ගණනක් වූ ගැබිනි මව්වරුන් වෙනුවෙන් සෞඛ්‍ය පහසුකම් සළසන එකම රෝහල වන්නේ බානි සාද් රෝහලයි. දරුවෙක් ලැබෙන්නට සිටි මෝනා ජීවත්වූයේ එකී රෝහලට කිලෝමීටර් 40ක් දුරින් වූ අල්මකාරා ප්‍රදේශයේ කඳු මුදුනකය.

"අපේ ගෙදර ඉඳන් බානි සාද් ඉස්පිරිතාලෙට වාහනේක යන්න බෑ. ඒ නිසා මං ගියේ ඔටුවෙකුගේ පිටේ. බඩක් උස්සන් ඔටුවෙකුගේ පිටේ යන්න හරි අමාරුයි. ඒ වුණාට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ. මං පැය හතක් ඔටුවා පිටේ ගියා. ඌ ඉදිරියට තියපු හැම අඩියක් ගානෙම මට මගේ ඇඟ හිරිවැටිලා යනවා වගේ දැනුණා."

ඇතැම් තැන්වලදී මෝනාට ඔටුවාගේ පිටෙන් බැස පයින්ද යාමට සිදුව තිබුණි. ඒ රෝහලට යන මාර්ගය සතෙකුට යන්නටවත් සුදුසු මට්ටමක නොතිබූ හෙයිනි.

රෝහල පේනමානයේදී මෝනාට අසාධ්‍ය වූ අතර සිහියක් පතක්වත් නොතිබුණි. එහෙත් රෝහල් වෛද්‍යවරයා ඇයට මෙන්ම අලුත උපන් බිළිඳුටද කරදරයක් වෙන්නට ඉඩ තැබුවේ නැත. ඒ නිසාම මෝනාත් ඇගේ සැමියාත් එක්ව දරුවාට තැබුවේ ඔවුන් බේරාගත් වෛද්‍ය ජරාහ්ගේ නමයි.

කෙසේ හෝ මේ වනවිට යේමනයේ ගැබිනි මව්වරුන් සිටින්නේ දැඩි අවදානමකය. එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදලේ (UNFPA) හිචාම් නාරෝ පවසන්නේ මෙවැනි හේතු නිසා සෑම දිනකම එරටේ එක් ගැබිනි මවක් මියයන බවයි. ඉතින් මේ තත්ත්වය වෙනස් වීමටනම් එක්කො යුද්ධය නතර විය යුතුය. එසේ නොවුණාහොත් යේමනයේ ගැහැනුන්ට රතු මුහුද දෙස බලාගෙන සුසුම් හෙළනවා හැරෙන්නට වෙන කරන්නට යමක් ඉතිරිව නැත.

■ රුවන් එස්.සෙනවිරත්න




**කොමලිගේ කොලම වෙත කවි පැන එවීමේදී පද පේළි 4කින් යුත්**
**එක් කවියක් පමණක්**
**යොමු කිරීමට කාරුණික වන්න.**

**ප්‍රශ්නය**

දෙස් පාලනේ කරනා උදවියගෙ බඩ
තරමට නැත්තෙ ඇයි එයාලා කරන වැඩ
කැරකෙන විටදි ඉඳගෙන තඩි පුටුව උඩ
මේ රට හැදේවිද කොමලියෙ නගනු හඬ
නුවන්ති හංසිනී උත්පලා - සඳලංකාව

**පිළිතුර**

කතිරය නොගැසූ බව කිව්වොත් දිවුරාලා
පිළිතුරු දෙමි ඔබට මම හැඩ වැඩ දලා

**ප්‍රශ්නය**

හැඩරුව අනුව මතකෙට එයි උඩැක්කිය
මම රැවටුණා දැක කොමලිගෙ සිරික්කිය
තිබුණට දීග යන්නට උඹෙ හදිස්සිය
තව හිස් වුණේ නැහැ මම බැලු ඇනෙක්සිය
අනුර දිසානායක
වැලිවේරිය, ගම්පහ

**පිළිතුර**

පන් පැදුරකුත් ඇත ළංවී සැනසෙන්න
සැටි පුටු මොකුත් ඕනෑ නැත නැළවෙන්න
මේ පැල අගෙයි දෙන්නට ජීවත් වෙන්න
බින්න බහිනු රිසිනම් දැන්මම එන්න

**ප්‍රශ්නය**

කොමලිට කියමි මගෙ ආදර කතන්දරේ
නාඹර වයසෙ අල්ලාගත් සුපෙම්බරේ
දැන් වයසට යමින් පවතියි නිරන්තරේ
එය නවතන්න දෙනු මැන ඔබෙ සූත්තරේ
කමලාවතී එදිරිසිංහ
පතිරගේවත්ත, යගිරල, මතුගම

**පිළිතුර**

එළිවෙන ජාමෙටයි හොඳ සෙල්ලම් කියලා
වයසට යද්දි සතුටින් ඉන්නකො කමලා

**ප්‍රශ්නය**

සොම්නස් තොරන් බැඳ සිතුවිලි මත නේක
සෙනෙහස තිලිණ කෙරුවෙමි පසුගිය දක
පැරදුම පිළි නොගෙන කිවයුතුමයි මේක
ලොව දිනත හැකි බලයෙන් කවි සිත් දෙකක
කුසුම් එදිරිසිංහ
පැල්පිටිය, ඇහැලියගොඩ

**පිළිතුර**

කවියෙන් දිනිය හැකි නම් අභියෝග ලොවේ
කුසුමෝ මමත් කවියෙකු වෙමි ලබන භවේ

**ප්‍රශ්නය**

දෙමව්පියන් ඇත මට තරුණෙක් හොයලා
කසාදෙටත් ළඟ ළඟ නැකතක් හදලා
පොඩි මස්සිනා හට හුඟ කල් බහ දීලා
කොමලියෙ යන්න හිතෙනවා රහසෙම පැනලා
නන්ද ආරියදාස -යටියන්තොට

**පිළිතුර**

ඌට කියාලා ගහගන්නට බම්බු
පොඩි මස්සිනා එක්ක යන එක නේදෝ නම්බු

**ප්‍රශ්නය**

කෙළි සෙල්ලම් වෙල්එළියේ වැව් ඉස්මත්තේ
කවි සීපද හේනෙ පැලේ සීත දුරුත්තේ
අඹ දඹ නාරං ඉදිලා තුරු හිස් මත්තේ
අද කාලේ ඇයි මේවා දකින්න නැත්තේ
ලතා දිසානායක
මහජන පුස්තකාලය, වේළුසුමනපුර, මදුරන්කුලිය

**පිළිතුර**

ටික්ටොක් පිපී හැම ගහකම අතු අස්සේ
දියබුං ගහනවා පොඩිඋන් බුකි මත්තේ
යූ නලයට වැදී ගී නානා වැස්සේ
ලතා තවම ඇයි ඔබ වැව් ඉස්මත්තේ

**ඔබේ කවි අභියෝග**

කොමලිගේ කොලමට එවීමේදී 0712808985 හෝ dharanee.editor@liberty.lk යන ඊමේල් ලිපිනයට යොමු කරන්න.නැතිනම්,
කොමලිගෙ කොලම, ධරණී පුවත්පත, නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන ලිපිනයට එවන්න

# කාන්තාවක් වන ඔබට ජීවිතය ජය ගැනීමට ඇති හොඳම තැන යූනියන් ඇෂුවරන්ස් සමාගමයි

**මව් සෙනෙහස යනු ආදරය සහ රැකවරණය රැඳුණු තැනයි. සකසුරුවම යනු කාන්තාවක් සතු වූ ඉතා උතුම් ගුණාංගයක්. එවැනි මවක්, කාන්තාවක් ජාතියේම රැකවරණය වෙනුවෙන් කැපවීම යනු අති විශිෂ්ට වූ කාර්යයකි. එවැනි දිරිය කාන්තාවන් රැසකගෙන් සමන්විත යූනියන් ඇෂුවරන්ස් රක්ෂණ ආයතනයේ අද දවසේ තම අත්දැකීම් අප සමඟ බෙදා ගැනීමට එක්වන ඇය නමින් අප්සරා ප්‍රනාන්දු මහත්මියයි. වර්තමානය වන විට ජා ඇල යූනියන් ඇෂුවරන්ස් ශාඛාවේ මූල්‍ය උපදේශකවරියක් විදිහට සේවය කරන ඇය, දශක 3කට අධික සිය අත්දැකීම් අප සමඟ මෙසේ බෙදාගැනීමට එක්විය.**

**ඔබ රක්ෂණ වෘත්තියට යොමුවෙන්නේ කොහොමද?**

මම මීගමුව මියුසියස් බාලිකා විද්‍යාලයේ උසස් පෙළ අධ්‍යාපනය නිම කිරීමෙන් පසුව, මගේ වෘත්තිය ජීවිතය මොන දිසාවකට යොමු කරනවාද කියන පැහැදිලි අදහසකින් නොවේ හිටියෙ. මේ අතර මගේ සහෝදරියගෙ මඟ පෙන්වීම ඔසසේ පුවත්පත් දැන්වීමකට අනුව අයදුම්පත් යොමුකිරීමෙන් පසුව තමයි යූනියන් ඇෂුවරන්ස් සමාගමේ රක්ෂණ අළෙවි උපදේශකවරියක් බවට පත්වීමට හැකියාව ලැබෙන්නෙ. රක්ෂණය සම්බන්ධයෙන් පාසලෙන් ලබපු දැනුම සහ සමාජයෙන් ඉගෙනගත් දේවල් ඔලුවෙ තියාගෙන තමයි මම මුලින්ම මේ වෘත්තියට පැමිණියේ. නමුත් ඊට වඩා හාත්පසින්ම වෙනස් චිත්‍රයක් තමයි මට දකින්නට ලැබුණේ. මේ නිසාම අද වෙනකොට අවුරුදු 30කට අධික කාලයක් මට මේ ආයතනයේ සේවය කිරීමේ අවස්ථාව ලැබෙනවා.

**ආයතනයක් විදිහට යූනියන් ඇෂුවරන්ස්, ඔබේ ජයග්‍රහණය වෙනුවෙන් ලබා දුන්නේ මොනවගේ දායකත්වයක්ද?**

මගේ මේ සෑම ජයග්‍රහණයක් පිටුපසම සිටින්නේ යූනියන් ඇෂුවරන්ස් ආයතනය කියන එක මම වගකීමෙන් කියනවා. විශේෂයෙන් ශක්තිමත් පදනමක් මත පිහිටා ක්‍රියාත්මක වන මේ ආයතනය තුළින් පාරිභෝගිකයන් තුළ තබා ඇති විශ්වාසය අපට අපේ වෘත්තිය කාර්යයන් සාර්ථක ආකාරයෙන් කරන්න පසුබිමක් නිර්මාණය කර තිබෙනවා. ඒ වගේම ආයතනයක් විදිහට අපේ දැනුම වර්ධනය කිරීම වෙනුවෙන් නිරන්තරව දක්වන දායකත්වය, අපිට වඩාත් සාර්ථක සේවාවක් අපේ ගනුදෙනුකරුවන් වෙත ලබාදීමට අවස්ථාව උදාකර දෙනවා. විශේෂයෙන් ආයතනය මගින් ලබාදෙන රක්ෂණ සැලසුම් සම්බන්ධයෙන් වගේම රක්ෂණ ක්ෂේත්‍රය තුළ යාවත්කාලීන වන දැනුමින් අපව පෝෂණය කිරීම වෙනුවෙන් ආයතනය මගින් දේශීය වගේම විදේශීය සම්පත් දායකයින්ගේ සහභාගිත්වයෙන් වැඩසටහන් පවා සංවිධානය කරනවා. මෙයින් අලෙවි උපදේශකවරුන් විදිහට වඩාත් සාර්ථක වගේම ඵලදායී සේවාවක් ලබාදීමට හැකියාව ලැබෙනවා. ඒ වගේම රක්ෂණ අලවි උපදේශකවරයෙක් විදිහට සම්බන්ධ වූ මට අද වෙනකොට විධායක ශ්‍රේණියේ නිලධාරිණියක් දක්වා ඉහළට යාමට වගේම එයින් සුවිශාල අත්දැකීම් ප්‍රමාණයක් ලබාගැනීමටත් මට හැකියාව ලැබිලා තිබෙනවා.

**රක්ෂණ වෘත්තිය තුළ ඔබ ලැබූ ජයග්‍රහණ මොනවද?**

රක්ෂණ වෘත්තිය තුළ මම අද වෙනකොට ජයග්‍රහණ රැසක් අත්කරගෙන තිබෙනවා. ඒ අතරින් යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේදී ලබාදෙන ඉහළම ප්ලැටිනම් සම්මානය එක් වරක් සහ පූර්ණ රන් සම්මානය 12 වරක් සහ LIMRA සම්මානය 04 වතාවක් ඇතුළුව සම්මාන විශාල ප්‍රමාණයක් දිනා ගැනීමට මට හැකියාව ලැබුණා. මීට අමතරව රක්ෂණ අලෙවි උපදේශකවරයෙකුට ජාත්‍යන්තර වශයෙන් දිනාගත හැකි ඉහළම ජයග්‍රහණය වන MDRT සාමාජිකත්වය පවා හිමිකර ගැනීමේ අවස්ථාව මට හිමිවුණා. මේ ජයග්‍රහණ තුළින් මට මා සම්බන්ධයෙන් ඉහළ විශ්වාසයක් ගොඩනාඟා ගැනීමට හැකිවීම වගේම රක්ෂණ ක්ෂේත්‍රය තුළ මට නව අගයක් එක්කරගැනීම මම ලැබූ සුවිශේෂිම ජයග්‍රහණයක් වෙනවා.

**ඔබ හිතන විදියට ඔබ වෘත්තිකයෙක්ද? ව්‍යවසායකයෙක්ද?**

මට අනුව මම ව්‍යවසායකයෙක්. රක්ෂණ වෘත්තිය කියන්නේ සාමාන්‍ය වෘත්තියෙන් එහා ගිය එකක්. ඒක අනෙක් වෘත්තීන්ට වඩා විශාල නිදහසක් හිමි තැනක්. ඒ වගේම අපට අවශ්‍ය ආකාරයට අපේ වෘත්තිය කටයුතු කළමනාකරණය කර ගැනීමේ හැකියාව පවතිනවා. මේ නිසා කාන්තාවක් විදිහට මට මගේ පවුලේ සහ දරුවන්ගේ කටයුතු සහ වෘත්තිය කටයුතුත් සාර්ථකව සැලසුම් කර ගැනීමේ හැකියාව ලැබෙනවා. මේ වගේ පරිසරයක් ඇතිවෙන්නේ තමන්ගේම ව්‍යාපාරයක් තුළ දී විතරයි. එතනදී අප මහන්සිවන තරමට ඉපැයීම් කර ගැනීමේ හැකියාව ලැබෙන අතරම, අපේ ඉලක්ක වෙත ගමන් කිරීමේ හැකියාවත් ලැබෙනවා. රක්ෂණ වෘත්තියේදීත් අපට මාසිකව ඉපැයීම්වල කිසිම සීමාවක් නැහැ. අපිට කෙතරම් මුදලක් උපයාගැනීමට අවශ්‍යද, ඒ වෙනුවෙන් අපට සැලසුම් සකස්කර අපගේ ඉලක්ක වෙත යාමේ හැකියාව තිබෙනවා. ඒ වගේම වෘත්තිකයෙක් විදිහට මම අද වෙනකොට මගේ ස්ථාවරත්වය වෙනුවෙන් ආයෝජන කාර්යයන් රැසක් දියත් කර තිබෙනවා. මේ සියල්ලටම අවශ්‍ය දැනුම සහ උත්තේජනය මට ලැබුණේ යූනියන් ඇෂුවරන්ස් ආයතනයෙනුයි. අනක් වැදගත්ම කාරණය තමයි මානසික නිදහස. අද වෙනකොට සාර්ථක පවුලක් නිර්මාණය කරගෙන, දරුවන්ට අපෙන් විය යුතු යුතුකම් පවා ඉටුකිරීමට මට හැකියාව ලැබුනේ රක්ෂණ වෘත්තිය සහ යුනියන් ඇෂුවරන්ස් ආයතනය නිසයි.

**ඔබේ ජීවිතයේ අරමුණු වලට යාමට මේ වෘත්තිය බලපෑවේ කෙසේද?**

මට මගේ ජීවිතේ සිහින ජයග්‍රහණය කරගන්න හැකිවුණේ යූනියන් ඇෂුවරන්ස් සමාගම නිසයි. මේ වෘත්තිය තුළින් මට මගේම අංගසම්පූර්ණ නිවසක්, සුඛෝපභෝගී වාහන වගේම මගේ දරුවන්ට සාර්ථක අධ්‍යාපනයක් ලබාදීමට හැකිවුණා. එදා කුඩා දරුවන් දෙදෙනෙකුගේ මවක් විදිහට යූනියන් ඇෂුවරන්ස් ආයතනයට එක්වුණ මට, අද දවසේ දී ඒ දරුවන්ට විදේශීය අධ්‍යාපනය ලබාදෙමින් සාර්ථක අනාගතයක් ලඟාකර දීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන්න හැකිවුනා. ඒ වගේම විදේශීය රටවල සංචාරය කරමින්, සමාජ වගකීම් කාර්යයන් සාර්ථකව ඉටුකරමින් අද වෙනකොට නිදහස් වගේම ප්‍රීතිමත් ජීවිතයක් ගතකිරීමේ අවස්ථාවත් මට ලැබී තිබෙනවා.

**අනෙක් වෘත්තීන් එක්ක සංසන්දනය කිරීමේදී රක්ෂණ වෘත්තියේ තියෙන විශේෂත්වය කුමක්ද?**

වෙන වෘත්තීන් වලට සාපේක්ෂව, අපගේ ඉලක්ක වලට ඉතා ඉක්මණින් ගමන් කිරීමේ හැකියාව අපට රක්ෂණ වෘත්තියෙන් ලැබෙනවා. උදාහරණයක් විදිහට මම අද වෙනකොට මාසිකව ඉක්කම් 6ක ආදායමක් උපයනවා. අනෙක් කාරණය තමයි මේ වෘත්තියෙන් සමාජය සිදුවන ධනාත්මක බලපෑම. අපි මේ වෘත්තියෙන් පුද්ගලයන්ගේ ජීවිත උසස් කිරීම වෙනුවෙන් අවශ්‍ය මගපෙන්වීම සහ සැලසුම් සැකසීම තමයි කරන්නෙ. ඒ වගේම ඔවුන්ගේ ජීවිතයේ අසීරුම අවස්ථාවලදී ඒ අයට ශක්තියක් වීමට අපිට මේ වෘත්තිය නිසා අවස්ථාව ලැබෙනවා. මේ නිසා රක්ෂණ වෘත්තිය කියන්නේ වෘත්තියකට එහා ගිය සමාජ සත්කාර්යයක් විදිහට තමයි මම දකින්නේ. ඒ නිසා පුද්ගලිකව මම මේ වෘත්තිය තුළින් ලබාගෙන තිබෙන සමාජ අත්දැකීම් අති විශාලයි.

**කාන්තාවන් විදිහට ඔබ ගෙදරදොර වැඩ කටයුතු සමග වෘත්තිය කාර්යයන් කරගන්නේ කොහොමද?**

මගේ අත්දැකීමට අනුව කාන්තාවකට සුදුසුම වෘත්තිය තමයි රක්ෂණ උපදේශක වෘත්තිය. කාන්තාවක් කියන්නේ වගකීම් දැරීමේ සහ කළමනාකරණ කාර්ය සම්බන්ධයෙන් විශාල හැකියාවක් ඇති කෙනෙක්. උදාහරණයක් විදිහට අපේ අම්මලා ගැන හිතන්න. ඒ අය දරුවන්ගේ වැඩ වගේම ගෙදරදොර වැඩ කටයුතුත් වගේම ඇගේ වැඩ කටයුතු සහ සමාජයේ වැඩ කටයුතු පවා සාර්ථකව කළමනාකරණය කරනවා නේද? කාන්තාවක් විදිහට මේ සියළුම කාර්යයන්

> **"ශක්තිමත් පදනමක් මත පිහිටා ක්‍රියාත්මක වන මේ ආයතනය තුළින් පාරිභෝගිකයන් තුළ තබා ඇති විශ්වාසය අපට අපේ වෘත්තිය කාර්යයන් සාර්ථක ආකාරයෙන් කරන්න පසුබිමක් නිර්මාණය කර තිබෙනවා."**

කළමනාකරණය කරගනිමින් වෘත්තිය කාර්යයක් කිරීමට අවශ්‍ය පරිසරය සකසා දෙනවානම්, ඒ මේ වෘත්තියෙන් පමණයි කියන එක මම අත්දැකීමෙන් දන්න කරුණක්. දිනපතා කාර්යාලයට යාම අවශ්‍ය නොවීම වගේම නිදහස් වෙලාවට වැඩ කටයුතු කිරීමේ අවස්ථාව තිබීම නිසා සාර්ථකව වෘත්තිය කාර්යන් කිරීමේ හැකියාව ලැබෙනවා. ඒ වගේම යූනියන් ඇෂුවරන්ස් සමාගම තුළ වෘත්තිය වශයෙන් ඉදිරියට යාමට තිබෙන පසුබිම කාන්තාවන් විදිහට අපේ ශක්තියට නව අගයක් ලබා දෙනවා. මේ නිසා මම සියළුම කාන්තාවන්ට මේ මොහොතේ ආරාධනා කරනවා යූනියන් ඇෂුවරන්ස් සමඟ අත්වැල් බැදගන්න කියල.

**ඔබේ අනාගත අපේක්ෂාව කුමක්ද?**

මේ වෙනකොට රක්ෂණාවරණ ලබාගැනීමේ ප්‍රතිශතය ලංකාවේ හරිම අඩුවෙන් තමා තියෙන්නේ. දියුණු රටවල මේ තත්වය ඉතාම ඉහළ මට්ටමක තියෙනවා. මේ නිසා මගේ අනාගත අරමුණ තමයි රක්ෂණයේ තිබෙන මේ වැදගත්කම ජනතාව අතරට ගෙනගොස් එහි තිබෙන ප්‍රතිලාභ ජනතාවට ලබාදීම.

**රක්ෂණ වෘත්තිය සමඟ සම්බන්ධවී ජීවිතය ජයගැනීමට කැමති කාන්තාවන්ට ඔබට දීමට ඇති උපදේශය කුමක්ද?**

මම හිතන විදියට, කාන්තාවක් විදිහට ඔබ රැකියාවක් කිරීමට යොමු වෙනවානම් ඒකට සුදුසුම වෘත්තිය ක්ෂේත්‍රය තමයි රක්ෂණ වෘත්තිය. ආයතනයක් විදිහට යූනියන් ඇෂුවරන්ස් සමාගම ඔබට මේ ක්ෂේත්‍රයෙන් ඉදිරියටම ගමන් කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සහ සැලසුම් නිර්මාණය කර දී තිබෙනවා. මේ නිසා ඔබ කැපවීමෙන් මේ වෘත්තියේ නිරතවීම තුළින් වෘත්තිය වශයෙන් ඉහළටම ගමන් කිරීමේ හැකියාව ලැබෙනවා. ඒ වගේම ඔබේ දක්ෂතා වලට ඉහළ ඇගයීමක් ලබාදෙන ආයතනයක් විදිහට යූනියන් ඇෂුවරන්ස් සමාගම, ඔබේ සියළුම සිහින අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමටත් නිරන්තරව කැපවෙනවා. ඒ නිසා ඔබ රක්ෂණ වෘත්තියට යොමුවන්නේ නම් පළමු තේරීම යූනියන් ඇෂුවරන්ස් සමාගම බවට පත්කරගන්න.
ඒ තේරීමම ඔබව ජයග්‍රාහකයෙක් කරනු නොඅනුමානය.

**මේ ගමනට සහය වූ අය සිහිපත් කළොත්?**

මුලින්ම මගේ පුහුණු ගුවරුවරයා වූ සුදත් පෙරේරා මහතා මම ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම මගේ ශාඛාවේ අලෙවි කළමනාකර කසුන් ගලප්පත්ති මහාතා, කණ්ඩායම් නායිකා සුරේඛා රුවංගනී මෙනවිය වගේම යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ සියළු දෙනාවත් ගෞරවයෙන් සිහිපත් කරනවා. මට මගේ වෘත්තිය කාර්යයන් සාර්ථකව කර ගැනීමට පරිසරය සකසා දුන් මගේ ස්වාමිපුරුෂයා සහ දරුවන්ට මම ස්තුතිය පුදකරනවා.

ඒ වගේම මගේ ජයග්‍රහණය පිටුපස සිටින විශාලම ශක්තිය වන මගේ ගනුදෙනුකරුවන්. මගේ වෘත්තිය ජීවිතයේ ආරම්භයේ සිටම මා සමග සිටිමින් මට ශක්තියක් වූ සියළුම ගනුදෙනුකරුවන් මම මේ මොහොතේ ආදරයෙන් සිහිපත් කරනවා වගේම මගේ ස්තුතියට ඔවුන්ට පුදකර සිටිනවා.

සටහන :
පාලිත අබේලාල්



මූල්‍ය උපදේශිකා - අප්සරා ප්‍රනාන්දු
MDRT - 2022
යූනියන් ඇෂුවරන්ස් - ජා ඇල ශාඛාව

# බණ්ඩා මළොත් මගෙ විමලාට අගමැති වෙන්න පුළුවන්

## හිටපු අගමැති බණ්ඩාරනායක ඝාතනය කිරීමට පිඹුරුපත් සැකසුනු හැටි



ඇතැම් සිදුවීම්වල බලපෑම අතිශය සීමිත පිරිසකට විය හැක. එහෙත් තවත් සිදුවීම් බොහෝ පිරිසකට දැනෙයි. ඇතැම්විට ලෝකයේම අවධානය යොමුවෙයි. මෙරට හිටපු අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්. ආර්.ඩී.බණ්ඩාරනායක ඝාතනයද එලෙස ලෝකයේම අවධානයට ලක්වූ සිදුවීමකි. දේශපාලනය, යුක්තිය පසිඳලීම හෝ ලෝක ඉතිහාසය සැලකුවද එය දැඩි සේ කතාබහට ලක්වන්නක් බවට විවාදයක් නැත. ඒ අනුව අද මෙම ලිපියෙන් බණ්ඩාරනායක ඝාතනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. නීතිය සම්බන්ධව දැනුවත් කිරීමේ ඉදිරි පෙළ චරිතයක් ලෙස සැලකෙන ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න අද දිනයේද තොරතුරු ඉදිරිපත් කරයි. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රදානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රි (Hubert Humphrey) ශිෂ්‍යත්වයක්ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රග්බි ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු 'යළි මැවෙන අපරාධයක්' නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ.

24 කොටස

### දේශපාලනයට වෙනසක්

සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකි. බ්‍රිතාන්‍ය හුරුව තිබුණද හෙතෙම වාමාංශික දේශපාලන නැඹුරුවකින් යුක්ත විය. එංගලන්ත අධිරාජ්‍යවාදයෙන් නිදහස් වුවාට සැබෑ ලාංකිකයාට රටේ අයිතිය නොලැබුණ බව ඔහුගේ අදහස විය. ඔහු සැමවිට උත්සාහ ගත්තේ තමා අධිරාජ්‍යවාදී මානසිකත්වය රහිත තැනැත්තකු බව පෙන්වීමටයි. ඒ ඔස්සේ පාලන බලය සියතට ගැනීමේ වැඩපිළිවෙළක හෙතෙම නිරත වූයේය. සිංහලකම හදවතින් පමණක් නොව ගතින්ද පෙන්වූ ඔහු ජාතික ඇඳුමින් ජනතාව ඉදිරියට ගියේය. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය බණ්ඩාරනායක රජ කරවීමේ ප්‍රබල අඩිතාලම විය. තමා පීඩිතයාගේ නායකයා බවද ඔහු පෙන්වා දුන්නේය. මෙරට සිව්වැනි අග්‍රාමාත්‍යවරයා බවට සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක පත්වූයේ එලෙසිනි. ඔහු සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කළේය. එහි ඵල විපාක කෙලෙස වුවද මිනිසුන් අවදි කළ හැකි ප්‍රධාන මාතෘකා වන ජාතිය, ආගම අද මෙන්ම ඔහුද එකල සිය දේශපාලනයට ඈඳ ගත්තේය. චතුර කථිකත්වයද ඔහුගේ ගමනට මනා පිටිවහලක් විය. ඒ නිසාම ආසියාවේ රිදී සීනුව යන නමින් බණ්ඩාරනායක ප්‍රචලිතව සිටියේය. ඔක්ස්ෆර්ඩ් සරසවි ශිෂ්‍ය සංගමයේ සභාපති ධුරයද දැරූ ඔහු මැනැවින් ඉංග්‍රීසි බස හැසිරවීය. සිංහල භාෂාවද එසේමය. එමෙන්ම මෙරට වංශවත් පරම්පරාවක කාන්තාවක සමඟ විවාහ වීමද ඔහුගේ දේශපාලන පදනම ශක්තිමත් වීමට හේතුවකි. මේ සියලු කරුණු මත ඔහු වටා රොද බැඳගත් පිරිස බොහෝය. බණ්ඩාරනායකගේ ගමනට ප්‍රධාන සවියක් වූ අය අතර කැලණිය රජමහා විහාරයේ එකල විහාරාධිපති මාපිටිගම බුද්ධරක්ඛිත හිමියෝද වූහ. බණ්ඩාරනායක අගමැති කරවීම උදෙසා උන්වහන්සේ සැලකිය යුතු ධනස්කන්ධයක් වැය කර තිබිණ. ඒ ප්‍රති උපකාරද අපේක්ෂාවෙනි.

### බිඳවැටුණු හිතවත්කම්

මීයක් කඩන්නේ අත ලෙවකන්න නොවේ යනුවෙන් කියමනක් තිබේ. ඒ අනුව බුද්ධරක්ඛිත හිමියන් බණ්ඩාරනායක බලයට ගෙන ඒමට වෙහෙසුණේ බලාපොරොත්තු රැසක් තබා ගනිමිනි. විශේෂයෙන්ම වෙළඳ ලොව ජයකෙහෙළි නැංවීම උන්වහන්සේගේ සිහිනය විය. එහෙත් ඒවාට තමන් පත් කරගත් අගමැතිගේ තල්ලුවක් නැති බව බුද්ධරක්ඛිත හිමියන්ට වැටහීමට වැඩි කාලයක් ගියේ නැත. ධනවතුන්ගේ අපේක්ෂා ඉටුකර දීමෙන් තමන් ඔවුන්ගේ ගොදුරක් වනු ඇතැයි අග්‍රාමාත්‍යවරයා සිතුවා



විය හැක. ඉන් තමාට ඇති ජන ප්‍රසාදය පහළ යනු ඇතැයි ඔහු උපකල්පනය කරන්නට ඇත. එබැවින් අග්‍රාමාත්‍යවරයා සහ මාපිටිගම බුද්ධරක්ඛිත හිමියන් ඇතුළු පිරිස අතර දුරස් බවක් ඇති විය.

## බුද්ධරක්ඛිතගේ කෝපය

බණ්ඩාරනායක රජයේ සිටි එකම කැබිනට් අමාත්‍යවරිය විමලා විජේවර්ධනය. ඈ සහ බුද්ධරක්ඛිත හිමියන් අතර වූයේ සමීප සබඳතාවකි. ඒ ඇසුරෙන් විවිධ කටකතාද පැතිර ගියේය. ඔවුන් දෙදෙනා තේමා කරගනිමින් කැලෑ පත්තරද මුද්‍රණය විය. ඒවා කළ තැනැත්තන්ට එරෙහිව කටයුතු කිරීමේ දැඩි අවශ්‍යතාවක් බුද්ධරක්ඛිත හිමිට විය. උන්වහන්සේ අග්‍රාමාත්‍යවරයා හමුවීමටද ගියේ ඒ ගැන කතා කිරීමටයි. එහෙත් සිදුවීම සිනාවකින් බැහැර කළා මිස අග්‍රාමාත්‍යවරයා එය ගණනකට ගත්තේ නැත. බුද්ධරක්ඛිත හිමියන් අගමැති කෙරෙහි දැඩි සේ කෝපාවිෂ්ට වීමට එයද ප්‍රධාන හේතුවක් විය.

ඊට අමතරව බුද්ධරක්ඛිත හිමියන් නැව් සේවයක් ආරම්භ කිරීමටද කටයුතු කර තිබිණ. එහි දැඩි මූල්‍ය අක්‍රමිකතා පවතින බව හෙළි විය. සමාගම මගින් බුරුමයේ සිට සහල් ආනයනය කිරීමටද සැලසුම් කර තිබිණ. එහෙත් පැවති අක්‍රමිකතා මත බණ්ඩාරනායක අගමැතිවරයා ගැසට් නිවේදනයක් මගින් ඔවුන්ට ගිවිසුමට එළැඹීමට නොහැකි පසුබිමක් සැකසීය. එයද බුද්ධරක්ඛිත හිමියන්ට එල්ල වූ තදබල අතුල් පහරකි. එම සමාගම පසුව සම්පූර්ණයෙන්ම බිඳ වැටිණ. ඉන් කෝපයට පත්ව සිටි බුද්ධරක්ඛිත හිමියන් විමලා විජේවර්ධනගේ නිවසේදී ඇයට පවසා තිබුණේ අගමැතිවරයා කෙසේ හෝ බලයෙන් පහ කළ යුතු බවයි.

1959 මාර්තු මාසයේ දිනක ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මේලනයක් පැවැත්විණ. එය කඩාකප්පල් කිරීමට බුද්ධරක්ඛිත හිමියන් පැමිණුනේ මැරයන් පිරිසක්ද රැගෙනය. එහෙත් කලින් ඒ පිළිබඳ දැනුවත්ව සිටි අග්‍රාමාත්‍යයවරයා ගැටලුවකින් තොරව රැස්වීම පැවැත්වීමට සමත් විය.

මෙවැනි නොහොඳ නෝක්කාඩු වර්ධනය වෙමින් තිබියදී එකල සිටි ප්‍රවීණ ජ්‍යෝතිෂ්‍යවේදියකු අමුතු කතාවක් කීය. ඒ, මෙරට ඊළඟ අගමැති වන්නේ කාන්තාවක බවයි. බුද්ධරක්ඛිත හිමිගේ නිගමනය වී තිබුණේ බණ්ඩාරනායක මියගියහොත් විමලා විජේවර්ධන අග්‍රාමාත්‍ය ධුරයට පත්වනු ඇති බවටයි. එය සහනදායී සිතිවිල්ලකි. එහෙත් ඒ සහනය දිගටම භුක්ති විඳීමට නම්, අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක ජීවත්ව සිටීම බාධාවක් වේ. මේ සියලු කරුණු මුල් කරගනිමින් රහසිගතව සැලසුමක් සකස් කෙරිණ.



**සියම් නිකායේ හිමිවරු සිවුර අඳින්නේ එක උරහිසක් පමණක් වැසෙන පරිදිය. එහෙත් එදා සෝමාරාම හිමිගේ දෙඋරහිසම වැසී තිබිණ. ඒ පිළිබඳ අනෙක් ස්වාමීන් වහන්සේ විමසූ විට අග්‍රාමාත්‍යවරයාට ගෞරවය පිණිස එසේ සිවුර හැඳි බව සෝමාරාම හිමි පැවසූහ**

## තල්දූවේ සෝමාරාම සොයා යයි

1915 අගෝස්තු 27 වනදා තල්දූවේ රතුගම රාළගේ වේරිස් සිඤ්ඤෝ නමින් උපත ලැබූවෙක් 1936 වසරේ ජූනි මාසයේ මහනුවරදී පැවිදි දිවියට එළැඹියේය. ඒ, තල්දූවේ සෝමාරාම නමිනි. දේශපාලනයට රුචි වූ උන්වහන්සේ 1952දී පමණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටද සම්බන්ධ වූහ. කැලණිය රජමහා විහාරයට නිතර ආ ගිය උන්වහන්සේ සහ මාපිටිගම බුද්ධරක්ඛිත හිමි අතර හිතවත්කමක් විය. තල්දූවේ සෝමාරාම හිමි ස්වභාවයෙන්ම ප්‍රචණ්ඩත්වයට බරය. අගමැති කෙරෙහි කෝපයෙන් දිවා රෑ කල්පනා කරමින් සිටි බුද්ධරක්ඛිත හිමියන් සිය සැලසුමට තල්දූවේ සෝමාරාම භික්ෂුවද සම්බන්ධ කරගැනීමට අදහස් කළේය. අක්ෂි වෛද්‍යවරයකු ලෙස බොරැල්ල ආයුර්වේද රෝහලේ සේවය කරමින් සිටි සෝමාරාම හිමි හමුවීමට බුද්ධරක්ඛිත හිමියන් සිය සහායකයකු වන ජයවර්ධන සමඟ පැමිණියේ ඒ අනුවයි. සාකච්ඡාවේදී අගමැතිගේ වැරදි පාලනය සහ ඉන් රටට අත්වන අයහපත් ප්‍රතිඵල පිළිබඳ බුද්ධරක්ඛිත හිමියෝ දැඩි සේ කරුණු පැහැදිලි කළහ. එනිසා අගමැති සම්බන්ධ කඩිනම් තීරණයක් ගැනීමේ අවශ්‍යතාව උන්වහන්සේ අවධාරණය කළහ. එම වගකීම පැවරුණේ තල්දූවේ සෝමාරාම හිමිටයි. යෝජනාවෙන් අන්දමන්ද වුවද එය දැඩිව ප්‍රතික්ෂේප කිරීමේ හැකියාවක් සෝමාරාම හිමිට නොවීය. ඒ, බුද්ධරක්ඛිත හිමියන් සේම විමලා විජේවර්ධන අමාත්‍යවරියගෙන් උන්වහන්සේ බොහෝ උපකාර ලබා තිබූ බැවින්ය. නිසි සුදුසුකම් නොතිබියදී ආයුර්වේද විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ධුරයක්ද උන්වහන්සේට ලැබී තිබුණේ විමලා විජේවර්ධන ඇමතිවරියගේ උපකාරයෙනි. කෙසේ වෙතත් යම් ක්‍රියාමාර්ගයකින් අනතුරුව තමාට කුමක් වේදැයි යන සැකය සෝමාරාම හිමිට විය. එහෙත් කිසිඳු ගැටලුවක් නොවන්නට වග බලාගන්නා බවට සහතිකය බුද්ධරක්ඛිත හිමිගෙන් ලැබිණ.

## සෝමාරාමට ගිනි අවි පුහුණුව

අගමැතිට එරෙහි සැලැස්මේ ප්‍රධාන භූමිකාවක් රඟන තල්දූවේ සෝමාරාමට ගිනි අවි පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාව මතුවිය. මුතුරාජවෙල ප්‍රදේශයේදී එම පුහුණුවීම් සිදු කෙරුණු බව පසුව හෙළි විය. කදුරු ගෙඩිවලට වෙඩි තබමින් පුහුණුව ක්‍රියාත්මක කෙරිණ. ඒ වනවිටද සෝමාරාම හිමි තමාගේ ඉලක්කය කවරෙකුද යන්න දැන සිටියේය. සෝමාරාම හිමි ඉලක්කයට වෙඩි තැබීමේ රුසියකු බව එහිදී සියලුදෙනාට පෙනී ගියේය. එය සැලසුමට මනා සහායකි. මේ සැලැස්මට සම්බන්ධ වූ අනෙක් සියලුදෙනාද මාපිටිගම බුද්ධරක්ඛිත සහ විමලා විජේවර්ධනගෙන් බොහෝ උදව් ලබාගත් අයයි. ඔවුන්ගේ පවුල්වල අයද විජේවර්ධන සෞඛ්‍ය අමාත්‍යවරියගේ උපකාරයෙන් රැකියාවල විවිධ උපකාර ලබා තිබේ. එනිසා සැලසුමට සම්බන්ධ සැවොම බුද්ධරක්ඛිත සහ විමලාට ණයගැති වූවෝ වෙති.



බුද්ධරක්ඛිත හිමියන්



විමලා විජේවර්ධන අගමැති එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක සමඟ

## තීරණාත්මක දිනය


1959 සැප්තැම්බර් 25 වනදා එළැඹිණ. ඒ, සූක්ෂම ලෙස පිඹුරුපත් ඇඳි සැලසුම ක්‍රියාත්මක කරන දිනයයි. එස්.ඩබ්.ආර්. ඩී.බණ්ඩාරනායක අග්‍රාමාත්‍යවරයා සුපුරුදු පරිදි කොළඹ 07 රොස්මිඩ් පෙදෙසේ පිහිටි සිය නිවසේ (වත්මන් සුඛෝපභෝගි ටින්ටර්ජල් හෝටලය) සිටියේය. ඒ නිවස ඕනෑම කෙනෙකුට විවෘතය. අග්‍රාමාත්‍යවරයා හමුවීමට පැමිණෙන පුද්ගලයෝ දිනපතා එහි වූහ. තල්දූවේ සෝමාරාම හිමි උදෑසනම එහි ගියේ සැලසුම් ප්‍රකාරවය. ඒ වනවිට පැමිණි පිරිස අතර තවත් ස්වාමීන් වහන්සේ නමක් වූහ. ඒ නිවන්තිඩියේ ආනන්ද හිමියන්ය. දෙදෙනා අසුන් ගත්තේ එකිනෙකා අසලය. ඔවුන් අතර කතාබහකි. සෝමාරාම හිමි සියම් නිකායට අයත්ය. එම නිකායේ හිමිවරු සිවුර අඳින්නේ එක උරහිසක් පමණක් වැසෙන පරිදිය. එහෙත් එදා සෝමාරාම හිමිගේ දෙඋරහිසම වැසී තිබිණ. ඒ පිළිබඳ අනෙක් ස්වාමීන් වහන්සේ විමසූහ. අග්‍රාමාත්‍යවරයාට ගෞරවය පිණිස එසේ සිවුර හැඳි බව සෝමාරාම හිමිගේ පිළිතුර විය. උදෑසන 9.15ට පමණ අග්‍රාමාත්‍යවරයා ඉහළ මාලයේ සිට තරප්පු පෙළ බැස පහත මාලයට ආවේය. ප්‍රථමයෙන්ම ඔහු හමුවූයේ එවකට මෙරට ඇමරිකානු තානාපතිව සිටි බර්නාඩ් ගෆ්ලර්වයි. පසුව රාජ නීතිඥවරයකු හමුවිය. සෙනෙවිරත්න නමැත්තකුද චරිත සහතිකයක් ගැනීමට පැමිණ සිටියේය. එය සකසාගැනීමට හෙතෙම සෙනෙවිරත්න කන්තෝරු කාමරයට පිටත් කළේය. එහිදී ඔහුට ඇසුණේ වෙඩි හඬවල් කිහිපයකි. සෙනෙවිරත්න වහාම කන්තෝරු කාමරයෙන් පිටතට ආවේය.

**ඔහු දුටුවේ කුමක්ද?**

**ලබන සතියේ බලාපොරොත්තු වන්න.**

■ **නීතීඥ රජනිකා ලියනගේ**

කෙටි කතාව



# ඕකුන් කරට ගන්න එපා ඊටපස්සේ බස්සගන්න අමාරුයි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පිට වෙනවත් එක්කම වැඩිදුර අධ්‍යාපන අවස්ථාවක් සඳහා ඔස්ට්‍රේලියාව බලා යන්න අරුන්දතීට ශිෂ්‍යත්වයක් ලැබුණා. සෑහෙන්න පිරිසක් අයැදුම් කරලා තිබුණත් ඒ අවස්ථාව ලැබුණේ ලංකාවෙන්ම තුන්දෙනෙකුට විතරයි. අරුන්දතී ඒ තුන්දෙනාගෙන් එක්කෙනෙක් වුණු එක ගැන ඇගේ පවුලේ අය හිටියේ නොසෑහෙන සතුටකින්.

**"කුරා කුඹියෙකුටවත් වරදක් නැති මගෙ අහිංසකීව කතරගම දෙයි හාමුදුරුවො රැකදෙන්න ඕන."**

අරුන්දතී ඔස්ට්‍රේලියාවට යන්න පිටත් වෙද්දී බුදු කුටිය ළඟ තිබුණු කතරගම දෙවියන්ගේ පින්තූරේ ඉස්සරහ අත් දෙක එකතු කරගෙන අම්මා එහෙම කිව්වා. විශ්‍රාමික රජයේ සේවකයෙක් වෙච්චි අරුන්දතීගෙ තාත්තාට ඒ හැටි වත්කමක් තිබුණේ නෑ. හැබැයි ඔවුන් කාටවත් අත පාන්නේ නැතුව ගමේ බොහොම වැදගත් විදියට ජීවත් වුණා.

ශිෂ්‍යත්වයෙන් ඔස්ට්‍රේලියාවට ගියාට ඉගෙනගන්න ගමන් අත්‍යවශ්‍ය වියදම් පියවගන්න අරුන්දතීට රැකියාවක් කරන්න වුණා. ඇයට රැකියාව ලැබුණේ බර්ගර් හට් එකක. ඒක සේවකයෝ 50-60ක් සේවය කරන, දිනකට පාරිභෝගිකයෝ සෑහෙන පිරිසක් යන එන ටිකක් ලොකු බර්ගර් හට් එකක්. අධ්‍යාපන කටයුතුවල නියැලෙන ගමන් සතියට දින කිහිපයක් ඇය එහි රැකියාව කළා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදිත් බොහෝ දේ ඉගෙනගත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිසා භාෂාව හැසිරවීම ඒ හැටි ගැටලුවක් වුණේ නෑ. ඒ නිසා එන යන හැමෝටම ඇය බොහොම සුහදව සංග්‍රහ සත්කාර කළා.

ඔහොම ඉන්නකොට එක දවසක රාජකාරි හමාර කරලා යන්න කලින් කුමක් හෝ කටයුත්තකට ඇයට මස් වර්ග ගබඩා කර තිබූ ශීතාගාරයට යන්න වුණා. අරුන්දතී එහි තිබූ ඇසුරුම් වගයක් පරීක්ෂා කරමින් ඉන්න අතරතුරේ හරි පුදුම දෙයක් සිද්ධ වුණා. රාත්‍රී 9 පහුවෙලා නිසා ඒක බර්ගර් හට් එක වහලා හැමෝම ගෙදර යන්න බලාගෙන ඉන්න වෙලාව. ඉතින් කවුරුහරි කෙනෙක් ශීතාගාරය විවෘතව තිබුණු නිසා ඇතුලත පරීක්ෂා නොකරම පිටතින් අගුළු දැම්මා. අරුන්දතී ඇතුළේ ඉන්න බවක් ඒ අගුළු දැමූ කෙනා දැනගෙන හිටියේ නෑ. දොර අගුළු දැමූ බව දැනුණු මොහොතේම අරුන්දතී ගිහින් දොරට ගැහුවත් කාටවත් ඇහුනේ නෑ. රාජකාරි වෙලාවේ ජංගම දුරකතන භාවිතයට වැට බැඳලා තිබුණු නිසා ෆෝන් එක අතේ තිබුණෙත් නෑ. ශීතාගාරයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක සෘණ අගයකයි තිබුණේ. උපරිම විනාඩි දහයක්වත් එකදිගට එතැන රැඳිලා ඉන්න අමාරුයි. එහෙම එකේ කිසිම හවිහරණක් නැතුව පැය දෙකක් විතර ඇය ශීත කාමරයේ රැඳී සිටියා.

අරුන්දතීගෙ අත් පා වල ලේ නහර කළු පාට වීගෙන එන හැටි ඇය දැක්කා. අඩුමතරමේ අත පය හොලවන්නවත් බැරිතරම් ගල් වෙලා. අධික සීතලට තොල් පැලිලා ලේ එන්න පටන්ගත්තා. කාටවත් ඇහෙන්නේ නැති බව දැන දැනම අරුන්දතී දොරට තඩි බෑවා. කෑ ගහලා ඇඬුවා. ඒත් කිසිම කෙනෙක් උදව්වට ආවේ නෑ. ඇයට ලංකාවේ ඉන්න අම්මයි තාත්තයි මතක් වුණා. අම්මා නිතරම සිහි කරන කතරගම දෙයිහාමුදුරුවන්ව මතක් වුණා. සීතලට අත් සහ පාදවල ඇඟිලි තුඩු පැලිලා ලේ එන්න පටන්ගනිද්දී ඒ හැමෝම සිහි කරගෙන ඇය බිම ඉඳගත්තා. ඒ තමන්ගේ ශරීරය ආපහු කිසිම දවසක උණුහුම් වෙන්නේ නැති බව දැනගෙන. අධික සීතලට තමන්ගේ හුස්ම අරගෙන යන්න ඉඩ දීලා ඇය අසරණව බලාගෙන හිටියා.

අතේ බැඳගෙන ඉඳපු ඔරලෝසුවේ වෙලාව නතර වෙලා. ඒත් ඒකේ අන්තිමට සටහන් වුණු වෙලාව විදියට පෙන්නුවේ 10.45යි විදියට. 'ඒ කියන්නේ දැන් රෑ 11 ත් පහුවෙලා ඇති'. අරුන්දතීට එහෙම හිතුණා.

ශරීරය දුබල වෙලා හදවත නතර වෙන්න ඔන්න මෙන්න තියෙද්දී එකපාරම ශීතාගාරයේ දොර ඇරෙනවා අරුන්දතීට දැනුණා. ඒ වෙද්දිත් ඇය බොහොම දුර්වලව සිහිසුන්වයි හිටියේ.

සිහිය එනකොට ඇය හිටියෙ සවුත් වේල්සයේ රෝහලක ඇඳක් උඩ. යන්තම් ඇස් ඇරෙද්දි හෙදියක් ඇවිත් අතට ගහලා තිබුණු මොන මොනවදෝ වයර් වගයක් ගලවලා ඉවත් කළා.

**"මට මොකද වුණේ?"**

ඇය ඉංග්‍රීසි භාෂාවෙන් එතැන ඉඳපු හෙදියකගෙන් ඇහුවා. ඒත් එක්කම ඇය සේවය කරපු බර්ගර් හට් එකේ සහෝදර සේවිකාවක් ඇවිල්ලා අරුන්දතීගෙ අතින් අල්ලගත්තා.

**"ඔයා ෆ්‍රීසින් රූම් එකේ ඉඳිද්දි කවුරුහරි එළියෙන් ලොක් කරලා. ඒ බව නොදැන කවුරුත්ම ගෙදර ගිහින්. සිකුරුටි පෝල් තමයි ඔයාව එතැනින් එළියට අරගෙන මේ රෝහලට ඇතුළත් කරලා තියෙන්නේ."**

**"ඒත් පෝල් කොහොමද මං ඒකේ හිරවෙලා ඉන්න බව දැනගෙන තියෙන්නේ?"**

අවුරුදු 60ක් විතර වයස ඇති බොහොම කාරුණික පෙනුමක් තියෙන පෝල් අහිංසක හිනාවක් එක්ක අරුන්දතී ඉස්සරහා පෙනී හිටියා. ඒත් කතා කළේ නෑ.

**"පෝල්, ඔයා මෙයාව හොයාගත්තු විදිය ඔයාම කියන්න."** අරුන්දතීගෙ මිතුරිය එමිලි, පෝල්ට කියද්දී කතාව පටන්ගන්නවා වෙනුවට ඔහු හරි හැඟීම්බර විදියට නැවතත් හිනාවුණා.

**"අපේ ෂොපින් මෝල් එකට එන දහස් ගාණක් සෙනඟ අතරේ මට මිස් අරුන්දතීව හරිම විශේෂයි. ඒකට හේතුවක් තියනවා. ෂොපින් මෝල් එකට කොච්චර අය ආව ගියත් උදේට 'Good morning. Have a nice day' කියලා මට සුබ පතන්නේ මිස් අරුන්දතී විතරයි. ඒ වගේම හවසට යද්දී 'Good bye! See you' කියලා මට සමුදෙන්නෙත් මිස් අරුන්දතී විතරයි. ඒ නිසා ඔබ මට උදේට සුබ පතලා ෂොපින් මෝල් එකේ ඇතුළට යන හැම දවසකම, හවසටත් මට කතා කරලා යන බව මට විශ්වාසයි. ඒත් එදා උදේ ඔබ මට කතා කරලා ඇතුළට ගියාට පස්සේ නැවත පිටවුණේ නැති වග මම දැනගෙන හිටියා. මොකද එහෙම ගියානම් වචනයක් දෙකක් කතා කරන්න වෙලාව නොතිබුණොත් අත වනලා හරි තමයි යන්නේ. ෂොපින් මෝල් එකේ හැමෝම පිටවෙලා ගියාට පස්සෙත් මට හිතුණා ඔබ ගොඩනැගිල්ල ඇතුළෙ ඉන්නවා ඇති කියලා. ඒ නිසා මම හැමතැනම හෙව්වා. ඒත් පේන්න නොහිටපු නිසා තමයි මම බර්ගර් හට් එකේ යතුරු අරගෙන එහි තිබුණු හැම කාමරයක්ම පරීක්ෂා කරලා බැලුවේ. එහිදී තමයි ඔබ ශීතාගාරයේ සිහිසුන්ව ඇද වැටී සිටින බව මම දැක්කේ."**

අරුන්දතීගේ ඇස්වලට කඳුළු ආවා. පුංචි කාලේ ඉඳලම ඕනම ආයතනයකට ඇතුළු වෙද්දී සහ පිටවෙද්දී තමන්ට දොර හැර දෙන ආරක්ෂක නිලධාරීන්ට සුන්දර සිනහවකින්වත් සංග්‍රහ කරන එක අරුන්දතීගෙ පුරුද්දක්. ඒ වගේම ඕනම ආයතනයක පවිත්‍රතා සේවකයින්ට පවා ඇය බොහොම ලෙන්ගතුයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනගන්න කාලේ ඒ වගේ සමහර අය එක්ක සුහදව කතාබහ කරද්දී සමහරු නම් කිව්වා "ඔය මිනිස්සුන්ව කරට ගන්න එපා. ඊටපස්සේ බස්සගන්න අමාරුයි" කියලා. හැබැයි කිසිම කෙනෙක්ගේ සැලකිල්ලට භාජනය නොවෙන කාගේවත් අවධානය නොලැබෙන ඒ වගේ අයට කරුණාවන්ත වෙද්දී, ඒ අයගේ මුහුණු මල් වගේ පිපෙන හැටි අරුන්දතී දැකලා තිබුණා. ඔස්ට්‍රේලියාවට ආවත් ඇගේ ඒ පුරුද්ද වෙනස් වෙලා තිබුණේ නෑ. තමන් රැකියාව කළ බර්ගර් හට් එක තිබුණු ෂොපින් මෝල් එකේ ආරක්ෂක නිලධාරියා වුණු පෝල්ට හැමදාම ඇය සුබපැතුවේ ඒ නිසා. අන්තිමට තමන්ගේ ජීවිතේ රැකෙන්න හේතුවෙලා තිබුණෙත් ඒ කරුණාව කියලා මතක් වෙද්දි ඇගේ ඇස් ආපහු කඳුලින් තෙත්වුණා. ඒ කඳුළට එහෙමම ගලාගෙන යන්න දීලා ඇය පෝල් දිහා බලාගෙන අත් දෙක එකතු කළේ 'ස්තුතියි' කියලා වචනයෙන් නොකියා.

කවුරු මොනවා කිව්වත් තත්ත්වයක් තරාතිරමක් නැතුව කොයි කාට වුණත් කරුණාවන්ත වෙන එක මොනතරම් හොඳ දෙයක්ද? අරුන්දතී දිහා බලාගෙන ඉඳපු එමලිටත් එහෙම හිතුණා.

■ සුරේෂ් විදානගමගේ

# ලෝකෙම ලොක්කන් හඳුනන අපේ රටේ පුංචි එකී

ලෝකයේ දේශපාලන නායකයෝ 40ක් ඡායාරූපවලින් මතක තියාගෙන ඉන්න පුළුවන් කාටද? එහෙම මතක තියාගෙන ඉඳලත් විනාඩි දෙකකට අඩු කාලයක් ඇතුළත ඒ නම් ටික කියාගෙන යන්න පුළුවන් කාටද? අපිට නම් ඒවා හීන. ඒත් අපි මේ කියන්න යන වයස අවුරුදු තුනේ කෙලි පොඩ්ඩට ඒ අපූරු හපන්කම කරන්න පුළුවන්. ඒ විතරක් නෙවෙයි ඒ හපන්කම ලෝක වාර්තාවක් දක්වා ගෙනියන්නත් පුළුවන් වෙලා. මේ කෙලිපොඩ්ඩ තමයි සෙන්තුල් කුමාර් හවිෂ්නා කියන්නේ.

"හවිෂ්නා කියලා කියන්නේ මගේ ලොකු දුව. එයාට පොඩි කාලේ ඉඳන්ම හොඳ මතක් ශක්තියක් තියෙනවා. ඒ නිසා තමයි එයාට ලෝක මට්ටමින් මේ වගේ ජයග්‍රහණයක් ගන්න පුළුවන් වුණේ. එයා ලෝක දේශපාලන නායකයින් හතළිස්දෙනෙකුගේ පින්තූර බලාගෙන එයාලව විනාඩියයි තත්පර දසයක කාලයක් ඇතුළත හරියටම නම් කෙරුවා."

දරුවන්ගේ සතුට ළඟ වැඩිපුරම සතුටු වෙන්නේ අම්මලා කියනවනේ. ඒ සතුට මැදින් අපට ආඩම්බරෙන් එහෙම කිව්වේ හැටන්, කොටගල ගමේ පදිංචි හවිෂ්නා දැරියගේ අම්මා තංගවෙල් රේවතී. ඇය කියපු විදියට ඉන්දියාවේ සිට ක්‍රියාත්මක වන 'International Book Of Records' කියන ජාත්‍යන්තර වාර්තා පොතට තමයි හවිෂ්නා මේ වාර්තාව තියලා තියෙන්නේ.

"දුව තරඟයට ඉදිරිපත් වුණේ පහුගිය අප්‍රේල් මාසේ 06 වැනිදා. ඒ බව මුලින් කවුරුත් දැනගෙන හිටියේ නෑ. ඒත් දැන් දවස් කීපයකට කලින් තමයි අපට ඒ වාර්තාවට අදාළ සහතිකයයි පදක්කමයි ලැබුණේ. ඒ එක්කම තමයි මුළු රටක්ම මගේ දුව ගැන දැනගත්තේ."

එතකොට මේක උපතින් ගෙනාපු හැකියාවක්ද? ඒ නැත්නම් මේ දැරියගේ දක්ෂකමද? ඒ තමයි රේවතීගෙන් අපි ඊළඟට අහපු ප්‍රශ්නය.

"මමයි මහත්තයයි දැනගෙන හිටියා අපේ ලොකු දුවට වෙන දරුවන්ට නැති විදියේ මතක ශක්තියක් තියෙනවා කියලා. ඒක දැනගද්දි එයාට අවුරුද්දක් එකහමාරක් විතර ඇති. මං ගුරුවරියක්. සැමියා තැපැල් කාර්යාල සේවකයෙක්. අපි දෙන්නම ජොබ් කරන නිසා දුව අපි ඩේකෙයාර් (දිවා සුරැකුම් මධ්‍යස්ථානය) එකකට දැම්මා. එතැනම නර්සරි (පෙරපාසල) එක තියෙනවා. අපේ දුව කරන්නේ ඩේකෙයාර් එකේ ඉන්න ගමන් නර්සරි එකේ උගන්වන දේවල් අහගෙන ඉන්න එක. ඊටපස්සේ ගෙදර ඇවිත් ඒවා අපට කියනවා. දුවට හොඳ මතකයක් තියෙනවා කියලා අපි දැනගත්තේ එහෙම. ඔය අතරේ දැනගන්න ලැබුණා මේ කිට්ටුවම අවුරුදු දෙළහක පිරිමි දරුවෙක් වාර්තාවක් තියලා කියලා. ඒ ලෝකයේ රටවල්වල ප්‍රධාන නගර මතකෙන් කියලා. පස්සේ මමත් මහත්තයා එක්ක ඒ ගැන ඉන්ටර්නෙට් එකේ හෙව්වා. එහෙම හොයලා තමයි දුව මේ වාර්තාවට උනන්දු කළේ."

ගුරුවරියක් වුණු රේවතීලු ඇගේ දියණියට ලෝක දේශපාලන නායකයෝ ගැන කියලා දුන්නේ. ඒ මතකය එක්ක තමයි හවිෂ්නා දැරියට පුළුවන් වෙලා තියෙන්නේ ලෝක මට්ටමින් අරගත්ත මේ ජයග්‍රහණය ලබාගන්න.



හවිෂ්නා පවුලේ අය සමග



සෙන්තුල් කුමාර් හවිෂ්නා දැරිය

"මට දුව ගැන සතුටුයි. එයා වයසට වඩා දක්ෂ දරුවෙක්. එයා පොඩි කාලේ ඉඳන්ම හැමදේම දිහා අවධානයෙන් බලන්න පුරුදුවෙලා හිටියේ. ගොඩාක් වෙලාවට අපි ලැප්ටොප් එකෙන් එක එක දේවල් බලනකොට එයත් බලාගෙන ඉන්නවා. ඒ බලන් ඉඳලා අපෙන් ප්‍රශ්න අහනවා."

ඒ ආඩම්බරය හවිෂ්නාගේ තාත්තා වෙච්ච සෙන්තුල් කුමාර්ගේ. දරුවෙක් ඉන්න හැම තාත්තෙකුටම වගේ ඔහුත් ඉන්නේ තමන්ගේ දියණිය ගැන මහා ඉහළින් බලාපොරොත්තු තියාගෙන. ඒ හවිෂ්නා හොඳට ඉගෙනගෙන රටට දැයට වැඩදායී දියණියක් වෙනවා දකින්න.

"ලබන අවුරුද්දේ ඉඳන් දුව පෙරපාසල් යනවා. අපිට විශ්වාසයි එයාගේ තියෙන මේ අපූරු හැකියාවත් එක්ක හොඳට ඉගෙනගන හොඳම තැනකට ඒවි කියලා. එහෙම වුණොත් ඒක තමයි අපේ සතුට."

සෙන්තුල් එහෙම කියද්දි අපිට හිතුණොත් හවිෂ්නාට වයසට වඩා තියෙන මතක ශක්තියත් එක්ක අධ්‍යාපනය පැත්තෙන් ලොකු ගමනක් යන්න පුළුවන් වෙයි කියලා. ඉතින් එහෙව් ගමනක් යන්න සුබ පතන ගමන් අපිත් ඔවුන්ට සමුදුන්නා. ඒ සෙන්තුල් කුමාර් හවිෂ්නා පුංචි දුව ලබාගත්ත මේ ජයග්‍රහණයටත් හදවතින්ම සුබපතන ගමන්.

■ රුවන් එස්.සෙනවිරත්න



# ජෙරොම් ඉපදුණේ බිංගෙයක් වගේ තැනක

## පාස්ටර් ජෙරොම් ප්‍රනාන්දුගේ මව පළමු වරට කියයි

**වින්ඩි ප්‍රනාන්දු**
දේවගැති ජෙරොම් ප්‍රනාන්දුගේ මව

**මී**ට මසකට පෙර රටේ ලොකුම ආන්දෝලනාත්මක මාතෘකාව වූයේ දේවගැති ජෙරොම් ප්‍රනාන්දු ය. අප්‍රේල් 30 වැනිදා පැවති දේව මෙහෙයකදී බුදුදහමට අපහාස කළා යැයි ඔහුට චෝදනා නැගුණු අතර ICCPR පනත යටතේ ඔහුව අත්අඩංගුවට ගැනීමට නියෝග නිකුත් වූවත් ඊට පෙර ඔහු රටින් පිටව තිබිණී. අත්අඩංගුවට ගැනීමට පෙර රටින් පිටවීටමට දේවගැති ජෙරොම් ප්‍රනාන්දුට ඉහළ අත්තක සහාය ලැබුණු බව ඇතැම්මු පැවසූ අතර ජෙරොම් ප්‍රනාන්දු ජාත්‍යන්තර ආගමික කණ්ඩායමකින් මෙරටට පැමිණ බෝන් අගේන් ආගම ව්‍යාප්ත කරන්නෙකු බවත් කියැවිණී.

ඉකුත් දිනෙක අපට අසන්නට ලැබුණේ ජෙරොම් ප්‍රනාන්දුගේ මව ගල්කිස්ස ප්‍රදේශයේ ජීවත්වන කාන්තාවක් බවයි. ජෙරොම් ප්‍රනාන්දු උප්පත්ති කතාව පිළිබඳව අසා බලන්නට අපි ජෙරොම්ගේ මව සොයා ගියෙමු. මෙතැන් පටන් මේ ලියැවෙන්නේ ඇය සමඟ කළ කතාබහේ සටහනයි. ඔහුගේ මවගෙන් මේ කතා ඇසුවේ ඔහු නිවැරැදි බව හෝ වැරදි බව අර්ථකථනය කිරීමට නොවේ. ඒවා තම තම නැණ පමණ තේරුම්ගත යුතු කාරණා බවත් සටහන් කරනු කැමැත්තෙමු.





**ජෙරොම්ගේ අම්මගේ නම?**

වින්ඩි ප්‍රනාන්දු.

**පවුලේ කීදෙනෙක් ඉන්නවද?**

මමයි, මහත්තයයි, පුතාලා දෙන්නයි. ජෙරොම් තමයි මගේ ලොකු පුතා.

**ජෙරොම් උපතින්ම ක්‍රිස්තියානිද?**

ඔව්. මගේ මහත්තයයි මමයි දෙන්නම ක්‍රිස්තියානි. ඉතින් පුතාත් උපතින්ම ක්‍රිස්තියානි.

**එතකොට ගෙවල්?**

ගෙවල් ගල්කිස්සේ.

**ජෙරොම් ඉපදුණොත් ගල්කිස්සෙද?**

නැහැ... එයා ඉපදුණේ කරගම්පිටියේ. පොඩි ගෙදරක. ඒ කතාව මම මෙහෙම කියන්නම්කෝ. මගේ අම්මා ගොඩක් පෝසත් කෙනෙක්. තාත්තලට වැඩිය සල්ලි නැහැ. කසාද බැඳලා හිටියේ අම්මලාගේ ගෙවල්වල. මට 16දි මගේ අම්මා නැති වුණා. තාත්තා මාවයි අයියවයි එක්කරගෙන කරගම්පිටිය පැත්තේ ගෙදරකට ගියා. ගෙදරක් කිව්වට ඒක පොළව යටට වෙන්න තිබුණු නිකන් බිංගෙයක් වගේ තැනක්. මම අවුරුදු 21න් කසාද බැන්දා. බැඳලා මමයි හස්බන්ඩ්නුයි හිටියෙත් එහේ. එහෙදි තමයි මට ජෙරොම්ව ලැබුණේ. පස්සේ අපි ගල්කිස්සේ පදිංචියට ආවා.

**ඒ කාලෙත් එතකොට පවුල ආර්ථික අතින් ශක්තිමත් පවුලක්ද?**

මගේ හස්බන්ඩ් සූදුවට ඇබ්බැහි වුණු කෙනෙක්. ඇත්තම කිව්වොත් ජෙරොම්ලා පොඩි කාලේ එයා පවුල ගැන බැලුවේ නැහැ. එයාට ගොඩක් ණය තිබුණා. මගේ අම්මගෙන් ලැබුණු ඉඩකඩම් පවා විකුණලා සූදුවට වියදම් කළා. මහත්තයගේ සූදුව නිසා ඒ කාලේ අපේ ගෙදර ගොඩක් ප්‍රශ්න තිබුණා. සල්ලි ඉල්ලලා නිතරම වගේ මට ගහනවා. හැබැයි මම කවදාවත් ඒ දේවල් පුතාලා දෙන්නට දැනෙන්න දුන්නේ නැහැ. මහත්තයා මට ගහන්න හදනකොටම මම කාමරේට දුවනවා. එතකොට පුතාලා ඒවා දකින්නේ නැහැනේ.

**ඉතින් ඊටපස්සේ?**

ජෙරොම් පුතා ඉගෙනගත්තේ ශාන්ත පීතර විද්‍යාලයෙන්. මම දරුවන්ට උගන්වන්න වගේම කන්න බොන්න දෙන්නත් ගොඩක් මහන්සි වුණා. අද කන්න දුන්නහම ඊළඟ දවසේ කන්න දෙන්නේ මොනවද කියන එකයි මට තිබුණු ප්‍රශ්නේ. සමහරදාට මගේ ඇඳුම් විකුණලා දරුවන්ට කන්න බොන්න දුන්නු දවසුත් තිබුණා.

> **මම දරුවන්ට උගන්වන්න වගේම කන්න බොන්න දෙන්නත් ගොඩක් මහන්සි වුණා. අද කන්න දුන්නහම ඊළඟ දවසේ කන්න දෙන්නේ මොනවද කියන එකයි මට තිබුණු ප්‍රශ්නේ. සමහරදාට මගේ ඇඳුම් විකුණලා දරුවන්ට කන්න බොන්න දුන්නු දවසුත් තිබුණා**

**එතකොට ඔය කියන කාලේ 'බෝර්න් අගේන්' ආගම ඇදහුවේ නැද්ද?**

බෝර්න් අගේන් කියන්නේ ආගමක් නෙමෙයි. ඒක නැවත නැගිටීමක්. ඒක බයිබලේ තුන්වැනි පරිච්ඡේදයේ තියෙනවා. බහුතරයක් කිතුණුවෝ ආගම අදහන්නේ චාරිත්‍රයක් විදියට. ඒ අයට ජේසුස් වහන්සේව පේන්නේ නැහැ. හැබැයි දවසක් එනවා එදාට අපිට ජේසුව පේන්න දැනෙන්න ගන්නවා. අපේ ජීවිතේ එකම ගැලවුම්කරු ජේසු කියලා පිළිගන්න ඒ දවසට තමයි බෝර්න් අගේන් කියන්නේ.

**හරි එතකොට ඔය කියන කාලේ ජෙරොම්ගේ අම්මා ජේසුව පිළිඅරන්ද තිබුණේ?**

මට ජෙරොම් ලැබුණේ 22න්. ඒ වෙනකනුත් මට ජේසුව දැනිලා තිබුණේ නැහැ. දවසක් මම කෙනෙක්ගේ කීමක් අහක දාන්න බැරිකමට පාස්ටර් කෙනෙක් කරන ප්‍රේයර් මීටින් එකකට ගියා. එදා තමයි මට දෙවියන් දැනුණේ. එතකොට ජෙරොම්ට අවුරුද්දයි. එදා ඉඳලා මම 'Assemblies of god' පල්ලියේ දේව මෙහෙයන්වලට ගියා. හැබැයි මගේ හස්බන්ඩ් කවදාවත් දෙවියෝ විශ්වාස කළේ නැහැ. එයා දවසක් මගේ බයිබලේ බලුකූඩුවට විසි කළා.

**එතකොට ජෙරම් දෙවියන් වහන්සේව විශ්වාස කළා?**

ඔව්. පුංචි කාලේදි අසනීපයක් හැදුනත් එයා අඬන්නේ 'දෙවියන්ට කියන්න අම්මා' කියලා. දෙවියන්වහන්සේ අපිව ගොඩක් පරීක්ෂා කළා. මගේ පවුලට ප්‍රශ්න ගොඩක් ආවා. ඔය වෙද්දි මගේ අයියා හිටියේ එංගලන්තේ. එයා මාව එහෙට ගෙන්වගෙන හොයා ඩ්‍රෙසින් ඉගැන්නුවා. මාස තුනකින් ලංකාවට ඇවිල්ලා මම හෙයා ඩ්‍රෙසින් කරන්න පටන්ගත්තා. ඒ කරලා තමයි දරුවන්ට කන්න බොන්න දුන්නේ. ඒ වැඩත් ඉතින් හැමදාම නැහැනේ. ඊළඟ දවසේ බබාලට කන්න නැතිවෙයි කියලා දවසක් මම ගොඩක් දුකින් ඉන්න වෙලාවක ජෙරොම් මගේ ළඟට ඇවිල්ලා 'අද හවසට ලේඩි කෙනෙක් ඇවිල්ලා සල්ලි දෙනවා අම්මා' කියලා මට කිව්වා. කිව්වා වගේම එදා ලේඩි කෙනෙක් ආවා. ජෙරොම්ට ජේසුගේ බැල්ම තියෙනවා කියලා මම මුලින්ම දැනගත්තේ එදා.

**එතකොට ජෙරොම් පාස්ටර් කෙනෙක් වුණේ කොහොමද?**

ජේසුස් මගේ ගෙදර පල්ලියක් කරන්න යනවා කියලා දවස් දෙකක් පාස්ටර්ස්ලා දෙන්නෙක් මට කිව්වා. මගේ හස්බන්ඩ් දෙවියන් විශ්වාස කළේ නැහැනේ. ඉතින් ඒක කොහොම වෙයිද කියලා මට තේරුමක් තිබුණේ නැහැ. මට හස්බන්ඩ්ව දික්කසාද කරන්න උවමනාවක් තිබුණොත් නැහැ. මොකද දික්කසාදයකට දෙවියන් විරුද්ධයි. හැබැයි මගේ ගෙදර පල්ලියක් කරන්න දෙවියන්ට ප්ලෑන් එකක් ඇති කියලා මම දැනගෙන හිටියා. ඔය අතරේ මගේ තාත්තයි අයියයි දෙන්නත් නැති වුණා. ඒ විතරක් නෙමෙයි මගේ ඇඟේ සුදුකබර හැදෙන්න ගත්තා. මම රූපය ගැන ගොඩක් හිතන කෙනෙක්. ඩොක්ටර්ස්ලා පස්දෙනෙක්ගෙන් බෙහෙත් කළත් මට සුවවුණේ නැහැ. මම

ගොඩක් මානසිකව වැටුණා. එතකොට ජෙරොම්ට 16යි. එදා තමයි එයා ආලේප වුණ දවස.

**සමාවෙන්න... ආලේප වුණා කිව්වේ මොකක්ද?**

පාස්ටර් කෙනෙක් හරහා දෙවියන් ඇවිල්ලා අපේ ඇඟට අත තියනවා. එතකොට අපි අවට යක්ෂයෝ මෙල්ල වෙනවා. පාස්ටර් කෙනෙක් අත තිබ්බහම මිනිස්සු ඇදගෙන වැටෙන්නේ එතකොටයි. ජෙරොම් ආලේප වුණේ 16දී. එයා එදා බිම වැටිලා පැය 4ක් අඬලා. දෙන්නෙක් පුතාව දෙපැත්තෙන් අල්ලන් ගෙදර එක්කරගෙන ආවා. 'අම්මා ජේසු ඔයාව හොඳ කරන්න යන්නේ... තාත්තා ජේසුව විශ්වාස කරන්නත් පටන්ගන්නවා' කියලා එවෙලේ මගේ ඔලුවට අත තියලා පුතා කිව්වා. ඔය කාලේ හස්බන්ඩ් හිටියේ රට. ඔය සිද්ධිය වෙලා සතියක් ගියේ නැහැ හස්බන්ඩ්ගේ ජොබ් එක නැතිවෙලා එයා ලංකාවට ආවා. පස්සේ මම නිකමට වගේ එයාට ප්‍රේයර් මීටින් එකකට යමුද ඇහුවා. කවදාවත් දෙවියෝ විශ්වාස නොකරපු මනුස්සයා එදා ඒකට කැමති වුණා. දවසින් දවස එයා දෙවියන් විශ්වාස කළා. ඒ වගේම මාවත් සුවවුණා. මගේ ලෙඩේ හොඳ වෙනවා ගමේ මිනිස්සු ඇස් දෙකෙන් දැක්කා. ඒ දැකලා එයාලත් එයාලගේ ලෙඩ දුක් කියන්න අපේ ගෙදර ආවා. ඒ හැමෝටමත් සුව වුණා. එතකොට අපිට පාස්ටර් කෙනෙක් හිටියා. ඒ පාස්ටර් නැති දවසට දේශනාව කළේ ජෙරම්. එතකොටත් එයා ඉස්කෝලේ යන දරුවෙක්.

**ඊටපස්සේ...?**

පස්සේ දවසින් දවස අපේ ගෙදරට සෙනඟ පිරෙන්න ගත්තා. අපේ ගේ හරි පුංචියි. ඉඩක් නැති තරම් සෙනඟ. සුදුවට සල්ලි වියදම් කරපු මගේ මහත්තයා ඊටපස්සේ සල්ලි වියදම් කළේ දේශන ශාලා හදන්න. ජෙරොම් පුතාගේ මුත්තා මොරටුමුල්ලේ පල්ලියක් හදලා තියෙනවා. ඒක අවුරුදු 100කට වඩා පරණයි. අපිට ඒ ආභාෂත් තිබුණා. ඩුබායිවල



**පුංචි කාලේදී අසනීපයක් හැදුනත් එයා අඬන්නේ 'දෙවියන්ට කියන්න අම්මා' කියලා. දෙවියන්වහන්සේ අපිව ගොඩක් පරීක්ෂා කළා.**

මහත්තයගේ මල්ලි අඳුනන පාස්ටර් කෙනෙක් හිටියා. අපිට සෙනඟ වැඩිවෙද්දි අපි ඒ අයව ඒ පාස්ටර්ට බාරදුන්නා. අපි හතරදෙනාත් ඩුබායි ගියා. එහෙදි ජෙරොම් පුතා පාස්ටර් කෙනෙක් විදියට ආලේප වුණා. එයා එතැනදි කරපු දේශනයක් දැකලා එහේ අය එයාට එහේ සභාවක් බාරගන්න කිව්වා. ඒත් එදා ඉඳලා පුතා කැමති වුණේ ලංකාවට සේවය කරන්න.

**එතකොට ජෙරොම්ට දස් ගණන් සෙනඟ එන්න පටන්ගත්තේ කොහොමද?**

දෙවියන් වහන්සේ සුබ ආරංචිය පතුරවන්න ජෙරොම්ව පාවිච්චි කරනවා. එයා ගොඩක් දක්ෂයි. ඒ නිසා එයාට සෙනඟ හැදුනා. ලංකාවේ විතරක් නෙමේ වෙන වෙන රටවල මිනිස්සු ලක්ෂ ගණන් එයාට ප්‍රේම කරනවා.

**එතකොට හොඳ කරන්නම බැහැයි කියපු ලෙඩ එහෙමත් ජෙරොම් හොඳ කරලා තියෙනවද?**

කොච්චර තියෙනවද? ලක්ෂ ගණන් මිනිස්සුන්ව සුව කරලා තියෙනවා. දවසක් කිහිලිකරුවලින් ලේඩි කෙනෙක් ආවා. එයාට තිබුණේ ලූපස් කියලා ලෙඩක්. ඒ ලෙඩේ හොඳ කරන්න බැහැ කියලා ඒ වනකොටත් ඇඟ පුරා පැතිරිලා තිබුණේ. පුතා එක දවසින් එයාව හොඳ කළා. අපිට වෛද්‍ය වාර්තා වුණත් පෙන්වන්න පුළුවන්. දවසක් දරුවෙක්ගේ උගුරේ හිරවුණු ලේ ගෙඩියක් අතටම අරන් දුන්නා. ඒවා ජෙරොම්ගේ නෙමේ ජේසුගේ හාස්කම්.

**ඔය වැඩවලට ජෙරොම්ට ගොඩක් සල්ලි හම්බෙනවා නේද?**

මිනිස්සු සල්ලි දෙන්නේ ජෙරොම්ට නෙමෙයි. ජේසුස් වහන්සේට. අපි හම්බකරන දෙයින් දහයෙන් පංගුවක් (10%)ක් දෙවියන් වහන්සේට දෙන්න කියලා බයිබලේ දහවැනි පරිච්ඡේදයේ තියෙනවා. දෙවියන් වහන්සේව පරීක්ෂා කරන්න තියෙන හොඳම ක්‍රමේ සල්ලි දෙන එක. එතකොට ඒ වගේ වැඩි ගුණයක් ආශිර්වාදය ලැබෙනවා. දන්න අය ඒක දන්නවා. ලෝකය පුරාම සුබාරංචිය පතුරවන්න කියලා දෙවියන් කියලා තියෙනවා. මුදල් නැතිව ඒ වැඩේ කරන්නේ කොහොමද?

**හැබැයි මිනිස්සු කියන්නේ දෙවියන්ගේ සල්ලිවලින් ජෙරොම් කෝටිපතියෙක් වෙලා කියලා නේද?**

එහෙම කියන්නේ නොදන්න අය. කසාද බඳිද්දි ජෙරොම්ගේ අතේ තිබුණේ රුපියල් 40,000යි.එයා ඒකෙනුත් 20,000ක් දෙවියන්ට වෙන්කළා. ජෙරොම් කියන්නේ එහෙම කෙනෙක්. ඔය කියන තරම් වත්කමක් එයාට නැහැ. දැන් ඒවා ඔප්පු වෙලා ඉවරයි. අනික ලැබෙන මුදල්වලින් වුණත් ජෙරොම් කරන්නේ අනුන්ට දෙන එක. පාරේ ටිකට් අම්මා කෙනෙක් හිටියොත් ටිකට් ටික සේරම අරන් ඊට වඩා ලොකු මුදලක් දෙනවා. අනුන්ට දන්දෙන එක තමයි එයාගේ සතුට.

**එතකොට අනිත් ආගම්වලට අපහාස කරන්න කියලා දෙවියෝ කියලා තියෙනවද? ජෙරොම් කීපතැනකම බුද්ධාගමට විරුද්ධව කතා කරලා තියෙනවනේ?**

කවදාවත් නැහැ. එයා එදාත් ඔය කිව්වේ බයිබලේ තියෙන දෙයක්. ඒ කතාව කියලා අනිත් පැත්තට කිසිම ආගමකට අපහාස කරන අදහසක් නැහැ කියලාත් කියනවා. ඒක කවුරුත් කියන්නේ නැහැ. පුතා ගොඩක්ම උදව් කරන්නේ සිංහල ඉස්කෝලවල දරුවන්ට. මුස්ලිම්, හින්දු හැමෝටම උදව් කරනවා. එයාගේ හිතේ ආගම් බේදයක් නැහැ.

**වරදක් කරේ නැත්නම් රටින් ගියේ?**

ජෙරොම්ට එක එක රටවලින් දවස ගාණේ ආරාධනා එනවා. පිටරට යන එන එක එයාගේ දින චරියාව වගෙයි. ඔය සිද්ධිය වෙද්දිත් පුතා දේශනයකට සිංගප්පූරුවට යන්න සිද්ධිය වෙන්න කලින් සතියෙම ටිකට් අරන් තිබුණේ. ඒවා ලෝයර්ලා ඔප්පු කළා. ඉඳලා ඉඳලා සිංගප්පූරු ගියාට පහුවෙනිදා තමයි පුතාට ගමන් තහනමක් දැම්මේ.

**දැන් එතකොට ජෙරොම් කොහෙද ඉන්නේ? ආයේ ලංකාවට එන්නේ නැද්ද?**

එයා සිංගප්පූරුවේ දේශන කරලා එංගලන්තෙට ගියා. එහේ දේශනවලට. එහේ ඉඳගෙනත් ලංකාව වෙනුවෙන් ප්‍රේ කරනවා. ඒ වැඩ ටික ඉවර වුණු ගමන් ආයේ ලංකාට එනවා. මේක තමයි එයාගේ රට. මේ රටේ මිනිස්සු වෙනුවෙන් දෙවියන්ට ප්‍රේ කරලා ජෙරොම්ගේ දණිස් කළුවෙලා තියෙන්නේ. එයා අනුන්ගෙන් දුක් තමන්ගේ කරට ගන්න කෙනෙක්. මේ වෙන දේවල් ගැන එයා පොඩ්ඩක්වත් කලබල වුණේ නැහැ. මොකද ජේසුට එයා ගැන සැලසුමක් තියෙනවා කියලා ජෙරොම් දන්නවා.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි


# ආතරයිටිස් රෝගයට විශේෂ ප්‍රතිකාර

අවුරුදු 50ක පළපුරුදු වෛද්‍යවරයෙක් හමුවී ඔබගේ රෝගය සුවකර ගන්න.
G.T.C. ඖෂධ ශාලාව ජා ඇල
අවුරුදු 50 ක් එකම ස්ථානයක පවත්වාගෙන යාම විශේෂයි....
(දේශීය, ආයුර්වේද, හෝමියෝපති) **ආතරයිටිස් රෝගයට විශේෂ ප්‍රතිකාර**

සන්ධිවාත හෙවත් ඔස්ටියෝ සන්ධි ප්‍රදාහය, ශරීරයේ සියලුම සන්ධි ආබාධවලට ප්‍රතිකාර, පටක ගෙවීයාම, දණහිස්, උකුල හා ඇගිලිවල සන්ධි ප්‍රදාහය, උරහිසේ හා කොන්දේ කැක්කුම, සන්ධි නැවීමට නොහැකිවීම, සියලුම සන්ධි ආබාධ, සන්ධිවල පටක ඉදිමීම හා ගෙවීම් වලට සුවය ලබා ගැනීමට ...

**පොතු කබර, සුදු කබර, දද, කුෂ්ඨ, අර්ශස් රෝග පරණ තුවාල, ලප කැලල් ඇතුලු සමේ රෝග සඳහා ප්‍රතිකාර**

ස්ත්‍රී පුරුෂ සියලුම ලිංගික දුර්වලතා හා සමාජ රෝග සඳහා ප්‍රතිකාර
දරුපල නොමැති අයට විශේෂ ප්‍රතිකාර

**විශේෂ නිවේදනයයි.....**
**කිසිම සුදුසුකමක් නැති ස්ථාන වලට පැමිණ ප්‍රතිකාර කරන අයගෙන් ප්‍රවේශම්වන්න.....**
**දුවනගිරි ඩිස්පැන්සරි සහ වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ගෙන මුදලත් රෝගයත් සුව නොවේ.....**
**ඔබ ලබා දෙන මුදලට රිසිට්පතක් සහ ඖෂධයන් සඳහන් ලේඛණයක්ද ලබා ගත යුතුය....**

ජා - ඇල දුම්රියපළට ඇතුලු වන දොරටුවට දකුණු පසින් GTC වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටා ඇත.
දුර බැහැර සිට පැමිණේ නම් කලින් වේලාවක් වෙන් කර ගන්න.

ඔබට ගැටලුවක් ඇති ඕනෑම රෝගයක් පිළිබඳ අපෙන් විමසන්න.
දුරකථන මඟින් වේලාවක් වෙන් කරවා ගන්න.
දුක: 077 399 5134 / 0112236250 / 0722 265 099
ෆැක්ස් : 0112241313 / ඊමේල්: sdperera9@gmail.com

# ආතරයිටිස් රෝගයෙන් මිදිමට..

**පරපුරෙන් පරපුරට රැගෙන ආ වලව්වත්ත වෙද පරපුරේ**

**මහා සන්ධිජීව අමෘත තෛලය.**

මෙම තෛලයට සමකළ තෛලයක් මිහිපිට නැත. මෙය පාවිච්චි කර වෙනස වටහා ගන්න. මෙය වේදනා නාශකයක් නොවේ. අද සමාජයේ එක් එක් නම්වලින් තෙල් වර්ග වෙළඳ පොලට හඳුන්වාදී ඇත. ඔබ එම තෙල් වර්ග ආලේප කර බලාපොරොත්තු සුන්කර ගෙන ඇත. අදම ඔබ මහා සන්ධිජීව අමෘත තෛලයේ වෙනස වටහා ගන්න.

**මෙය භාවිතා කිරීමෙන්**
**කොන්ද කැක්කුම, මාංශ පේශි කැක්කුම, කෙණ්ඩා පෙරලිම, දණහිස් කැක්කුම සහ ඉදිම්ම, ආතරයිටිස්, ඇඟිලි අත්පා හිරිවැටීම, හන්දිපත් වේදනාව, තැලිම්, ඉදිමීම, උලුක්කුවිම්, නිදි උලුක්කු, නහරගත වේදනා, අංශභාග, වාත, ස්නායු දූබලතාවයෙන් හටගන්නා සියලුම වේදනා කැක්කුම් සදහා ආලේපකිරීමෙන් ස්ථිර සුවයක් ලබාදෙනු ඇත.**




**මෙම තෛලය ලබා ගැනිමට:**
පහත ගිණුම් අංකයට මුදල් තැන්පත් කර WhatsApp හරහා දැනුම් දෙන්න.

Account Name: G.T.C Drugs lanka
Commercial Bank (Ja ela)
Account Number : 181-0000-531

මිල රු. 1500/- 30 ml

**077 399 5134** (WhatsApp)

**නිෂ්පාදනය හා බෙදාහැරීම**
**ජී.ටී.සී ඖෂධ ලංකා සමාගම, නො 14, ජා ඇල.**
**0773995134/ 0112236250/ 0112241312**

බෙදා හැරීමේ ගාස්තුව රු. 450/-

# අම්මා දුකෙන් ඉන්නවා දැක්කම මට ජාත්‍යන්තර පාසලක් දාන්න හිතුණා

කොයි කවුරුත් මොන්ටිසෝරි ගිහිල්ලා තිබ්බට 'මොන්ටිසෝරි' කියන වචනේ පිටිපස්සේ තියෙන කතාව දන්න උදවිය බොහොම අඩුයි. 1870 දී ඉතාලියේ මරියා මොන්ටිසෝරි කියලා දැරිවියක් ඉපදුණා. පුංචි කාලෙ ඉඳලම ඇයට ලෝකේ ගැන තිබුණේ ලොකු කුතුහලයක්. ටික ටික ලොකු වෙද්දි ඇගේ දැනුම් පිපාසෙ වැඩි වුණා මිසක අඩු වුණේ නෑ. හැත්තෑව දශකය කියන්නේ යුරෝපයේ පුරුෂාධිපත්‍ය වැඩිම කාලයක්. ඔය කාලේ ගැහැනු දරුවෙකුට ඉගෙනගන්නවා කියන්නේ කටු ගහක නගිනවට වඩා හපන් වැඩක්. ඒත් මිස් මොන්ටිසෝරි කොහොම හරි තාක්ෂණ ඉස්කෝලෙකට ඇතුළු වුණා. පිරිමි ළමයි විතරක් ඉගෙනගන්න තාක්ෂණ පාසලකට ඇතුළුවුණු පළවැනි කාන්තාව ඇය. මහා දැනුමක් එක්කාසු කරගත්තු මොන්ටිසෝරි ඉතාලියේ පළමු වෛද්‍යවරිය වුණා. පුංචි දරුවන්ගේ මනස අධ්‍යයනය කරලා ඊට ගැළපෙන අධ්‍යාපනය ක්‍රමයක් නිර්මාණය කරලා 1907දී රෝමයේ 'මොන්ටිසෝරි' කියලා අධ්‍යාපන ආයතනයක් විවෘත කළා. ඒක තමයි ලෝකේ පළවැනි මොන්ටිසෝරිය. කෙටියෙන් කිව්වට ඇගේ කතාව ඇතුළේ කැපකිරීම්, අභියෝග කොච්චර නම් තියෙන්න ඇතිද? ඒ කැපකිරීම්වල ප්‍රතිඵල අදටත් ලෝකෙ පුරා දරුවෝ විඳිනවා.

මාරියාගේ කතාව පූර්වාදර්ශ කරගත්තේ කැපවීම, නොපසුබට උත්සාහය නිසා අපේ රටේ ජාත්‍යන්තර පාසල් ක්ෂේත්‍රයේ වෙනසක් කරපු තරුණ කාන්තාවක් ගැන කියන්න. ඇයත් මාරියා වගේම දැනුම් පිපාසයෙන් විවිධ ක්ෂේත්‍රවල දැනුම හොයාගෙන ඒ හරහා සාර්ථකත්වයට පත්වුණු අයෙක්. අද 'ධරණී' කවරය හැඩකරන ඇය දේවින්දි සංජයා මුදන්නායක. ෆෝකස් ජාත්‍යන්තර පාසල් ජාලයේ සහ ඇකඩමි ජාලයේ නිර්මාතෘවරිය සහ හිමිකාරිය ඇයයි. අද බොහොම සාර්ථක කාන්තාවක් වුණත් ඇගේ කතාව පටන් අරගෙන තියෙන්නේ පුංචි රුපියල් 250කින් කියලයි දේවින්දි අපිත් එක්ක කිව්වේ.

**"මගේ ගම මාතලේ. මම අපේ පවුලේ එකම දරුවා. මගේ අම්මා කොළඹ. තාත්තා මාතලේ. කසාද බැඳලා අම්මත් මාතලේට ඇවිල්ලා. මාව ලැබිලා ටික කාලයක් යද්දි ගෙදර නිකන් ඉන්න බැහැ කියලා අම්මා ජොබ් එකක් හොයන්න අරන්."**

මුලින්ම ලංකාවේ ජාත්‍යන්තර පාසලක් ආරම්භ වුණේ 1980දී. ඊටපස්සේ කාලයත් එක්ක කොළඹ අවට ජාත්‍යන්තර පාසල් කීපයක් විවෘත වුණා. හැබැයි ඔය කාලේ වෙද්දිත් මාතලේ නගරේ ජාත්‍යන්තර පාසල් තිබ්ලා නැහැ.

"පළවැනි වතාවට මාතලේ ජාත්‍යන්තර පාසලක් අරින්න යනවා කියලා අම්මට ආරංචි වෙලා. පස්සේ අම්මා ඉන්ටවීව් එහෙම පාස් කරලා ඒ ඉස්කෝලේ ගුරුවරියක් විදියට වැඩ කරන්න අරන්. මට මතක ඇති කාලේ ඉඳලා අම්මා මාවත් ඉතින් ඉස්කෝලෙට එක්කරගෙන යනවා."

ඔය කියන ජාත්‍යන්තර පාසලෙන්ම පෙරපාසල් අධ්‍යාපනය හැදෑරුව දේවින්දි උසස් අධ්‍යාපනය හැදෑරුවේ මාතලේ ශ්‍රී සංඝමිත්තා ජාතික පාසලෙන්ලු.

"අම්මා ඉන්ටර්නැෂනල් ස්කූල් ටීචර් කෙනෙක් කියලා අපේ ගෙදර ඉංග්‍රීසි කතා කරන පරිසරයක් තිබුණේ නැහැ. හැබැයි පුංචි කාලේ ඉඳලම ඉංග්‍රීසි භාෂාවට මම ගොඩක් කැමතියි. කොහේහරි තැනකට ගියත් ඉංග්‍රීසියෙන් කතා කරන්න තමයි මම කැමති. කොහොමහරි ඉතින් ඒ ආසාව නිසාම ඉසකෝලේ ඉංග්‍රීසි මාධ්‍ය පංතිවලටත් මාව තේරුණා. ඉස්කෝලෙ යන කාලේ ඉංග්‍රීසි භාෂා සමස්ත ලංකා තරඟවලින් ජයග්‍රහණ පවා ලබාගෙන තියෙනවා."

**දේවින්දි සංජයා මුදන්නායක**
**(ශ්‍රී ලංකාවේ ලාබාලතම ජාත්‍යන්තර පාසල් නිර්මාතෘවරිය සහ හිමිකාරිනිය)**



දේවින්දි උසස් පෙළ සඳහා තෝරගෙන තියෙන්නෙත් භාෂා විෂයන්. උසස් පෙළ හොඳින් සමත් වුණු ඇයට කැලණිය විශ්වවිද්‍යාලයට උසස් අධ්‍යාපන වරම් ලැබුණාලු.

"දවසක් ඉස්කෝලේ නාට්‍යකට රඟපෑවට මට රුපියල් 250ක් ලැබුණා. එතකොට මම හුඟාක් පුංචියි. ඒක තමයි මම මුලින්ම හම්බකළ මුදල. ඒ මුදල තවත් වැඩි කරගෙන මගේම ව්‍යාපාරයක් පටන්ගන්නවා කියලා හිතුවේ එදා. මගේම දෙයක් කරන හීනේ හිටපු නිසා කැම්පස් තේරුණත් මම කැම්පස් ගියේ නැහැ. රැකියාවක් කරලා සල්ලි ටිකක් එකතු කරගන්නයි මට ඕන වුණේ."

ඒ තීරණය එක්ක දේවින්දි උසස් පෙළ කරලා රැකියාවකට කොළඹට ආවලු.

"මට දුරකතන ජාලයක පාරිභෝගික සේවා නිලධාරිනියක් විදියට රැකියාවක් ලැබුණා. පස්සේ කොළඹ අම්මගේ මහගෙදර ඇවිල්ලා නතර වුණා. මම කොළඹ එනවට තාත්තගේ කැමැත්තක් තිබුණෙම නැහැ. තනි දරුවා විදියට අම්මගෙයි තාත්තගෙයි රැකවරණය මැද හැදිලා කොළඹ තනියම ඉන්න එක මටත් දැනුණේ පිටරටක තනිවුණා වගේ. ඒත් මට මගේ අරමුණ ඊට වඩා වැදගත් වුණා. රස්සාව කරන ගමන් නීතිඥ විෂය හැදෑරුවා. මනෝ විද්‍යා උපාධියක් කළා. ඒ අතරෙම කොළඹ අවුරුදු කීපයක් වැඩ කරලා සෑහෙන මුදලක් එකතු කරගත්තා."

මුදල් එකතු කරගත්තත් පටන්ගන්න ඕන වැඩේ මොකක්ද කියන එක ගැන දේවින්දිට හරි අදහසක් තිබුණේ නැතිලු.

**"නිවාඩුවට ගෙදර ගියපු වෙලාවක තාත්තා මට ආයේ කොළඹ යන්න දුන්නේ නැහැ. ගමේ ඉඳන් මොකක් හරි පටන්ගන්න කියලයි කිව්වේ. තාත්තගේ ඉල්ලීම අහක දන්න බැරි තැන මම මාතලේ නතර වුණා. පටන්ගන්න ඕනේ මොකක්ද කියලා ඒත් මට හරි අදහසක් තිබුණේ නැහැ. එහෙමයි කියලා නිකන් ඉන්නත් බැහනේ. ඒ නිසා මම ඉංග්‍රිසි පංතියක් කරන්න ගත්තා. ගේ ඉස්සරහා ලොකු බැනර් එකක් එහෙම ගහලයි වැඩේ පටන්ගත්තේ. පළවැනි දවසේ එක ළමයයි හිටියේ. ඔහොම යද්දි එක්කෙනා දෙන්නා ළමයි පහක් හැදුනා. ඔය අතරේ රාජ්‍ය ව්‍යාපෘතියකට පරිපාලකවරියක් ඉල්ලලා තිබුණා. මම ඒකටත් අයැදුම් කළා. 2015දී මට ඒ රැකියාව ලැබුණා. ඒ ව්‍යාපෘතියේ ලේකම්වරියක් විදියට අදටත් මම වැඩ කරනවා."**

**නිවාඩුවට ගෙදර ගියපු වෙලාවක තාත්තා මට ආයේ කොළඹ යන්න දුන්නේ නැහැ**

රජයේ රැකියාවක් ලැබුණාය කියලා දේවින්දි අර ළමයි පස්දෙනාට උගන්වන එක නතර කළේත් නැතිලු.

"ඔය අතරේ මෙහෙම සිදුවීමක් වුණා. අපේ පැත්තේ ඉස්කෝලෙක ඉංග්‍රීසි ගුරුවරියක් සාමාන්‍ය පෙළ පංතියේ ළමයි අටදෙනෙක්ව ඉංග්‍රීසි බැහැ කියලා පංතියෙන් එළියට දාලා. ඒ ඉස්කෝලෙම තවත් ගුරුවරියක් ඕක දැකලා. එහෙම දරුවෝ අටදෙනෙක් ඉන්නවා පුළුවන් නම් ගොඩදාලා දෙන්න කියලා මට ඇවිල්ලා කිව්වා.

බලනකොට බොහොම දුප්පත් දරුවෝ ටිකක්. ඒ දරුවන්ට සාමාන්‍ය පෙළට තිබුණේ මාස දෙකයි. මම මගේ උපරිම උත්සාහයෙන් ඒ දරුවන්ට නොමිලේම ඉගැන්නුවා. දරුවෝ අටදෙනාටම ක්‍රෙඩිට් පාස් තිබුණා. මූලික දැනුමක් නොතිබුණු දරුවෝ අටදෙනා ක්‍රෙඩිට් පාස් ගත්තු එක හැමෝටම පුදුමයක් වුණා. එතැනිනුත් මට හොඳ නමක් හැදුනා."

ඔය අතරේ දේවින්දිගේ අම්මා අවුරුදු 27ක සේවා කාලයෙන් විශ්‍රාම යන්න දින ළංවුණාලු.

"අවුරුදු 27ක් උගන්වලා විශ්‍රාම යන්න අම්මට ගොඩක් දුකයි. අම්මා ගොඩක් දුකෙන් ඉන්නේ කියලා මට තේරුණා. ඒ නිසා 'අම්මේ අපි ඉන්ටර්නැෂනල් ස්කූල් එකක් පටන්ගමුද?' කියලා මම අම්මගෙන් නිකමට වගේ ඇහුවා. ජාත්‍යන්තර පාසලක් පටන්ගන්න ලොකු මුදලක් යනවා. ඉතින් ඒක ලේසි වැඩක් නෙමෙයි කියලයි එවෙලේ අම්මා කිව්වේ. මගේ අතේ ඉතිරි වෙලා තිබුණු මුදලින් අම්මට ඉස්කෝලයක් දාලා දෙන්න පුළුවන් නේද කියලා එවෙලේ තමයි මට හිතුණේ."

ඕක කරන්න බැරි වැඩක් කියලා බහුතරයක් දෙනා කියද්දි හරියන්න හරි වැරදෙන්න හරි මේ වැඩේ කරලා බලන්න ඕනේ කියලා දේවින්දි හිතුවේ අම්මගේ සතුට වෙනුවෙන්ලු. ඒ වැඩේ පටන්ගන්න ඇගේ අතේ තිබිලා තියෙන්නේ ලක්ෂ පහළොවක වගේ මුදලක්.

"අපි හිටියේ අපේ තාත්තගේ මහගෙදර කිව්වනේ. අපේ ගෙදර පරණ වලව් තාලෙට හදපු ගෙදරක්. වත්තේ එහෙමත් ලොකු ඉඩක් තියෙනවා. අපි මුලින්ම ජාත්‍යන්තර පෙර පාසලක් පටන්ගන්නවා කියලා ගේ






ඉස්සරහා ලොකු බෝඩ් එකක් ගහලා කට්ටිය දැනුවත් කළා. ෆේස්බුක් එකෙත් විස්තර දැම්මා. අම්මා අවුරුදු 27ක පළපුරුදු ගුරුවරියක් නිසා අම්මට හැඳුනු පිරිසකුත් හිටියා."

ෆෝකස් ජාත්‍යන්තර පෙරපාසලේ මුල්ම දවස 2019 ජනවාරි 2 වැනිදා. එදා පළවැනි දවසෙම පෙරපාසලට දරුවෝ 47ක් ඇවිල්ලා හිටියලු.

**"පස්සේ දරුවෝ එකසිය ගාණක් හැදුනා. පාසලේ විදුහල්පතිනිය අම්මා. අම්මටයි මටයි අමතරව තවත් පළපුරුදු ගුරුවරු දෙන්නෙක් බඳවාගත්තා. බබාලා බලාගන්න නැනී අම්මලා එහෙමත් සේවයට ගත්තා."**

2020දී ජාත්‍යන්තර පෙරපාසල් දරුවන්වම පළවැනි වසරට ඇතුළත් කරලා තමයි ජාත්‍යන්තර පාසල පටන් අරන් තියෙන්නේ.

"මේ වෙනකොට අපේ ඉස්කෝලේ පහේ පංතියට වෙනකල් උගන්වනවා. දවසෙන් දවස ලැබුව සාර්ථකත්වය එක්ක කුරුණෑගලත් ජාත්‍යන්තර පාසලක් ආරම්භ කළා. මාතලේ ශාඛාවේ දැන් ගුරුවරු 35ක් ඉන්නවා. දරුවන්ට විෂය නිර්දේශ අනුව සියලුම විෂයන් උගන්වනවට අමතරව ක්‍රීඩා, පරිගණක ඇතුළු බාහිර ක්‍රියාකාරකම් සේරමත් කරනවා."

ෆෝකස් ජාත්‍යන්තර පාසල්වලට අමතරව ෆෝකස් ජාත්‍යන්තර පෙරපාසල, ඉංග්‍රීසි ඇකඩමිය, නර්තන ඇකඩමිය සහ ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනයත් ආරම්භ කරලා තියෙනවා.

**"කුරුණෑගල උසස් අධ්‍යාපන ආයතනයේ දරුවෝ 50ක් විතර ඉගෙනගන්නවා. අපේ සියලුම අධ්‍යාපන ආයතනවල ඉන්නේ උපාධිධාරී ගුරුවරු. අපි දරුවන්ට වගේම ගුරුවරුන්වත් අධීක්ෂණය කරනවා. අපිට ඉන්නේ බොහොම ආදරණීය ගුරු පිරිසක්. දරුවොත් ඒ අයට ගොඩක් ආදරෙයි."**

මේ සියලුම අධ්‍යාපන ආයතන ක්‍රියාත්මක වෙන්නේ අධ්‍යාපන අමාත්‍යංශයේ අධීක්ෂණය යටතේ. පටන් අරගෙන වැඩි කාලයක් ගතවෙන්න මත්තෙන් ඒ කියන්නේ 2020 මධ්‍යම පළාතේ හොඳම පාසලට හිමි රාජ්‍ය සම්මානය දිනාගන්න ෆෝකස් ජාත්‍යන්තර පාසලට පුළුවන් වෙලා. ඒ වගේම මාතලේ තියෙන රාජ්‍ය තරු සම්මානයෙන් පිදුම් ලැබූ එකම පාසල ජාත්‍යන්තර පාසල මේක.

"ජාත්‍යන්තර පාසල්වල විනය ගැටලු තියෙනවා කියලා සමහරු කියනවනේ. ඒක වෙන්නේ මෙහෙමයි. සල්ලි දීලා එන ඉස්කෝලයක් නිසා දරුවන්ට ඒ අයට ඕන විදියට ඉන්න දෙන්න ඕනේ කියලා දරුවන්ගේ දෙමව්පියෝ හිතනවා. ඉතින් අපේ පාසලට දරුවෝ ඇතුළත් කරද්දි අපි මුලින්ම කතා කරන්නේ දරුවන්ගේ අනාගතේ ගැන දෙමව්පියන්ට ලොකු වගකීමක් තියෙන බව ඒ අයට අපි පැහැදිලි කරනවා. මූලික අඩිතාලම විදියට ඒ වැඩේ කරන නිසා මගේ පාසල්වල දරුවන්ගේ විනය ගැටලු නැහැ."

ඔය කාරණා එක්ක අද වෙනකොට ෆෝකස් ජාත්‍යන්තර පාසලේ දරුවෝ 1000කට වඩා ඉගෙනගන්නවා කියලා ඇය කිව්වේ බොහොම සතුටෙන්.

"පටන්ගත්තු තැන ඉඳලා බැලුවහම අපි ලොකු දුරක් ඇවිල්ලා තයෙනවා. මේ තරම් සාර්ථක වෙන්න පුළුවන් වෙයි කියලා මම හීනෙකින්වත් හිතුවේ නැහැ. අභියෝග එද්දි නවතින්න හිතුණු තැනුත් නැතුවම නෙමෙයි. ඒත් එහෙම නැවතුණා නම් මම අද මෙතැන නැහැනේ. මගේ මහන්සිය, කැපවීම වගේම මගේ අම්මා මංජුලා බැමිණිවත්තගේ මහන්සියත් මේ පිටිපස්සේ තියෙනවා. ඇය අත්දැකීම් බහුල ගුරුවරියක්. අනිත් ජාත්‍යන්තර පාසල්වල තියෙන අඩුපාඩු ඇය දන්නවා. අපි ඉස්සරහට යන්නේ ඒවා හදාගෙන."

මේ කතා කරන දේවින්දිගේ වයස 29යි. ලංකාවේ ලාබාලතම ජාත්‍යන්තර පාසල් හිමිකාරිය වගේම නිර්මාතෘවරිය ඇය වීම ගැන ඇයට තියෙන්නේ නිහතමානී ආඩම්බරයක්ලු.

"මගේ තාත්තාවත් මේ වෙලාවේ ආදරෙන් මතක් කරනවා. මම දැන් විවාහකයි. සැමියගේ නම අමල්ක සෙනෙවිරත්න. ඔහු මධ්‍යම පළාතේ සමූපකාර මැණික් කැණීම් දෙපාර්තමේන්තුවේ සභාපති විදියට කටයුතු කරනවා. ඔහුට මාතලේ ප්‍රදේශයේ සිනමාශාලා එහෙමත් තියෙනවා. ඇත්තම කිව්වොත් මට සැමියව මුණගැහුනේ පාසල නිසා. පාසලේ දරුවන්ට චිත්‍රපටයක් පෙන්වන්න විස්තර ගන්න කියපු වෙලාවක තමයි මම ඔහුව අඳුනගත්තේ. හැබැයි පහුකාලයක් වෙනකල් ඔහු සිනමාශාලාවේ අයිතිකාරයා කියලා මම දැනගෙන හිටියේ නැහැ. පස්සේ අපි විවාහ වුණා. මගේ හැම කටයුත්තකටම ඔහුගෙන් ලොකු සහයක් ලැබෙනවා. ඉතින් ඔහුත් මට ලොකු හයියක්."

දේවින්දි සැමියගේ සහාය ගැන මතක් කළේ බොහොම ආදරෙන්. 'ධරණී' කියවන දිරිය කාන්තාවන් වෙනුවෙන් දෙන්න තියෙන පණිවිඩය මොකක්ද කියන එකයි අවසාන වශයෙන් අපි ඇගෙන් ඇහුවේ.

**"දැනුම, කුසලතා, ආකල්ප කියන තුන හරියට හදාගත්තොත් මනුස්සයෙක්ට සාර්ථක වෙන්න ලේසියි. තාක්ෂණේ දියුණුව නිසා අද කාලේ දැනුම, කුසලතා වර්ධනය කරගන්න පහසුයි. හැබැයි ආකල්ප කියන එක නම් අපි හිතලම දියුණු කරගන්න ඕනේ. අනිත් මිනිස්සුන්ට උදව් කරන්න ඕනේ. සුහදශීලී වෙන්නත් ඕනේ. ඔය දේවල් සමබර කරගන්න පුළුවන් නම් ඕනම කෙනෙක්ට සාර්ථක ගමනක් යන්න පුළුවන් කියන එකයි මම කියන්නේ."**

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**

## හොරිවිල වෙදමහත්තයාගෙන් බෙහෙතක්

3 කොටස



**ශාන්ත සෙනෙවිරත්න වෙදමහතා**
හොරිවිල වෙද මැදුර

# රූප සොබාව වැඩිදියුණු කරන අත්බෙහෙත්

**මනුස්ස පරාණවලට වැළඳෙනවාය කියන අට අනූවක් රෝග නිට්ටාවටම සුව කරන්ට පුළුවන් ජගතෙක් ඉන්නවනම් ඉතින් ඒ සිංහල වෙදමහත්තයෙක්ම තමයි. නම් දරාපු ලොකු දොස්තර මහත්තැන්ලා ගාවට හිහිල්ලත් සමහර ලෙඩ සුව කරගන්න බැරිවෙද්දී එකනේ සමහරු කියන්නේ 'නරකද සිංහල බෙහෙත් ටිකක් බීලා බැලුවොත්' කියලා. හොරිවිල වෙද පරපුර කියන්නේ අපේ රටේ ගොඩ වෙදකමට නම් දරාපු එහෙව් වෙද පරපුරක්. මේ පරපුරේ තිස්වැනි පරම්පරාව තමයි අද වෙද්දී වෙදකමේ නියැලෙන්නේ. ඉතින් ඒ හොරිවිල වෙදමහත්තයාගෙන් අහලා පුංචි පුංචි ලෙඩවලට අත්බෙහෙත් ගෙදරදීම හදාගන්න විදිය තමයි අපි මේ කියන්නේ.**

### ඇගේ අලුහම් ඇවිල්ලද?

සිංහල බෙහෙත් බඩු කඩේකින් පෙරුම්කායම් කැට කීපයක් අරන් ඇවිත් ඇල්වතුරෙන් අඹරලා අලුහම් තියෙන තැන්වල ගාන එක තමයි මේකට විසඳුම. ගාලා පැය දෙකකට පස්සේ නාගත්තා නම් හරි. එකදිගට සතියක් දෙකක් එහෙම කළොත් අලුහම් තිබුණු තැනක්වත් හොයාගන්න බැරිවෙයි. ඒ නැත්නම් එකදිගට සතියක් විතර පේර කොළ කොටලා යුෂ අරන් අලුහම්වල ගාලා පැයකින් වගේ නාන්න.

### මාළුවන්ගේ වගේ කොරල

ආසාව පැහැපත් සමක් වෙනකොට මාළුන්ගේ වගේ සමේ කොරල ආවොත් කොහොමට තියේවිද? ඒකට කරන්න තියෙන්නේ පොඩි දෙයයි. සුදු හඳුන් කෑල්ලක් අරන් ඒක පිරිසිදු ඇල්වතුරෙන් ගලගාගන්න. ඊටපස්සේ ඒකට මී කිරියි කපුරු කුඩුයි සමානව පොඩ්ඩක් දාලා කලවම් කරන්න. ඒ කරලා සතියක් විතර උදේට හවසට කොරල තියෙන තැන්වල ගාන්න. ආයෙත් කොරල එන එකක් නෑ.

### කොච්චර කළත් හිස්හොරි පිරිලා

හිස්හොරිවලට නියම විසඳුම් කියලා දහසකුත් දේවල් වෙළඳපොළේ තියෙනවනේ. ඒත් කුඹුක් කොළ කොටාලා යුෂ මිරිකලා නාන්න පැය බාගෙකට කලින් ඔලුවේ ගෑවා නම් සතියෙන් හිස්හොරි හොයාගන්නවත් නැතිවෙයි.

### ඔබ මෑදු වුණත් සම රළුයිද?

කාන්තා උදවිය රළු සමකට කැමති නෑනේ. ඒත් දැනටමත් සම රළුයි නම් කරන්න තියෙන්නේ පොල් ටිකක් ගාලා අරන් වතුර පාවිච්චි නොකර මිරිකලා ඇඟ පුරාම ගාන එක. එහෙම ගාලා පැය බාගෙකින් වගේ සබන් නොගා හෝදලා ඇරියා නම් වැඩේ හරි. හැබැයි මේක එකදිගට සතියක් දෙකක්වත් කරන්න ඕනේ. නැත්නම් වැඩක් නෑ.

### සුවඳට කතා කරලා බලමු

සමහරු කතා කරද්දි ටිකක් අමුතු දුර්ගන්ධයක් එනවා දැනිලා ඇතිනේ. ඒකට මොන දත් බෙහෙතෙන් දත් මැද්දත් වැඩක් වෙන්නේ නෑ. හොඳම බෙහෙත තමයි මූණමල් පොතු, තැඹිලි මුල්, පුවක් මුල්, කුඹුක් පොතු තම්බලා අරන් ඒකට සීනක්කාරම් කුඩු (සිංහල බෙහෙත් බඩු කඩවලින් මිලදී ගන්න පුළුවන්) ටිකක් දාලා උදේට හවසට කට හෝදන එක. එකදිගට මාස දෙකක් ඒක කළොත් ආයෙත් මුඛ දුර්ගන්ධයක් එන එකක් නෑ.

### කටහඬ මිහිරි මදිද?

ලස්සන කටහඬක අයිතිකාරියක් වෙන්න ඕන නම් කරන්න තියෙන්නේ පොඩි දෙයයි. මුලින්ම වියළි ඉඟුරු, වද කහ, කොට්ටම්, අරලු, වැල්මී, තිප්පිලි අසමෝදගම් ඇට, සහිඳ ලුණු සමානව අරන් කුඩු කරගන්න. ඒකට පිරිසිදු මී පැණි ටිකක් එකතු කරලා හොඳට අනාගන්න. එහෙම කරලා පොඩි කාලයක් උදේ හවස ටික ටික කාලා බලන්නකෝ.

### පියයුරුවල පමණ වැඩිකරගන්න

පියයුරුවල ප්‍රමාණය ගැනත් වද වෙන උදවිය ඉන්නවනේ. ඉතින් පියයුරු වර්ධනය කරගන්න කැමති නම් මුලින්ම කරන්න තියෙන්නේ කරපිංචා කොළ යුෂවලට තල තෙල් ටිකක් දාලා මදගින්නේ කකාරවා ගන්න එක. එහෙම කරලා අරන් රාත්‍රියට ඒක පියයුරුවල ගාලා ඉදිරියට පිරිමැද්දා නම් හරි. උපරිම මාස දෙකක් කළා නම් වෙනස පැහැදිලි වෙයි.

### දඩිය දුගඳට විසඳුමක්

දාඩිය ගඳත් ප්‍රශ්නයක් වෙන වෙලාවල් නැතුව නෙවෙයිනේ. සුදුහඳුන්, සැවැන්දරා මුල්, ලොත්සුඹුල් (සිංහල බෙහෙත් බඩු කඩවලින් මිලදී ගන්න පුළුවන්), අරළු, අඹ පොතු කොටලා අරන් ඇල්වතුරෙන් අඹරලා තලපයක් හදාගන්න. ඒ තලපය උදේ දහයට එකොළහට විතර ඉකිලිවල කිහිලිවල ආලේප කරන්න. නැත්නම් කොහොඹ පොතු, දෙලුම් පොතු වගේම රුක්අත්තන පොතු, අරළු, ලොත්සුඹුල් සමානව අරන් ඇල්වතුරෙන් අඹරලා ඇඟේ ගල්වන්න. පස්සේ පැයකින් වගේ නාන්න. ඔය කොහොම කළත් මාසෙකින් විසඳුමක් ලැබෙයි.

■ **රුවන් එස්.සෙනවිරත්න**

# වෙන්න හොඳ නැති වුණොත් කරන්න දේකුත් නැති එකා යකා



ඉන්දිකා ප්‍රනාන්දු
මනෝඋපදේශිකා
සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරී

"සමහරු 'තනි ළමයා' කියලා මගේ දිහාවට දඹර ඇඟිල්ල දික් කරනවා. තනි ළමයා කියන වචනේ පොඩි කාලේ ඉඳලා මට ඇල්ලුවෙම නැහැ. හැම වෙලාවකම මට දැනුණේ මගේ මොකක් හරි අඩුවක් තියෙනවා වගෙයි. හරියට මම සම්පූර්ණ මනුස්සයෙක් නෙමෙයි වගේ."

හරුකි මුරකමි කියන ජපන් ජාතික ලේඛකයා ලියාපු සවුත් ඔෆ් බෝඩර් (South of border) කියන පොතෙන් උපුටාගත්තු කොටසක් මේක. මේ කතාව කියන්නේ පවුලක ඉන්න එකම දරුවා. බැලූ බැල්මට වාසනාවක් වගේ පෙනුණට පවුලක එකම දරුවා වෙන එක ලේසි වැඩක් නෙමෙයි. පවුලක එකම දරුවා යහපත් ආකල්ප ඇති දරුවෙක් කරන එකත් ලේසි නැහැ. හැබැයි ඒ වගකීම සම්පූර්ණයෙන් පැවරෙන්නේ දරුවගේ දෙමාපියන්ට. ඒක තේරුම්ගන්නේ නැතිව පස්සේ 'එකා යකා' කියලා දරුවන්ට ඇඟිලි දික් කරලා වැඩක් නැහැ. මේ යන ආර්ථිකේ එක්ක ඉස්සරහට ගොඩක් උදව්ය එක දරුවෙක්ට වඩා හදන පාටක් පේන්නේ නැහැ. ඉතින් මේ මාතෘකාව කතා කරන එක වැදගත් කියලා හිතුවේ ඒකයි.

බහුතරයක් දෙමාපියෝ හදන්නන් වාලේ දරුවෝ හැදුවට දරුවෙක් හදනවා කියන එක සරල වැඩක් නෙමෙයි. දරුවෙක් හදන්න ගමක් ඕනේ කියලා කතාවටත් කියන්නේ ඒකයි. තනි දරුවෙක් ඉන්න පවුලක් නම් මේ කාරණාව තවත් සංකීර්ණයි. එහෙම තැනකදී ආදරය, කරුණාව, සැලකිලි සේරම ලැබෙන්නේ ඒ දරුවට. ඒක දරුවෙක්ට වෙන විදියකට බලපාන්න පුළුවන්. අනික මේ දරුවන්ට සහෝදර සහෝදරියන් ඉන්න අයට වඩා හුදෙකලාවක් දැනෙන්න පුළුවන්. ඒ නිසා ඔය හැමදෙයක් ගැනම කල්පනා කරන්න වෙනවා.

මේ කියන්න යන්නේ ටිකක් ඈතින් මගේ ඥාතිවරියක් වෙන කාන්තාවක් ගැන. මේ පවුලට ඉන්නේ මේ දුව විතරයි. පුංචි කාලේ ඉඳලම ඇයව හැදුවේ හුරතලේට. මේ අම්මා අනිත් දරුවෝ අතරේ වුණත් ඇගේ දරුවව විශේෂ කළා. තව දරුවෝ ඉන්දැද්දි කෑමබීම හංගලා දුවට දෙනවා. ඒ දුවත් අනිත් දරුවෝ බලාගෙන ඉන්නවා කියලා ගාණක් නැතිව කෑම එහෙම කනවා මට මතකයි. ඔය පුරුදු එක්ක දවසින් දවස ඇය බොහොම ආත්මාර්ථකාමී සහකම්පනයක් නැති කාන්තාවක් විදියට හැදුනා. ඔය අතරේ ඇය මඟුල් යෝජනාවකින් විවාහ වුණා. විශ්වාස කරන්න ඇගේ මංගලයයට ආයුෂ තිබුණේ මාස දෙකයි. අර ආත්මාර්ථකාමී පුරුදු නිසාම ඇයට දික්කසාද වෙන්න සිද්ධ වුණා.

මම දන්න තව පුතෙක් හිටියා. ඒ දරුවත් පවුලේ එකම දරුවා. පුතාගේ අම්මයි තාත්තයි දෙන්නම රැකියා කළා. ඔහුට අවශ්‍ය හැමදේම ලැබුණත් ඒ අයගෙන් ලොකු කාලයක් දරුවට ලැබුණේ නැහැ. අවසානෙදි ඔහු ඔහුට වඩා වැඩිමහල් පුද්ගලයන් එක්ක බජනෙට වැටිලා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණා. ඔහුගේ තත්ත්වය එන්න එන්නම දරුණු වුණා. ස්ත්‍රී දූෂණයකට සිරගත වුණාමයි අම්මලගේ ඇස් ඇරුණේ. ඉතින් ඒ වෙද්දිත් කෝච්චිය ගිහිල්ලා ඉවරයි. මම දන්න තරමට ඒ පුතා තාම ඉන්නේ පුනරුත්ථාපන කඳවුරක. පවුලේ තනි දරුවෙක් ඉන්නවා නම් හිතන්න දේවල් ගොඩක් තියෙනවා කියලා මම කියන්නේ ඒකයි.

ජීන් පියාජේට් කියන්නේ ස්විස්ටර්ලන්ත මනෝ විද්‍යාඥයෙක්. ඔහු දරුවන්ගේ සංවර්ධන අවධි 4ක් හඳුන්වලා දුන්නා.

1. ඉන්ද්‍රජාල අවධිය - ඉපදිලා අවුරුදු දෙකක් වෙනකල් කාලය
2. පූර්ව ක්‍රියාකාරී චින්ත අවධිය - 2-7 දක්වා වයස. දරුවෝ අනිත් අයව අනුකරණය කරන්න පටන්ගන්නේ මේ කාලෙදි
3. සංයුක්ත ක්‍රියාකාරී අවධිය - අවුරුදු 8-11 කාලය. මේ කාලෙදි තයි දරුවා තර්කානුකූලව හිතන්න ගන්නේ
4. විධිමත් ක්‍රියාකාරී චින්ත අවධිය - 11-16 හරියට ශරීරය, මනස වර්ධනය වෙන්නේ මේ කාලෙදි. වෙනස් විදියට හිතන්න ගන්නවා. තනියම දේවල් උපකල්පනය කරනවා

දරුවෙක් හදද්දි මේ අවධි හතර ගැනම අවධානය යොමු කරන්න ඕනේ. හැබැයි දරුවෙක්ගේ ආකල්ප ගැන ලොකුවටම හිතන්න ගන්න ඕනේ පූර්ව ක්‍රියාකාරී චින්ත අවධියේ ඉඳලා. දරුවෝ දකින දකින දේ ඉල්ලන්න පටන්ගන්නෙත් මේ වයසේදි. පවුලේ ඉන්නේ එක දරුවයි නම් දෙමාපියෝ ඒ දරුවට ඉල්ලන පරක්කුවට දේවල් අරන් දෙනවා. දෙයක් ඉල්ලලා ඒක නුදුන්නා කියන්නකෝ. එතකොට දරුවෝ අඬන්න පටන්ගන්නවා. ඔන්න ඒ පාර දරුවා අඬනවට බයේ අම්මලා ඒක අරන් දෙනවා. අඬලා දෙන්නේ නැතිකොට සමහර දරුවෝ කෑගහන්න, පෙරළෙන්න, බඩු පොළොවේ ගහන්න පෙළඹෙන්නත් පුළුවන්. ඉල්ලන හැටියේ දේවල් දෙන එකෙන් දරුවන්ගේ ඉවසීම නැතිව යනවා. ඇඬුවොත් පෙරලුණොත් ඕනම දෙයක් ලේසියෙන් ගන්න පුළුවන් කියන එකත් ඔලුවට දගන්නවා. කල් යන්න යන්න ඉල්ලන දේවල් සංකීර්ණ වෙනවා. අවශ්‍ය දේවල් නොදෙන තැන අම්මලට තාත්තලට පහරදෙන තරුණ දරුවෝ දැකලා ඇති. ඒ එහෙම හදපු ළමයි. දරුවෙක් දෙයක් ඉල්ලුවහම ඒ වෙනුවෙන් බලාගෙන ඉන්න උගන්වන්න. අනවශ්‍ය දෙයක් ඉල්ලනවා නම් කෙළින්ම දෙන්න බෑ කියන්න. දෙයක් අරන් දෙනවා නම් ඒ දරුවගේ අවශ්‍යතාවය අනුව නැත්නම් අගය කිරීමක් විදියට දෙන්න. ඒ නැතත් ඒක ගන්න දෙමාපියෝ වෙන මහන්සිය කියලා දෙන්න. 'Marshmallow' කියලා යූටියුබ් චැනල් එකක් තියෙනවා. පුළුවන්නම් දරුවන්ට ඒක පෙන්වන්න. දරුවන්ට ඉවසීම පුහුණු කරන හැටි ඒකේ කියලා දෙනවා.

ඊළඟ කාරණය බෙදාහදාගැනීම. ඒකත් අර කිව්ව දෙවැනි අවධියේ ඉඳලම හුරු කරන්න ඕන දෙයක්. දරුවෝ කීපදෙනෙක් ඉන්න ගෙදරක දරුවෙක්ට අම්මා තාත්තා මොනවාහරි දෙනකොටම පුතේ මේක නංගිලා මල්ලිලා එක්ක බෙදාගෙන කන්න කියලා කියනවා. එතකොට ඒ අයගේ ඒ පුරුදු අවිඥානිකවම හැදෙනවා. හැබැයි තනි දරුවෙක්ට බෙදාගෙන කන්න කියලා කියන්න බැහැනේ. එතකොට පුතේ අම්මටයි තාත්තටයිත් දීලා කන්න කියලා දරුවට කියන්න පුළුවන්. නැත්නම් අල්ලපු ගෙදර දරුවෝ ඉන්නවා නම් ඒ අයටත් දීලා කන්න කියන්න පුළුවන්. නිතරම දරුවට බෙදා හදාගැනීම හුරු කරන්න දෙමාපියෝ බුද්ධිමත් වෙන්න ඕනේ. දරුවගේ අතින් අනිත් දරුවන්ට දේවල් බෙදා දෙන්න බලන්න. කෙනෙක්ට දෙයක් දෙන එකෙන් සතුටක් ලැබෙනබව දරුවට උගන්වන්න. එහෙම නැත්නම් මේ දරුවන්ට ආත්මාර්ථකාමී පුරුදු ඇතිවෙනවා. සමහර දරුවෝ ලොකු වුණාම ලෝබ වෙනවා.

තව දෙයක්. ඉල්ලන ඉල්ලන දේ ලැබෙනකොට ආදරේ අඩුවක් නොවෙනකොට මේ ලෝකේ සර්ව සම්පූර්ණ තැනක් කියලා දරුවා හිතන්න පටන්ගන්නවා. එහෙම ඉඳලා ඉඳලා එකපාර සමාජයට ගියහම සමාජේ තියෙන ප්‍රශ්න දැනෙන්න ගත්තහම මේ දරුවන්ට ඒවා දරාගන්න අමාරුයි. ඒ වගේම සියදිවි නසාගැනීම්වලට වුණත් වැඩිපුරම පෙළඹෙන්නේ මේ දරුවො කියන එක නොකියා බැහැ. ඒ නිසා කවදාවත් තනි දරුවන්ව මල් යහන්වල තියලා හදන්න එපා. දරුවන්ට ලෝකේ ගැන කියලා දෙන්න. නැති බැරි මිනිස්සු දුප්පත් මිනිස්සු පෙන්වන්න. ඒ අයට දෙන්න උගන්වන්න. දුක මහන්සිය කියන දේත් ටිකක් දරුවට දැනෙන්න අරින්න.

පවුලේ තනි දරුවෙක්ට අධිමානය කියන දේත් ඇතිවෙන්න පුළුවන්. මේ දරුවන්ට පුංචි කාලේ ඉඳලා හැමදේම නොඅඩුව ලැබෙද්දි මම තමයි පොර වගේ හැඟීමක් ඇතිවෙන්න පුළුවන්. එතකොට ගෙදරදි ලැබුණු ඒ තැන ඒ අය සමාජයට ගිහිල්ලා හොයන්න ගන්නවා. පවුලේ තනි දරුවා වීම නිසාම නාසීස්ම පෞරුෂ වගේ පෞරුෂ අඩුපාඩු ඇතිවෙන්නත් පුළුවන්.

මේ දරුවන්ට සන්නිවේදනය කරන්න අම්මා/තාත්තා ඇර කවුරුත් නැහැනේ. ඉතින් පුළුවන් තරම් දරුවා එක්ක කතා කරන්න. වෙලාව දෙන්න. තනි දරුවෝ ඉන්න දෙමාපියෝ මේ දරුවන් මල් වගේ පරිස්සම් කරනවා. අනිත් දරුවන්ව ආශ්‍රය කරන්න දෙන්නේ නැහැ. කිසිම වෙලාවක එහෙම කරන්න එපා. දරුවට අනිත් දරුවෝ එක්ක මුහුවෙන්න දෙන්න. අහල පහල දරුවෝ ඥාති දරුවෝ එක්ක එකතු වෙන්න දෙන්න. බනිස් ගෙඩියක් කෑවත් ඒ අය එක්ක බෙදාගෙන කන්න කියන්න.

තනි දරුවෙක් ඉන්න ගෙදරක් නම් ඒ ගෙදර හුරතල් බව්වෙක්. පූසෙක් හදන්න. ගෙවල් ඇතුළට බල්ලෝ/පූසෝ ගන්න හොඳ නැහැ කියලා අපේ රටේ උදවිය හිතනවා. හැබැයි බලන්න යුරෝප රටවල ඒ අය බිළිඳු කාලෙම දරුවන්ට සත්තු මුහු කරනවා. එතකොට ඒ දරුවෝ ඒ සත්තුන්ට කරුණාව දයාව දක්වනවා. ආදරේ කරනවා. එයාට තුවාලයක් වුණාම දරුවටත් ඒ දුක දැනෙනවා. බඩගිනි ඇති කියලා කන්න දෙනවා. එතකොට නිකන්ම දරුවන්ගේ සහයෝගය, කරුණාව දියුණු වෙනවා. වයසට යද්දි දෙමාපියන්ගේ වේදනාව වුණත් දැනෙනවා. ඒ වගේම දරුවන්ව පරිසරයට ළං කරවන්න, ගහවැලට ආදරේ කරන්න හුරු කරන්න. කවි කතා කියලා දීලා සාහිත්‍ය දැනුම වැඩි කරන්න. එතකොට තනි දරුවා කියලා දෙමාපියන්ට දුක්වෙන්න වෙන්නෙත් නැහැ. තනි කියලා දරුවන්ට දුක්වෙන්න වෙන්නෙත් නැහැ.

▪ සෙව්වන්දි හෙට්ටිආරච්චි



# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

133 කොටස

## අතින් අල්ලන් තුරුල් කරන් ඉන්න එක විකාරයක් වෙන්නේ කොහොමද?

මේනක තෙන්නකෝන් පියා දෙස බලා සිටියේ පුදුම වීය. ඒ ඔහු කියන්නක් විශ්වාස කරන්නට බැරුවය. මුලින්ම අහම්බෙන් දුටු දිනයේ මේ තරුණිය ගැන හිත ගිය බව සැබෑය. ඒත් ඒ සහෝදරයාගේ ප්‍රේමවන්තිය නම් දැන් ඔහුගේ හිතට එය සතුටකි. ඒත් අප්පච්චි ඊට ඉඩ නොදෙන්නේ ඇයි දැයි තවමත් ඔහුට පැහැදිලි නැත.

**"මේක අම්මා දන්නවද..?"**

මේනක නොදන්නවා සේ ඇසුවේ ඊට ලැබෙන උත්තරයත් අනුමාන කරමිනි.

තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා ගැස්සුණා සේ හිස එසෙව්වේය.

**"පිස්සුද... කටේ කෙළ බිඳක් හලනවා නෙවේ... දන්නවනේ දැනගත්තොත්. එයාට අපි දෙන්නටම වඩා වටින්නෙ පොඩි පුතා. ටක්ගාලා මල්ලිගෙ කනේ තියයි..."**

තෙන්නකෝන් බණ්ඩාර මේනකගේ හිතේ සෙනෙහෙලතා ගැනත් ඒ අපැහැදීම ඇතිකළේ හිතාමතාය.

**"ඉතින් අප්පච්චි මල්ලි මේ ගෑනු ළමයට ආදරේ නම් කසාද බැඳගත්තම මොකෝ වෙන්නේ? අනික මේ රෝසමලක් වගේ කෙල්ලෙක් බය කරන්නේ මොකටද..? එයා මල්ලිගෙ තේරීම වෙන්න ඇතිනේ..."**

මේනක ඇසුවේ ඇත්තටම ඒ මොහොතේ හිත පෙලූ සිතුවිල්ලයි. තෙන්නකෝන් බණ්ඩාර ඔහු විනිවිද යන බැල්මක් හෙලුවේය. සැර සුළං පාරකට කැරකී ආ අඹ කොළයක් හරියටම වැටුණේ ඔවුන් දෙදෙනා ඉඳ සිටි බංකුව අතරටය. මේනක තෙන්නකෝන් අඹ කොළය අතට ගෙන හැඩයක් නැතුව ඉරුවේය.

**"ඔයාට තේරෙන්නෙ නෑ, පොඩිපුතා ඔය කෙල්ල හින්ද තමයි අපි කියන යෝජනාවක් අහන්නවත් කැමති නැත්තේ. අනික ලස්සන තිබ්බට මොන මුඩුක්කුවක හිඟන කෙල්ලක්ද කියලා කවුද දන්නේ..."**

තෙන්නකෝන් බණ්ඩාරගේ කතාව ඇතුළේ ඇති අදහස එවර මේනකට තේරුණේය.

**"හරි ඉතින් අපි කෙල්ලව බය කරන්නෙ කොහොමද අප්පච්චී? ඊටත් මොනවා කියලද..? අනික එයාව තනියම අල්ලගන්නෙ කොහොමද..?"**

මේනක තෙන්නකෝන්ට සූක්ෂ්ම දෙයක් ඔලුවට නාවෙන් ඔහු තෙන්නකෝන් බණ්ඩාරගෙන් ඒ ප්‍රශ්න වැලටම උත්තර බලාපොරොත්තු වුණේය.

තෙන්නකෝන් බණ්ඩාර තව ටිකක් මේනකට ළංවුණේය.

**"ඔය කෙල්ලට අපේ පවුලේ තොරතුරු කිසි දෙයක් පොඩි පුතා කියලා නෑ. අන්න ඒකෙන් ප්‍රයෝජන අරන් කෙල්ල බය කරන්න පුළුවන්. හැබැයි පුතෝ වැඩේ අනාගන්න එහෙම බෑ. එහෙම වුණොත් උඹ ඉවරයි. උඹ ඉවරයි කියන්නෙ මීඩියා මාවත් මරනවා..."**

ඒ කතාවට නම් මේනකගේ හිත බය වුණේය. ඔය වැඩේ කොතැනින් හෝ ගැස්සී ගොස් පසුගිය කාලේ වුණා සේ පත්තර පිටු අස්සෙයි රූපවාහිනී රේඩියෝවලයි ප්‍රවෘත්ති පළවෙන්නට ගත්තොත් වන්නේ වස ලැජ්ජාවකි. ඒ නිසා මේ වැඩේ වෙන කාට හෝ බාර දෙමුයි කියන්නට හිත කීවත් ඒ හිතම එය එසේ කරන්නට එපා යැයි කීවේය. මෙයට තමන් එක් වූවොත් මොකක් හෝ විසඳුමක් ඒ වෙනුවෙන් කළහැකිවනු ඇත. වෙනකෙනෙකුට දුනහොත් සැබෑවටම තෙන්නකෝන් බණ්ඩාරගේ අදහස පලදරනු ඇත. ඒත් ඔහුගේ මේ වෙනුවෙන් හිතේ ඇති සැලැස්ම දැනගන්නට මේනකට උවමනා විය.

**"මොකක් කරන්නත් ඔය කෙල්ල ඉන්නෙ කොහෙද කියලා හොයාගන්න එපැයි අප්පච්චි..."**

**"මහ දුරක වෙන්න බෑ. නිතර හම්බවෙන්න නම් එක්කෝ පොඩි පුතාගේ සාප්පුව ළඟම හරි ඉන්න ගෙදර ළඟම හරි වෙන්න ඕනි. මං ඒ ටික සතියක් ඇතුළත හොයවලා කෙල්ල ගේට්ටුවෙන් එළියටත් අරන් වාහනේකටත් නග්ගලා දෙන්නම්. හැබැයි ඔයා පේස් ටු පේස් නම් මේකට මූ වෙන්න එපා. මුණුවර අඳුනාගත්තොත් ලෙඩක්... ඔයා මේක කරන දෙන්නගෙ පිටිපස්සෙන් ඉන්නකෝ. ඒ ඇති."**

මේනක තෙන්නකෝන් හිස වැනුවේ වැඩි හැඟීමකින් නොවේ. එක අතකට තේනුක මේ කෙල්ල කසාද බඳින්නේ නම් චතුමිණී හෝ වාසුලා ලේසියෙන්ම තමන්ට දිනාගන්න පුළුවන් වෙතැයි ඔහුගේ හිත ඇතුළෙන් ආයෙත් කීවේය.

සෙනුකා තේනුකගේ නිවසින් පිටවන්නට එළියට බැස්සේ ආවට වඩා පිරුණු සිතින් යුතුවය. සමුගන්නා මොහොතේ අංජනා ඇල්ලේපොල කම්මුලේ තැවරූ හාදුවෙන් දැනුණු සිනිඳු බවම ඈ ළඟ වූ සෙනේවන්තකම සෙනෙකාට දැනුණි. ඊටද අංජනා හොඳ මව්පිය යුවලක් ළඟ හැදුණ තරුණියක බවටත් ඇය තේරුම්ගත්තාය.

**"මං ඉක්මනට ඔයාලව එහාට ගන්නම්..."**

අංජනා ඇයට පොරොන්දු වූයේ තේනුක තෙන්නකෝන් අංජනාට කෙතරම් ආදරේ දැයි දැනුණු නිසාම නොව, ලංකාව සහ ගෙදර අය එපා වූවොත් තමන් උදව් නොකළද සොහොයුරා ඇයත් සමඟ පිටරටක ජීවත්වන්නට යන බව ඇයට දැනුණ නිසාය.

**"ඔයාගේ අක්කා හරිම හොඳයි. මට දැනුණෙ මගේම අක්කා කෙනෙක් වගෙයි."**

සෙනුකා රැගත් වාහනය නොපෙනී ගිය පසු ගේට්ටුව වසා පඩිපෙළ නගිද්දි අංජනා කීවේ ඇත්තටම හිතට දැනුණු සිතුවිල්ලයි. තේනුක තෙන්නකෝන් ඇගේ ඉන වටා අත පටලා ඇයව ළං කරගත්තේය.

**"අර වටේ ගෙවල්වල මිනිස්සු ඇති."**

අංජනා කීවේ වටපිට බලමිනි.

**"ඉතින් ගෙවල්වල මිනිස්සු ඉන්න එපැයි..."**

**"ඒ ගොල්ලන්ට පෙනෙයි. අපිට බනියි විකාර කරනවා කියලා."**

**"මං මේ ඔයාව තුරුල් කරන් ඉන්න එකද..? ගම්වල වගේ මේවා එහෙම දකින්නෙ නෑ නෝනා. ඊටත් අතින් අල්ලන් තුරුල් කරන් ඉන්න එක විකාරයක් වෙන්නේ කොහොමද?"**

තේනුක සිනාසුණේ ඇගේ මුහුණේ මුහුණ ගාවමිනි. අංජනා ඇල්ලේපොල පඩිපෙළේ ඉහළට අඩි නොතබා එහිම නැවතුණාය.

**"ඒක නම් ඇත්ත. ගමෙන් කොළඹ ආවට පස්සේ ගමට වඩා නගරෙ කොච්චර වෙනස්ද කියලා මටත් දැනුණා. අපේ අම්මා අප්පච්චි කොච්චර ආදරේ වුණත් අපිට පේන්න මූණවත් ඉඹලා නෑනේ. ඉස්සර අපි හොස්ටල් එකේ ඉඳන් බලන් ඉන්නවා ඒ ළඟ ගෙදරක වයසක ජෝඩුවක් දිහා..."**

අංජනාගේ කතාව අහන්නට ඔහු පඩිපෙළේ වූ කෙටි බිත්තියට හේත්තු වුණේය.

**"ඒ අංකල් ලිඳෙන් වතුර ඇදලා ඇන්ටිව නාවනවා. ගෙදර ඉස්තෝප්පුවට වෙලා ඇන්ටිට කෑම කවනවා. එයාගේ රෙදි ඔක්කෝම හෝදලා වනන්නෙත් ඒ අංකල්මයි. හැබැයි ඇන්ටි අසනීපෙකද ඉන්නෙ කියලානම් අපිට තාම හොයාගන්න බැරිවුණා..."**

අංජනා ඒ කතාව කියද්දී තේනුකගෙ හිතටත් ඒ වයසක ජෝඩුව එබුණේය.

**"වයසට යද්දි තමයි මිනිස්සු වැඩිපුර තනිවෙන්නේ. එතකොට තමා ඒ ගොල්ලන්ට වැඩිපුර ආදරේ ඕනැවෙන්නෙත්... එහෙම හිතෙද්දි නම් මට අපේ අම්මා පව් කියලා හිතෙනවා..."**

තේනුකට ඇත්තටම වැරදි දෙයක් කියැවුණු බව හැඟුණේ එය කියැවී අවසාන වූවාටත් පසුවය. ඒ නිසා ඊළඟට ඇය අහන ප්‍රශ්නෙට උත්තරයක් ලෑස්ති කරගන්නවා මිස කියැවුණු දෙය ගිලින්නට බැරිය.


**"ඇයි ඒ... ඕගොල්ලන්ගෙ අම්මා පව් වෙන්නේ..?"**

"එයත් ඉතින් දැන් වයසයි. දරුවො කවුරුත් ළඟ නෑ. අප්පච්චි වැඩ ඉවරයක් නෑ. එයාගෙ වැඩේ උයනවා කනවා තමා."

ඒ ප්‍රශ්නය එතැනින්ම ඉවර කරන්නට ඔහු සිතුවේය.

**"ඉතින් අපි මෙහෙම කරමු. අපි බැන්දම ඒ අම්මත් අපේ ළඟ තියාගමු. මට එතකොට අම්මලා දෙන්නයි..."**

ඔහුගේ අතින් අල්ලාගෙනම තව පඩියක් ඉහළට අඩි තබමින් අංජනා කීවාය.



**"අදහස හොඳයි. ඒත් අම්මියි අප්පච්චියි දෙන්නම දැන් වයසයි. කසාද බැන්ද මුල් කාලේ වගේම මේ හුදකලා වයස් කාලෙත් ඒ ගොල්ලො කැමති දෙන්නා එක්ක තනියම ජීවත්වෙන්න."**

තේනුක කීවේ ඇත්තය. තම අම්මා අප්පච්චී පමණක් නොව පිටරටවලද අවුරුදු දහඅට විස්ස වෙද්දී දරුවන්ගෙන් ඒ මව්පියවරු ඈත්වෙති. ඔවුන් ඒ හුදකලා ජීවිතේ හොඳින් විඳිති.

නිවසේ උඩටම නැග විත් සඳැල්ලෙන් ඉඳගත් තේනුකට මොහොතකට පෙර බත් කෑවෙන් තේ කෝප්පයක් බීමේ ආසාවක් ඇතිවිය. එය කියන්නට අංජනා දෙසට හැරෙද්දී ඔහුගේ දුරකතනය හැඬවුණේය. කොට කලිසම් සක්කුවේ වූ දුරකතනය අතට ගෙන තිරය බැලූ ඔහුගේ මුහුණ වෙනස් වුණේය. ඇමතුම මේනක තෙන්නකෝන් බණ්ඩාරගෙනි. එය නොගෙන දුරකතනය සාක්කුවේ දමාගෙන හැරෙන්නට සිතුණත් ඒ හිතම ඇමතුම මග හැරෙන්නට නොදුන්නේය. ඒ නිසා අංජනා ළඟ සිටියදීම ඔහු ඇමතුම ගත්තේය. ඔහු ඇමතුමට කතා කරනතුරු අංජනා ගෙතුළට ගියේ ඇයට දෙයක් මතක් වීය. ඒ මෙහි ඉඳගත්තොත් ඔහුට තේ එකක් උවමනාය.

**"මල්ලි මේ වෙලේ කොහෙද ඉන්නේ?"**

මේනකගේ කටහඬේ කලබලයක් නම් නැත.

**"ඇයි?"**

**"ඉතාම වැදගත් දේකට මට හම්බුවෙන්න ඕනි ඉක්මනටම."**

එවරනම් ඔහුගේ වචනවල කලබලබවක් විය.

ලබන සතියට

# හිත කොනිත්තන කවි

## මතක අමතක නොවෙන මහනුවර



රොබරෝසි මල් පිපුණු
මහනුවර වැව රවුම
නවම් මාසයේ මෙන්
සොඳුරු බව නැති වුවද
ඇවිද යන්නට හිතෙයි
සැඳෑවක හිරු නිවුණ
තනි මකන්නට හිතේ,
ඔබත් එනවද යන්න...

නීල දෙනුවන් විලේ
තාරකා විසිරිලා
ඉගිමරණ ප්‍රේමයට
අනුරාග නෙත් සලා
අතින්වත් නොඅල්ලා
ඔබේ වුවන දෙස බලා
ළඟට වී හුන් අයුරු
මතක් වෙයි හිත් නිවා

උඩවත්ත කැලෑවේ
වනස්පති සැලි සැලී
මවා දුන් පවන් රොද
වැව් දියේ තෙමී තෙමී
අරන් ආ සිසිලසින්
ගිම්හාන ගිනි නිවී
කියුඹුවැල් ඔබේ වත්සුණු
රැඳුණු මත සිඹී

සුදුපාට වලාකුළු
බැම්ම අද්දරින් හිඳ
වැව් දියේ ගී කියන
රැළි සරැලි බලම් අද
එද ළඟ සිටි ලෙසින්
සිටිනවා නම් ඔයා
වැව රවුම සරසන්න
රොබරෝසියා එපා

තරන

---


**ජීවිතේම ගොඩගැසූ හීන එක් මොහොතකින් සුනුවිසුනු වුනාද?**
**ජීවිතේ වගේ ආදරය කල සැමියා/බිරිඳ, පෙම්වතා/පෙම්වතිය හැර ගියාද?**

ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද? ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?

- සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
- සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
- 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
- රැකියා ලබා ගැනීමට
- හැර ගිය අය ගෙන්වීම

උපන් දිනය / උපන් වේලාව සමග අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්

පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,



**පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ**
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)

පුරාණ විහාර වේරතැන්න, වේරපිටිය

**අමතන්න : 071-0 314 878**

මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී



**මීගමුව**
අලුතින් ආරම්භ කිරීමට නියමිත A/C සැලූනයකට බියුටි, හෙයාර් Brush ශිල්පිනියන්, බ්‍රයිඩ්ල් වැඩට දක්ෂ NVQ Level 4 සුදුසුකම් සහිත ශිල්පිනියන් අවශ්‍යයි.
**0777 817 172**
udaraws@yahoo.com



**රු. 35000/- කට වැඩි ආදායමක්**
විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.

- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955



**නිවසේදීම රැකියාවක්**
දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සිට විලාසිතා ආභරණ ( සාමාන්‍ය කරාබු, ටසල් කරාබු, සාරි පින්, සාරි හවඩි, මුදු, අගස්තිමාල ) සාදා දී මසකට රු. 50000 කට වඩා උපයන්න.
අලෙවි උපදෙස් හා පුහුණු අමුද්‍රව්‍ය නිවසටම. මිලදී ගන්නා නිෂ්පාදන සඳහා එවලේම මුදල්. විස්තර සඳහා වට්ස්ඇප් (WhatsApp) අංකය, නම, ලිපිනය SMS කරන්න.
**0711 44 90 66**
**ලා-පොපෙට්**
අනුරාධපුර
(ප්‍රධාන තැපැල් කාර්යාලය ඉදිරිපිට, LB ෆිනෑන්ස් හරස් පාර)
හමුවීම : සතියේ දින 5 සහ සෙන. පෙ.ව. 10 සිට 4 දක්වා





**ඔබ දෛවයට පිටුපායිද.. ?**
**දෛවය ඔබට පිටුපායිද.. ?**

- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
**එස්. කෝරළේගේ**
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
**සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි**
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094



**වාණිජ බැංකු ඇබෑර්තු**
★ දිස්ත්‍රික්ක කිහිපයක බැංකු ක්ෂේත්‍රයේ පුරප්පාඩු සඳහා ආධුනිකයින් සුදුසුකම් මත බඳවා ගැනේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
**40,000/-**
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0702 725 731 | 0718 853 997
0742 916 140 | 0774 024 155



**උකස් රත්තරං**
උකසට තබා සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
රන්පවුම
**195,000**
**0762 585 999**



**විද්‍යාව ගණිතය 6 - 11 ශ්‍රේණි සඳහා**
**තනි හෝ කුඩා කණ්ඩායම් පන්ති**
සාධාරණ අයකිරීම් යටතේ මෙහෙයවීම
පළපුරුදු විද්‍යා උපාධිධාරී ගුරුවරයකු විසින්
Bsc. University of Colombo
සිංහල මාධ්‍ය ඉංග්‍රීසි මාධ්‍ය පන්ති සඳහා
කොළඹ, ගම්පහ, මහරගම, කොට්ටාව, නුගේගොඩ, කළුතර, කඩුවෙල, අවට්න් විමසන්න.
නිබන්ධන හා ප්‍රශ්නපත්‍ර ලබාදෙයි
පංති පැවැත්වීමට ශාලා පහසුකම් ඇත්නම් විමසන්න
**විමසීම් : 0705 321 553**



**නියෝ හෙයාර් ඇන්ඩ් බියුටි**
අළුත්ගම ශාඛාව සඳහා
ඉතා පළපුරුදු සේවිකාවන් අවශ්‍යයි.
විදේශීය සංචාරකයින්ගේ වැඩ කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමකි
ඉහළ වැටුප් හා කොමිස් නවාතැන් පහසුකම් ඇත.
**077 640 9199**



**උගස් රත්තරන්**
සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනය පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න
**පවුම - 190,000/-**
**076 367 57 68**

ඒ 2007 විස්සයි විස්ස ලෝක කුසලාන තරඟමාලාවේ 08 වැනි තරඟයයි. ශ්‍රී ලංකාවත් කෙන්යාවත් තරඟයට සූදානමිනි. මුලින් පන්දුවට පහරදුන් ශ්‍රී ලංකාව ඒ වනවිටත් පන්දුවාර 17ක් අවසානයේ කඩුලු 5කට ලකුණු 215ක් ලබාගෙන තිබුණි. හයවැනි කඩුල්ල ලෙස ටී.එම්.ඩිල්ෂාන් දැවී ගියේ ඔය අතරය. හත්වැනි පිතිකරු ලෙස පිටියට පැමිණියේ සිය මංගල විස්සයි විස්ස තරඟයට ක්‍රීඩා කළ ජෙහාන් මුබාරක් ය. නමුත් එවකට කණ්ඩායම් නායකයාව සිටි මහේල ඔහුගෙන් බලාපොරොත්තු වූයේ තවත් ලකුණු පහළොවක් විස්සක් පමණි. හේතුව ඒ වනවිටත් ශ්‍රී ලංකා ලකුණු පුවරුව ප්‍රබල තැනක තිබූ නිසාය. එහෙත් අවදානමක් නොගත් ජෙහාන් දකුණු අප්‍රිකාවේ ජොහැන්ස්බර්ග් පිටියේ නරඹන්නන් මන්මත් කළ පිතිහරඹයක් දියත් කළේය. ඔහු හයේ පහර පහක් හතරේ පහර තුනක් සමඟින් පන්දු 13කදී නොදැවී ලකුණු 46ක් ලබාගත්තේ ශ්‍රී ලංකා ලකුණු පුවරුව කඩුලු 6කට ලකුණු 260ක් දක්වා ගෙනයමිනි. එවකට එය සැළකුනේ විස්සයි විස්ස තරඟයක කණ්ඩායමක් රැස්කළ ඉහළම ලකුණු ප්‍රමාණය ලෙසයි. එපමණක් නොව විස්සයි විස්ස ලෝක කුසලාන ඉතිහාසයේ ඉනිමක් තුළ ඉහළම ප්‍රහාරාත්මක වේගයක් රඳවාගත් ශ්‍රී ලංකික පිතිකරුවා බවටත් එදා ජෙහාන් පත්විය. එදා ලකුණු 172කින් ශ්‍රී ලංකා කණ්ඩායම ජයගත් අතර එතැන් පටන් ජෙහාන්ගේ අනුකම්පා විරහිත පිතිහරඹය ගැන ලෝකයම කතා කරන්නට විය. ඉතින් මේ කතාබහ 2002 -2015 කාලය තුළ කිසිඳු පන්දු යවන්නෙක් තුට්ටුවකට මායිම් නොකළ ඒ සුපිරි වමත් පිතිකරුවාගේ ආදරණීය බිරිඳ වන සංජනා සෙල්වරාජ් සමඟිනි.




ජාතික කණ්ඩායමේ හිටපු ක්‍රිකට් කීඩක ජෙහාන් මුබාරක්

# ඒ මැච් එක බලන්න බැරිවුණා නම් ඉඳලා වැඩක් නෑ

සංජනා සෙල්වරාජ්

## කෝෆි ෂොප් එකේ හුරේ දදා ඉඳපු හැමෝම දැනගත්තා මම ජෙහාන්ගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියලා

**සංජනා කියන්නේ සුපිරි ක්‍රිකට් ක්‍රීඩක ජෙහාන් මුබාරක්ගේ බිරිඳ. හරි ආඩම්බරෙන් ඇති නේද?**

අවංකවම පුංචි ආඩම්බරයක් තියෙනවා. මොකද ජෙහාන් කියන්නේ අවුරුදු 13ක් ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරපු ක්‍රීඩකයෙක්. ක්‍රීඩා පිටියේ ඉඳපු හැම තත්පරේම එයා බැලුවේ මේ රට දිනවන්න. ඉතින් එයාගේ බිරිඳ විදියට මට ආඩම්බරයි.

**දෙන්නා මුණගැහුනේ ඉස්කෝලෙ ඩ්‍රාමා කරන්න ගිහින්ලු නේද?**

(සිනාසෙමින්) ඒක ඇත්ත. අපි දෙන්නා කොළඹ ඉස්කෝල දෙකක හිටියේ. එයා එයාගේ ඉස්කෝලේ ඩ්‍රාමා කළා. මං මගේ ඉස්කෝලේ ඉඳගෙන ඩ්‍රාමා කළා. එක වතාවක ලොකු ශෝ එකක් තිබුණා. ඒ වෙලාවේ තමයි මුලින්ම මං ජෙහාන්ව දැක්කේ. එදා තමයි අපි දෙන්නා අතරේ යාළුකමක් ඇතිවුණේ. ඒ යාළුකම තමයි අවසානයේදි ආදරයකට හැරුනේ.

**එතකොට ඔයා හිටියේ ඉස්කෝලේ කීයෙ පන්තියේ වගේද?**

මං සාමාන්‍ය පෙළ කරන්න හිටියේ. මට මතක විදියට ජෙහාන් එතකොට උසස් පෙළ පන්තිවල හිටියේ.

**ඉතින් යාළුකම ආදරේකට පෙරළුනේ කොහොමද?**

එකපාරටම නම් එහෙම වුණේ නෑ. යාළුවෝ විදියට අපි අවුරුදු දෙකක් විතර ආශ්‍රය කළා. ඒ ඉන්නකොට තේරුනා එයා අනික් අයට වඩා වෙනස් කියලා. දෙයක් කියද්දි වුණත් හොඳටම හිතලා බලලා තමා උත්තර එහෙම දුන්නේ.

**ඔයාලා විවාහවුණේ ජෙහාන් ජාතික කණ්ඩායමට තේරුනාට පස්සේ නේද?**

ඔව්. අපේ ආදර සම්බන්ධය පටන් ගත්තේ 2000 අවුරුද්දේ වගේ. අවුරුදු නවයක් එහෙම ඉඳලා 2009 විවාහ වුණා. 2002 අවුරුද්දේ තමයි ජෙහාන් මුලින්ම ජාතික ක්‍රිකට් කණ්ඩායමට තේරුනේ.

**දැන් මුබාරක් එක්ක ගෙවන ජීවිතේ කොහොමද?**

මේ අවුරුද්දට අපි විවාහවෙලා අවුරුදු 14ක් වෙනවා. හැබැයි එච්චර කාලයක් ගියා කියලා දැනෙන්නේ නෑ. මොකද අපි තාමත් බැන්ද අලුත වගේ ඉන්නවා. දැන් අපිට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ලොකු දුවට අවුරුදු 9යි. පුතාට අවුරුදු 7යි.

**සංජනාට ක්‍රිකට් ගහන්න බැරිද?**

(සිනාසෙමින්) අනේ මට නම් ක්‍රිකට් ගහන්න බෑ.

**එතකොට ඔයා මොකද කරන්නේ?**

මං පෙරපාසල් ගුරුවරියක්.

**ගොඩාක් අය ජෙහාව මුබාරක්ව හරියටම අඳුරගත්තේ 2007 විස්සයි විස්ස ලෝක කුසලානයෙදි නේද?**

ඔව් ඔව්. ඒ වෙනකොට එයා මගේ බෝයි ෆ්‍රෙන්ඩ්. එදා ලෝක කුසලානේ කෙන්යාව එක්ක තිබුණු මැච් එකේදි තමයි ජෙහාන් මුබාරක් කියන්නේ කවුද කියලා රටක්ම දැනගත්තේ. එදා එයා බෝල් 13ට ලකුණු 46ක් නොදැවී ගැහුවා.



ජෙහාන් බිරිඳ සංජානා සමඟ



ජෙහාන් බිරිඳ සහ දරුවන් සමඟ

**සංජනාට ඒ සුපිරි තරඟය බලන්න ලැබුණේ අහම්බෙන් කියන්නේ ඇත්තද?**

මං ක්‍රිකට් මැච් බලන්න පුරුදුවුණේ ජෙහාන් නිසා. ඒ නැතුව මං ඊට කලින් මැච් බැලුවේ නෑ. ඒත් මට එදා මැච් එක මගඇරුනා. ඔය අතරේ තමයි මගේ යාළුවෙක් කතා කරලා කීවේ අද මැච් එක සුපිරියි මැච් එක බලන්න කියලා. ඒ වෙලාවේ මං හිටියේ වැඩකට ගෙදරින් එළියට ඇවිත් ටවුන් එකේ. පස්සේ මං ටවුන් එකේ තිබුණු කෝෆි ශොප් එකකට ගියා. ඒ වෙලාවේ ඒකෙ මැච් එක දලා තිබුණේ. අන්තිම ඕවර් දෙක තුන තමයි තිබුණේ. වැඩේ කියන්නේ ඒ වෙලාවෙම තමයි ජෙහාන් බැට් කරන්න ඇවිත් අර විදියට ගැහුවේ.

**එදා සංජනා සෑහෙන්න සතුටුවෙන්න ඇති නේද?**

ඔව්. ඒ හැඟීම මට අදටත් කියන්න තේරෙන්නේ නෑ. පුදුම සතුටකින් මං ඒ වෙලාවේ මැච් එක බැලුවේ. එතැන මැච් එක බල බලා ගොඩාක් අය හිටියා. ඒ හැමෝම ජෙහාන්ගේ වැඩ දැකලා හුරේ දන ගමන් හිටියේ.

**එතැන හිටපු අය ඒ වෙනකොට ඔයා ජෙහාන්ගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියලා දැනගත්තේ එහෙම නැද්ද?**

(සිනාසෙමින්) මොකද නැත්තේ හැමෝම දැනගත්තා. ඒක වුණේ මෙහෙමයි. එදා ජෙහාන් හොඳට ගහගෙන එද්දී එක ලකුණකට දුවන්න ගිහින් අවුට්වෙන්න ගියා. ඒ වෙලාවේ එතැන හිටපු අය හොඳට ගහගෙන ඇවිත් රිස්ක් ගන්න යනවනේ කිය කියා ජෙහාන්ට පොඩ්ඩක් බැන්නා. එදා මං කොෆි ශොප් එකට ගියේ යාළුවෙක් එක්ක. යාළුවා ඒ වෙලාවේ විහිලුවට වගේ අන්න ඔයාගේ කොල්ලට බනිනවා වගේ මොකක් හරි කතාවක් හයියෙන් කිව්වා. ඒක හරියටම මතක නෑ. කොහොමහරි ඒක ඇහිලා හැමෝම මං දිහා බැලුවා. ඒ වෙලාවේ දැනගත්තා මං ජෙහාන්ගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කියලා.

**ඒ තරඟයෙන් පස්සේ ජෙහාන් ගැන මොකද හිතුණේ?**

කොච්චර මැච් ගැහුවත් මට නම් ඒක තමා එයාගේ හොඳම මැච් එක. ඒක එදා මගඇරුනා නම් ගොඩක් දුක හිතෙන්න තිබුණා.

**නිකන් හරි ජෙහාන් මේ විදියට ක්‍රිකට් නොගැහුවා නම් මොන වගේ දෙයක් කරයිද?**

ඒක නම් හිතාගන්න බෑ. ඒත් මට හිතෙනවා එයා හරිම දේ තෝරගත්තා කියලා.

**ක්‍රීඩකයෙක් විදියට ජෙහාන් ක්‍රිකට් පිටියෙන් සමුගත්තත් ක්‍රිකට්වලින් නම් එයා සමුගන්න පාටක් නෑ නේද?**

(සිනාසෙමින්) ක්‍රිකට් කියන්නේ එයාට ජීවිතේ කොටසක් වගේ. ඒකයි තාමත් එයා ක්‍රිකට් එක්කම ඉන්නේ. දැන් එයා අවුරුදු 19න් පහළ ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු විදියට කටයුතු කරනවා.

**හිටපු ක්‍රීඩකයෝ ගොඩාක් දැන් රට අතෑරලා ගිහින්. ජෙහාන් තාම ලංකාවේ ඉන්නේ ක්‍රිකට් නිසා කියන්නේ ඇත්තද?**

ජාතික කණ්ඩායමෙන් සමුගත්තත් ජෙහාන් ආසයි ලංකාවේ ක්‍රිකට් එක්ක තවත් කාලයක් කටයුතු කරන්න. ඒ හරහා එයා එයාගේ ක්‍රිකට් අත්දැකීම් හැමදේම පුහුණුකරුවෙක් විදියට ආයෙමත් තරුණ ක්‍රීඩකයින්ට දෙනවා. ඉතින් ඒකත් එක්ක ලංකාව අතෑරලා යන්න එයාගේ ආසාවක් නෑ.

**අවසානෙට කියන්න දෙන්නා ඉදිරිය ප්ලෑන් කරලා තියෙන්නේ කොයි විදියටද?**

මං හිතන්නේ ජෙහාන් ක්‍රිකට්වලින්ම ඉදිරියට යයි. මමත් ආසයි ගුරුවරියක් විදියට පුළුවන් කාලයක් දරුවෝ එක්ක ඉන්න. ඒ දේවල් එක්ක දරුවෝ දෙන්නට හොඳ අනාගතයක් හදලා දෙන එක තමයි අපි දෙන්නගේ බලාපොරොත්තුව.

■ රුවන් එස්.සෙනවිරත්න




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.